# The SIGNALLER

## SRI LANKA SIGNAL CORPS JOURNAL - 2021





යුද්ධ හමුදාධිපති ජෙනරාල් එල්එච්එස්සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී හා ප්‍රධාන සංඥා නිලධාරී/ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීජ්ජේ පීරිස් එන්ඩියු ජ්‍යෙෂ්ඨ නිලධාරී සුහද පිලිසඳරක



ප්‍රධාන සංඥා නිලධාරී/ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීජ්ජේ පීරිස් එන්ඩියු ජ්‍යෙෂ්ඨ නිලධාරී හා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේසී ප්‍රතාපසිංහ ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කොවිඩ් - 19 ප්‍රතිශක්තිකරණ එන්නත ලබා දීම අධීක්ෂණය කරන අවස්ථාව

# කතුවැකිය

ශ්‍රී ලංකා සංඥා බළකායට වසර 78 ක් සපිරෙන ඓතිහාසික අවස්ථාවේ වාර්ෂිකව පළකරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ ප්‍රධාන කර්තෘ වශයෙන් කටයුතු කිරීමට ලැබීම පිළිබඳව අවංකවම සතුටු වෙමි.

මීට වසර විසිතුනකට ප්‍රථම ආරම්භ කරන ලද මෙම සඟරාව තුළින් සංඥා බළකායේ වසරක් පුරා සිදුවූ කාලීන සිදුවීම් සහ විශේෂ සිදුවීම් සෑම සාමාජිකයෙකුටම දැනගැනීමට මෙන්ම ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාව විදහා දැක්වනු වස් තම දැනුම වර්ධනය කර ගැනීමටත් මනා පිටුවහලක් වන බැව් නොඅනුමානය. අප වීරෝදාර සෙබළුන්ට මෙම කලාපය තුළින් තම නිර්මාණාත්මක අදහස් එළිදැක්වීමට ඉතා හොඳ තෝතැන්නක් සැකසෙන අතර, ඒ සඳහා සියලුම මූලස්ථාන හා ඒකකයන්හී නිලධාරී/ සෙසුනිලයින් විසින් දක්වන ලද සහයෝගය ඉතා අගය කොට සලකමි.

ලෝකයේ දැනට පවතින නවීන තාක්ෂණික දියුණුවත් සමඟ ආරක්ෂක හමුදාවන් භාවිතා කරන තාක්ෂණික උපකරණ/උපක්‍රම හා විශේෂිත වූ හමුදාමය පරිගණක වැඩසටහන් පිළිබඳව විශේෂ අවධානය යොමුකර එයට මුහුණදීම සඳහා සංඥා බළකාය වශයෙන් යම් ආකාරයක කාර්යභාරයක් ඉටුකළ යුතුව ඇති බැව් ද සිහිපත් කිරීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන් මෙම සඟරාව සිත්ගන්නා සුළු අයුරින් හා හරවත්ව සකස් කර මුද්‍රණය කිරීම සඳහා දායක වූ සංඥා බළකාධිපති ඇතුළු සියලුම නිලධාරීන් සහ සෙසුනිලයන්ටත්, කාලෝචිත හා නිර්මාණශීලී අදහස් හා නිර්මාණයන්ගෙන් දායක වූ සැමටත් කෘතඥතාපූර්වකව ස්තූතිවන්ත වන අතර, මෙවර කලාපය අලංකාර අන්දමින් සංස්කරණය කර ඔබ අතට පත් කිරීමට කටයුතු කළ සංස්කාරක මණ්ඩලයටත් ප්‍රධාන කර්තෘ වශයෙන් මාගේ ප්‍රශංසාව පුද කරමි.

**එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී**
**කර්නල්**
**ප්‍රධාන සංස්කාරක**

# පටුන


| | | | |
|---|---|---|---|
| **ප්‍රධාන සංඥා නිලධාරී / සංඥා බළකාධිපතිගේ පණිවුඩය** | 1 | 4 | **මතක පොතින්** |
| **ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශ්‍රාම ගැනීම** | 56 | 59 | **විශේෂ අවස්ථාවන්** |
| **සංඥා කීර්තිජයෙන් ඔබ්බට** | 60 | 61 | **උසස්වීම් / පාඨමාලා** |
| **ක්‍රීඩා දක්ෂතාවයන්** | 63 | 67 | **මන්දාකිණිය** |
| **කැටපත් පවුර** | 72 | 78 | **උපන්දින සුබපැතුම්** |
| **මංගල සීනු** | 80 | 82 | **සංවේගයෙන් සිහිපත් කරමි** |
| **ගෞරවණීය උපහාර** | 83 | | |



රෙජිමේන්තු මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා සංඥා බළකාය,
යුද්ධ හමුදා කඳවුර,
පනාගොඩ,
හෝමාගම.

Tel : +94112855361
E-mail : rhqslsc@army.lk
Web : www.army.lk/signaller



# ප්‍රධාන සංඥා නිලධාරී / සංඥා බළකාධිපතිගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බළකායේ 13 වන බළකාධිපති වශයෙන් 'ද සිග්නලර්' සඟරාවේ 23 වන කලාපය සඳහා පණිවුඩයක් ගෙන ඒමට ලැබීම ඉමහත් ගෞරවයක් මෙන්ම අභිමානයක් ලෙස මා සලකමි. වසර 78 ක දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බළකායේ ඉදිරි ගමන වෙනුවෙන් නවතම තාක්ෂණික උපක්‍රම තුලින් අද්විතිය සන්නිවේදන මෙහෙවරක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට මෙන්ම අපගේ මාතෘ භූමියට ලබාදීම අප බළකායේ ඒකායන අරමුණයි.

ගෝලීය තොරතුරු තාක්ෂණයේ සීග්‍ර දියුණුව හමුවේ යහපත් මෙන්ම අයහපත් බලපෑම් සඳහාද අපහට මුහුණ දීමට සිදුව ඇත. එම අයහපත් බලපෑම් මගින් සයිබර් අවකාශය තුළ ඇති වන සයිබර් අපරාධ සඳහා සාර්ථකව මුහුණදීම පිණිස අප බළකාය සතුව ඇති සයිබර් ආරක්ෂක ඒකක නිලධාරීන් සහ සෙසුනිලයින් තවදුරටත් නවීන තාක්ෂණයෙන් සන්නද්ධ කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමටත් පොදුවේ සියලු නිලධාරීන් සහ සෙසු නිලයින් හට ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීම හා හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහාද නිරන්තරයෙන් පුහුණුවීම් වල යෙදවීමට ඇවැසි ක්‍රියාදාමයන් ආරම්භ කර ඇත.

එමෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථාපිත විශේෂිත බළකායක් ලෙස මෙම බළකාය ඉටුකරන සන්නිවේදන ක්‍රියාවලින් යටතේ නව ගුවන් විදුලි උපකරණ පිළිබඳව විශේෂිත වු දැනුමක් හා එම උපකරණ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල භාවිතය පිළිබඳව අප බළකායේ නිලධාරීන් හා සෙසුනිලයින් මනා අවබෝධයක් ලබාගත යුතු අතර, ඊට අදාලව පුහුණු පාඨමාලා සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් ලබා ගන්නා දැනුම වඩාත් කාලෝචිත වනු ඇත. තවද තොරතුරු තාක්ෂණය ඔස්සේ පරිගණක දැනුම තවදුරටත් අප බළකායේ නිලධාරීන්/ සෙසුනිලයින් වෙත ලබාදිය යුතු බවත්, ඒ සඳහා ඔවුන් යොමු කිරීම අණදෙන නිලධාරීන්ගේ හා ජ්‍යෙෂ්ඨ කොනොනින්ගේ වගකීමක් බවද මේ අවස්ථාවේ පෙන්වා දෙමි.

වර්තමානයේදි රට තුළ ව්‍යාප්ත වී ඇති කොවිඩ් 19 වෛරසයෙන් මහජනතාව මුදවා ගැනිම සඳහා යුද්ධ හමුදාව පෙරට පැමිණිම මුලුමහත් ජාතියේම ඇගයීමට සහ ප්‍රශංසාවට පවත්ව ඇති මොහොතක එම කටයුතු සාර්ථකව සිදුකර ගෙන යාම සඳහා අප බළකා නිලධාරීන් සහ සෙසුනිලයින්ද දක්වා ඇති සෘජු දායකත්වය සිහිපත් කරනුයේ ඉතාමත් අභිමානයෙනි. තවද එම සියලුදෙනාගේ විශිෂ්ඨ සේවයද මෙම අවස්ථාවේදි ඇගයීමට ලක් කරනුයේ ඉතාමත් සතුටිනි.

තවද මිලේච්ජ ත්‍රස්තවාදයෙන් මාතෘ භූමිය මුදවාගෙන දැනට වසර 12 ක් ගතවී ඇතත්, ඒ සඳහා තම වටිනා තාරුණ්‍ය රට ජාතිය වෙනුවෙන් පුජාකල රණවිරුවන් සහ ශරීර කොටස් කැප කල ආබාධිත තත්වයට පත්ව සිටින සංඥා බළකායේ වීරෝධාර රණවිරුවන් කල කැපකිරීමද මා ඉතා භක්ත්‍යාදරයෙන් යුතුව සිහිපත් කරන අතර, ආබාධිත රණවිරුවන්ගේ එම තත්වයෙන් යහපත් අතට පත්වේවායිද ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

'ද සිග්නලර්' සඟරාව කලෝචිත සඟරාවක් වන අතර, ඒ සඳහා සංඥා බළකා නිලධාරී/ සෙසුනිලයින්ගේ නිර්මාණශීලි දක්ෂතාවයන් ඉදිරිපත් කිරීමට තොතැන්නක් වනු ඇත. එසේම ශ්‍රී ලංකා සංඥා බළකායේ ඉදිරි ක්‍රියාකාරී අභිවෘද්ධිය උදෙසා දායක වු දැනට සේවයේ නියුතු/ විශ්‍රාමික සියළු සාමාජිකයින් හා මෙම සඟරාව ඔබ වෙත ගෙන ඒමට කැපවු සඟරාවේ සංස්කාරක මඩුල්ලට මාගේ කෘතඥතාව පල කරන අතර, සංඥා බළකා සියලුම සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල්වල සියලුදෙනාටත් දැනට ලෝකයේම වසංගතයක්ව ඇති කොවිඩ් 19 වෛරසයෙන් ආරක්ෂා වී ඉදිරි අනාගතය සෞභාග්‍යමත් වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

**පීඑජේ පීරිස් එන්ඩියු**
**මේජර් ජෙනරාල්**
**සංඥා බළකාධිපති**




2021.01.18 දින නව සංඥා බළකාධිපති වශයෙන් මේජර් ජෙනරාල් පීඑජේ පීරිස් එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී මධ්‍යස්ථාන සේනාවිධායක විසින් පිළිගත් අවස්ථාව



2021.01.18 දින නව සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීඑජේ පීරිස් එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී උදෙසා පිරිනමන ලද සම්මාන පෙළපාළිය

**රාජකීය සංඥා බළකාය සිය අභිමානවත් 100 වන සංවත්සරය (1920 - 2020) වෙනුවෙන් “Roger So Far” නමින් සංවත්සර ග්‍රන්ථයක් එළිදැක්විය. එම ග්‍රන්ථයෙහි පිටපතක් ශ්‍රී ලංකා සංඥා බළකාය වෙතද ප්‍රධානය කරන ලදී.**




ROYAL SIGNALS INSTITUTION

Headquarters Royal Signals
Griffin House
Blandford Camp, Dorset, DT11 8RH

Telephone: (Direct Dialling) 01258 482647 Mobile: 07493 660353

Military: 94371 Ext 2647 Fax: 94371 2159 E-Mail: rsi@royalsignals.org

---

*On behalf of the Master of Signals, Major General S P Nesmith, please find enclosed a copy of the new history of The Royal Corps of Signals, 'Roger So Far', to mark our Centenary Year in 2020, with her compliments,*

*With sincere regards*

*With the compliments of Lt Col (Retd) P A Osment, Director RSI*

## ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය









2021.01.22 දින 8 වන ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් මේජර් ජෙනරාල් පීඒජේ පීරිස් එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කල අවස්ථාව





ඕස්ට්‍රේලියා ආරක්ෂක කටයුතු සබැඳි නිලධාරී කපිතන් ඉයන් කේන් 2021.04.20 වන දින ප්‍රධාන සංඥා නිලධාරී හමුවීම





කොළඹ ආරක්ෂක සමුළුව සඳහා ප්‍රධාන සංඥා නිලධාරී සහභාගීවීම

# තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය



බ්‍රිගේඩියර්
කේසී ප්‍රතාපසිංහ
අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ

යුද්ධ හමුදාව තුළ ශ්‍රී ලංකා සංඥා බළකායේ ආවේනික කර්තව්‍යක් වන තොරතුරු තාක්ෂණ අවශ්‍යතා පිළිබඳව ක්‍රියා කිරීමේ අරමුණු පෙරදැරිව වර්ෂ 2010 මාර්තු මස 01 වන දින ප්‍රධාන සංඥා නිලධාරි කාර්යාලය යටතේ ආරම්භ කරන ලද තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය උදෙසා විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ මෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ජාතික අවශ්‍යතා සඳහා ද අවශ්‍යතාවය පරිදි මෘදුකාංග නිර්මාණය, වෙබ් අඩවි නිර්මාණය සහ පරිගණක ජාල විසදුම්, සැලසුම් කිරීම, නිපදවීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකරනු ලබයි. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු මධ්‍යස්ථානය, දත්ත මධ්‍යස්ථාන, ජාල මෙහෙයුම් මධ්‍යස්ථාන, වෙබ් අඩවි සංවර්ධන සහ පර්යේෂණ හා සංවර්ධන අංශයන්ගෙන් වර්තමාන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ ඒකකයන් වන 6 ශ්‍රීලංසංබ හා 11 ශ්‍රීලංසංබ ඒකකයන්ට අමතරව යුද්ධ හමුදාව තුළ තොරතුරු තාක්ෂණයේ ව්‍යාප්තිය සමග ඇති වී ඇති සයිබර් තර්ජනයන්ට සාර්ථකව මුහුණදීම, සයිබර් ආරක්ෂණ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ සයිබර් ආරක්ෂණ ඒකකයක් වශයෙන් 12 වන ශ්‍රී ලංකා සංඥා බළකාය 2017 ජනවාරි මස 25 වන දින ස්ථාපනය කරන ලදි.

තොරතුරු තාක්ෂණ ඒකකයන් වෙතින් යුද්ධ හමුදා මූලස්ථානය ප්‍රමුඛ ආරක්ෂක සේනා, සේනාංක, බළසේනා, ඒකක, පුහුණු පාසල් හා අනෙකුත් ස්වාධීන මූලස්ථාන/ ආයතන ආවරණය කරමින් සමස්ථ යුද්ධ හමුදාව තුළ තොරතුරු තාක්ෂණ සේවා සැපයීම් සිදුකරනු ලබයි. එමෙන්ම එම ඒකකයන් හා සම්බන්ධීකරණයෙන් 12 වන ශ්‍රී ලංකා සංඥා බළකාය සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයට අනුයුක්තව රාජකාරි ඉටුකරනු ලබන මෘදුකාංග ඉංජිනේරුවරුන්, ජාලකරණ ඉංජිනේරුවරුන්, තොරතුරු තාක්ෂණ ආරක්ෂක විශ්ලේෂකයින්, මෘදුකාංග තත්ව පරීක්ෂක ඉංජිනේරුවරුන්, දෘඩාංග ඉංජිනේරුවරුන් හා තොරතුරු තාක්ෂණ නිලධාරීන් මෙන්ම පරිගණක ක්‍රියාකරුවන් සහ පරිගණක කාර්මිකයින් මගින් තොරතුරු තාක්ෂණ සේවා සැපයීම හා සයිබර් ආරක්ෂාව සඳහා අනර්ග සේවාවක් ඉටුකරමින් පවතී. පවතින කොවිඩ් 19 වසංගත තත්වය යටතේ කොවිඩ් 19 පැතිරීම වැලැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපතිගේ සෘජු උපදෙස් පරිදි ප්‍රධාන සංඥා නිලධාරිගේ මගපෙන්වීම යටතේ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් කොවිඩ් මර්ධන වැඩපිළිවෙල සඳහා සුවිශාල දායකත්වයක් ලබාදීම සිදුකරනු ලබන අතර, එහිදී දත්ත පද්ධති හා මෘදුකාංග සකස් කිරීම හා ප්‍රතිශක්තීකරණ එන්නත්කරණ වැඩපිළිවෙල සඳහා සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි දත්ත ඇතුලත් කිරීම සඳහා පරිගණක ක්‍රියාකරුවන් ලබාදීමේ කටයුතු ඉටුකරනු ලබයි.





තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් රාජකාරි කරනු ලැබූ බ්‍රිගේඩියර් පීඒජේ පීරිස් එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි 2020 ඔක්තෝබර් 10 වන දින මේජර් ජෙනරල් නිලයට උසස්වීම් ලද අතර, මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් එතුමන් එදින සිට රාජකාරි ආරම්භ කරන ලද අවස්ථාව





2021.01.20 දින මේජර් ජෙනරාල් පීඑජේ පීරිස් එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී ප්‍රධාන සංඥා නිලධාරී තනතුරේ රාජකාරී භාරගැනීම සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල් තනතුරට සමුදෙන ලද අවස්ථාව





2021.01.21 දින මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ 7 වන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් කර්නල් කේසී ප්‍රතාපසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කල අවස්ථාව





2021.02.04 දින තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ කර්නල් කේසී ප්‍රතාපසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරී බ්‍රිගේඩියර් නිලයට උසස්වීම් ලැබීමෙන් අනතුරුව පිරිනැමුනු සම්මාන මුරය හා විශේෂ අවස්ථාව

තොරතුරු තාක්ෂණ යුගයේ කැපීපෙනෙන වර්ධනය හා සමගාමීව වෘත්තීමය හමුදාවක් ලෙස දියුණුවෙමින් පවතින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල දිනෙන් දින ඉහල යන තොරතුරු තාක්ෂණ යෙදවුම් සහ භාවිතාව සපුරාලීමේ අභියෝගාත්මක වගකීම පෙරදැරිව ක්‍රියාකරමින් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු අංශය වෙතින් සමස්ථ යුද්ධ හමුදාවේ ප්‍රයෝජනය සඳහා මෙන්ම ජාතික අවශ්‍යතා සඳහා ද සිය හැකියාවන් භාවිතා කරමින් විවිධ මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ පද්ධති හඳුන්වාදීමට පසුගිය වර්ෂය තුලදී ද ඉතා විශිෂ්ඨ සේවාවක් ඉටුකරන ලදි. මෙම කාර්යය තුලදී පහත දක්වා ඇති මෘදුකාංග හා තොරතුරු කළමණාකරණ පද්ධති හඳුන්වා දෙන ලදි.

**සමස්ත යුද්ධ හමුදා මට්ටමින් ක්‍රියාත්මක කර ඇති මෘදුකාංග පද්ධති**

- Army Hospital Information System
- Army Web Portal System
- Army Central Human Resource Management System
- Daily Mail Dispatch Service
- Strength Management System - Sri Lanka Army
- Ration Management System

**සමස්ත යුද්ධ හමුදා මට්ටමින් සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග පද්ධති**

- Geo Based Personal Information System
- Army Headquarters Access Management System
- Fuel Distribution Management System

**යුද්ධ හමුදා ශාඛා මට්ටමින් ක්‍රියාත්මක කර ඇති මෘදුකාංග පද්ධති**

| | |
|---|---|
| Officers Carrier Development Monitoring System | - MS Br |
| Employee Details Management System in AHQ (COVID-19) | - AG Br |
| Finance Management & Bill Status Monitoring System | - Fin Mgmt Br |
| Tender Notification System | - MGO Br |

**යුද්ධ හමුදා ශාඛා මට්ටමින් සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග පද්ධති**

| | |
|---|---|
| Vehicles Repair Details Management System | - MGO Br |

**යුද්ධ හමුදා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් ක්‍රියාත්මක කර ඇති මෘදුකාංග පද්ධති**

| | |
|---|---|
| COVID 19 - Quarantine Details Management System | - Dte of Ops |
| Physical Test Evaluation System | - Dte of Trg |
| New Army ID Card System | - Dte of MI |
| Document Management System | - Dte of PA |
| Insurance Management System | - Dte of Welfare |
| Shopping Cart for Army Welfare Shop | - Dte of Welfare |
| Automated Assets Management System | - Dte of AM |
| Army Benevolent Fund System | - Dte of ABF |
| Inventory Management System | - Dte of Engr Svcs |
| Sri Lanka Army Automated Material Management System | - Dte of Ord Svcs |
| Integrated Training Information Platform - Officers | - Dte of Trg |
| Sports Medicine Section Information System (SMSIS) | - Dte of Sports |
| Welfare Management System for Dte of Welfare | - Dte of Welfare |
| Veterans' Training Management Systems | - Dte of VA |
| Air Ticketing Information System - Air Travel | - Dte of Mov |
| Centralized Medical Stock Management System | - Dte of AMPS |
| Smart Soldier System | - Dte of Ops |

**යුද්ධ හමුදා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග පද්ධති**

| | |
|---|---|
| Integrated Operations Management System | - Dte of Ops |
| Disciplinary Records Management System | - Dte of Legal Svcs |
| Accident Details Monitoring System | - Dte of Pro |
| Information System for Arrested Personnel | - Dte of HR & HL |
| Centralized Dental Stock Management System | - Dte of ADS |
| Dental Information Management System | - Dte of ADS |

**විවිධ විශේෂ අවශ්‍යතා වෙනුවෙන් සකස් කර ක්‍රියාත්මක කර ඇති මෘදුකාංග පද්ධති**

| | |
|---|---|
| Meal Management System | - AHQ Offrs' Mess |
| Weapon Details Management System | - CAAD |
| Virusara Card System | - RSA |
| KIA / WIA Service Personnel Welfare Management System | - RSA |
| Army Para Games System | - Para Committee |
| Vehicles Tracking System | - Ex Cormorant Strike |

| | |
|---|---|
| Ranaviru Apparel Information System | - Ranaviru Apparel |
| Laya Hotel Billing System | - Laya Hotel |
| Learning Management System | - NDC Collage |

<u>විවිධ විශේෂ අවශ්‍යතා වෙනුවෙන් සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග පද්ධති</u>

| | |
|---|---|
| Information System for Trade Test Classifications | - Log Command |
| Welfare Management System for Civilian Staff | - Dte of CA |
| Unit Benevolent Fund | - RHQs |
| Insurance Management System | - HQ SLAVF |
| Information Management System | - HQ 57 DIV |

<u>ජාතික මට්ටමින් සංවර්ධනය කර ඇති මෘදුකාංග හා ලබාදී ඇති තොරතුරු තාක්ෂණ සේවාවන්</u>

| | |
|---|---|
| Driving license printing project | - ACITS |
| Taking over the control and hardening the system by Curtailing Backend activities with Suitable Access Control | - ACITS |
| ID Card Design System | - President Secretariat |
| Fleet Management System | - President Guard |
| Information Dashboard | - National Operation Centre for Preventive of Cosvid-19 |

2021 මාර්තු මස 01 දිනය යෙදී තිබු තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ 11 වන සංවත්සරය සමරමින් 2021 පෙබරවාරි මස 28 වන දින කොස්ගම සර්වෝදය සුවසෙත ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙත පාසල් උපකරණ හා වියළි සලාක අවශ්‍යතා පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලද අතර, එම අවස්ථාව සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, නිලධාරිණීන් සහ සෙසුනිලයින් සහභාගී වන ලදි. එම වැඩසටහනට සමගාමීව එම මධ්‍යස්ථානයේ අත්‍යාවශ්‍ය පිළිසකර කටයුතු සිදුකිරීම සඳහා ශ්‍රමදානයක් සංවිධානය කිරීමට ද කටයුතු කරන ලදි.






සර්වෝදය සුවසෙත දරු සෙවන ළමා නිවාසයේ වාසය කරනු ලබන ළමයින් සඳහා ත්‍යාග ප්‍රදානය කිරීම






11 වන සංවත්සරයට සමගාමීව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් සියලු නිල සුහද හමුවක් සීතාවක මිරකල් රිසෝර්ට් හි දී පැවැත්වූ අවස්ථාව





2021.02.26 වන දින කර්නල් එච්ඩීජේපී වීරතුංග ජ්‍යෙෂ්ඨ නිලධාරී තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ 2 වන කර්නල් - තොරතුරු තාක්‍ෂණ වශයෙන් සුබ මොහොතින් රාජකාරි භාරගත් අවස්ථාව

යුද්ධ හමුදා දත්ත ජාලය හා තොරතුරු තාක්‍ෂණ පද්ධති වෙත දිනෙන් දින වැඩිවන සයිබර් ප්‍රහාරයන් නිරක්‍ෂණය හා වලක්වා ගැනීමේ මූලික පියවරක් ලෙස තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය යටතේ ආරක්‍ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය 2021 ජූනි මස 20 දින තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩල පරිශ්‍රයේ මෙහෙයුම් ආරම්භ කරන ලදි.





තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩල පරිශ්‍රයේ නවතමයෙන් ආරම්භ කරන ලද ආරක්‍ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය

යුද්ධ හමුදාව තුල භාවිතා කරනු ලබන තොරතුරු තාක්‍ෂණ යෙදවුම් පිළිබඳව නිලධාරීන් සහ සෙසුනිලයින් දැනුවත් කිරීමේ අරමුණ මූලික කරගෙන තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙතින් සියලුම ආරක්‍ෂක සේනා බලප්‍රදේශ ආවරණය වන පරිදි එක් එක් බලප්‍රදේශය තුල තෙදින වැඩමුළුවක් බැගින් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම 2021 ජූනි හා ජූලි මාසයන් තුල සිදුකරන ලද අතර, මෙම වැඩසටහන සඳහා නිලධාරීන් 90 හා සෙසුනිලයින් 243 සහභාගී වන ලදි.





ආරක්‍ෂක සේනා බලප්‍රදේශ ආවරණය වන පරිදි පවත්වන ලද වැඩමුළුවල විශේෂ අවස්ථා

යුගයේ අභියෝගාත්මක හෙට දිනයේ අභිමානයෙන් යුතු හමුදාවක් ලෙස වෘත්තීය දැනුමෙන් සන්නද්ධව, තාක්‍ෂණය සමග නව මානයන් ඔස්සේ මතුවන සියළු අභියෝග ජයගැනීමට තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඉටුකරනු ලබන සුවිශාල කාර්යභාරය ශ්‍රී ලංකා සංඥා බළකායේ කීර්තිය වර්ධනය කිරීමට ද මහත් වූ පිටුවහලක් වනු නොඅනුමානය.

# සංඥා බළසේනා මුලස්ථානය



බ්‍රිගේඩියර්
පීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී
පීඑස්සී
සංඥා බළසේනාධිපති

ශ්‍රී ලංකාව තුල ඇතිවු ත්‍රස්ථවාදි අරගල හේතුකොටගෙන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් සමග අණදීමේ හා පාලන කටයුතු ක්‍රමවත්ව ඉටුකිරීම සඳහා අවැසි සංඥා සම්බන්ධතාවය ඉටු කිරීමේ අරමුණින් 1988/06/01 වන දින ප්‍රධාන සංඥා නිලධාරී අධ්‍යක්ෂක මණ්ඩලය/ සංඥා බළසේනාව වශයෙන් යුධ හමුදා මුලස්ථානයේදි ආරම්භ කරන ලද අතර, මානුෂිය මෙහෙයුම් ආරම්භ කිරීමත් සමග සංඥා බළසේනා මුලස්ථානයක් වශයෙන් ස්වාධිනව 2008/08/11 දින සිට රාජකාරි කිරීම ආරම්භ කරන ලදි. බළසේනාව ආරම්භයේ සිට පැවති යුධමය කාලවකවානුව තුල බලකායට ආවේණික සන්නිවේදන රාජකාරී ඉටුකිරීම සඳහා මෙම බළසේනාව විසින් සිදුකරන ලද සේවාව යුද්ධ හමුදාව තුල ප්‍රශංසාවට ලක්ව ඇත.

යුධමය කාල වකවානුවෙන් පසු එවකට ආධාරක බළඇණි වශයෙන් පැවති ඒකක වෘත්තිය සංඥා ඒකක බවට පරිවර්ථනය වෙමින් ශ්‍රී ලංකා සංඥා බළකාය තව දුරටත් පුළුල් වු අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත අවැසි සන්නිවේදන අවශ්‍යතා නව තාක්‍ෂණයෙන් යුතුව ඉතා උසස් මට්ටමින් ඉටු කිරීමේ භාරදූර්‍ය වගකිම මෙම බළසේනා මුලස්ථානය වෙත පැවරී ඇත. වාර්ෂිකව යුද්ධ හමුදා මුලස්ථානය වෙතින් වෙන් කරන ප්‍රතිපාදන ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය වෙතින් මනාව පාලනය කරමින් ලබාදෙන අතර එම උපකරණ හා පද්ධති භාවිතයෙන් දැනට ඉතා සාර්ථකව සන්නිවේදන ක්‍රියාවලියක් සිදුකිරීමට මෙම බළසේනාවට හැකියාවක් ලැබී ඇත.

මේවන විට රට තුල කොවිඩ් 19 හෙවත් කොරෝනා වසංගතය සීඝ්‍රයෙන් ව්‍යාප්තවෙමින් පැවතියද යුද්ධ හමුදා මුලස්ථානය ඇතුළු ඕනැම ස්ථානයක් සදහා අවැසි සංඥා සම්බන්ධතාවයන් ඉතා උසස් අයුරින් පවත්වාගෙන යාමට අප බළසේනාවට හැකිවී ඇත. විශේෂයෙන් කොවිඩ් 19 වෛරසය පැතිරවීම වැලැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය ඇතුළු යුද්ධ හමුදාව වෙතින් පවත්වාගෙන යනු ලබන සියළු නිරෝධායන මධ්‍යස්ථාන සහ ප්‍රතිකාර මධ්‍යස්ථානයන් හි සංඥා සම්බන්ධතා මනාව පවත්වාගෙනයාමට හැකිවීම අප ලද ජයග්‍රණයන් ලෙස පෙන්වා දෙමි.




22 වන සංඥා බළසේනාධිපති වශයෙන් බ්‍රිගේඩියර් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පි යූඑස්පි පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී වැඩභාර ගැනිමට පෙර ආගමික වතාවත් සිදුකිරීම හා සුබ මොහොතින් රාජකාරී භාරගත් අවස්ථාව




23 වන සංඥා බළසේනාධිපති වශයෙන් බ්‍රිගේඩියර් පීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කිරීම හා සංඥා බළකාධිපති හමුවූ අවස්ථාව

## නව බළකාධිපති ලෙස මේජර් ජෙනරාල් පීඑජේ පීරිස් එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරෙහි වැඩ භාර ගැනිම

13 වන නව සංඥා බළකාධිපති වශයෙන් මේජර් ජෙනරාල් පීඑජේ පීරිස් එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරී සිය තනතුරේ වැඩ භාරගැනිම 2021.01.18 දින මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිදුවූ අතර, ඒ සඳහා සම්මාන මුරය, සම්මාන පෙළපාලිය, මියගිය රණවිරුවන් සිහිකිරිම වෙනුවෙන් රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීම හා නවීණ තාක්ෂණය භාවිතා කරමින් සංඥා නිලධාරීන් ඇමතිම එදිනට සිදුවිය.













## රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ඉදි කරනු ලබන නව නිලධාරී නිවස්නය සඳහා මුල්ගල තැබීම

ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති වන මේජර් ජෙනරාල් පීජේ පීරිස් එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් සංඥා රෙජිමේන්තු පරිශ්‍රයේ නිලධාරී නිවස්නය නවතමයෙන් ඉදිකිරීම සඳහා වන මුල්ගල තැබීම 2021.02.24 වන දින සිදුවිය.





## නව රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරේහි වැඩ භාර ගැනීම

20 වන නව රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් බ්‍රිගේඩියර් පීඑස් ෆොන්සේකා යුඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී සිය තනතුරේ වැඩ භාරගැනීම 2021.09.21 දින මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිදුවූ අතර, ඒ සඳහා සම්මාන මුරය හා මියගිය රණවිරුවන් සිහිකිරීම වෙනුවෙන් රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීම එදිනට සිදුවිය.





## නව රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන මාණ්ඩලික I තනතුරේහි වැඩ භාර ගැනීම

නව රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන මාණ්ඩලික I වශයෙන් ලුතිනන් කර්නල් ඩීඑම්එස් දිසානායක යුඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී සිය තනතුරේ වැඩ භාරගැනීම 2021.09.30 දින මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිදුවිය.





# 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



ලුතිනන් කර්නල්
පීඑ්ආර් ඇන්තනීස් පීඑස්සී
අණදෙන නිලධාරී

1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වර්තමානයේ මුලතිව් දිස්ත්‍රික්කයේ වට්ටප්පලෙයි ප්‍රදේශයේ ස්ථානගතව ඇති අතර, ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) සහ ඒ යටතේ ඇති සේනාංක මූලස්ථාන, බළසේනා මූලස්ථාන, ඒකක මෙන්ම අනෙකුත් යුද්ධ හමුදා මූලස්ථාන/අණුබණ්ඩ සඳහා සංඥා සම්බන්ධතාවය ලබා දෙමින් හා නවීන තාක්‍ෂණය භාවිතා කරමින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමග සම්බන්ධතාවයෙන් කටයුතු කර ෆයිබර් ඔප්ටික් තාක්‍ෂණය ඔස්සේ ආසේමු (මුලතිව්) බලප්‍රදේශය තුල අන්තර් ජාල පහසුකම් සහිත දත්ත සන්නිවේදන පහසුකම් ඇතිකරමින් සංඥා සම්බන්ධතාවයන් වැඩි දියුණු කිරීමේ කටයුතු සිදුකර ගෙන යනු ලබයි. වත්මන් අණදෙන නිලධාරීගේ මග පෙන්වීම යටතේ මෙම බලප්‍රදේශය තුල සංඥා කුලුණු අලුත්වැඩියාව, ගුවන් විදුලි ජාලයන් ක්‍රමවත්ව පවත්වා ගැනීම, ක්ෂේත්‍ර පරික්ෂාවන් හා නිලධාරීන් හා සෙසුනිලයින්ගේ තාක්ෂණික දැනුම වර්ධනයට කෙටි කාලීන පුහුණු වැඩසටහන් මෙම ඒකකය තුල සිදුකරගෙන යනු ලබන අතර, එය ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති ඇතුලු සියලු නිලයින්ගේ පැසසුමට ලක්වී ඇත.

ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ ඉදිරි අනාගතය උදෙසා ඕනෑම තත්වයක් යටතේ මුහුණ දිය හැකි සෙබලුන් පිරිසක් බිහි කිරීම සඳහා දැනට පවත්වන නෙයෙකුත් පාඨමාලාවන් සඳහා සෙබලුන් යොමුකර ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීමට කටයුතු කර ඇත. තවද ඒකකයේ අභ්‍යන්තර රාජකාරීන් සුබසාධනය හා පරිපාලන රාජකාරීන් විධිමත්ව පවත්වාගෙන යමින් ක්‍රිඩාවලටද මුල් තැනක් දීමට කටයුතු කර ඇත. එහි ප්‍රතිඵලයන් වශයෙන් 2021.03.20 දින පැවති හොකි තරගයෙන් ප්‍රථම ස්ථානයත් මෙම වර්ෂයේ පැවති වොලිබෝල් ක්‍රීඩා තරගයෙන් දෙවන ස්ථානයත් හිමිකර ගැනීමට හැකිවිය.





2021.01.11 දින යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ සංඥා බළකාධිපති වශයෙන් රාජකාරී ඉටුකරන ලද මේජර් ජෙනරාල් ඩීඑ්පීඑන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය





2021.01.16 දින ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් රාජකාරී ඉටුකරන ලද මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඑ්කේ තිලකරත්න පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය





2021.03.13 දින වත්මන් ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරල් පීජේ පීරිස් එන්ඩීයූ යන ජ්‍යෙෂ්ඨ නිලධාරී මෙම ඒකකයේ සිදුකරන ලද සංචාරය



2020.10.13 වන දින මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී වශයෙන් මේජර් කේවීඑ් කොඩිකාර පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී භාරගත් අවස්ථාව



2021.01.20 වන දින මෙම ඒකකයේ විධායක අධිකාරී වශයෙන් කපිතාන් ඩීවීඑන් ධර්මප්‍රිය නිලධාරී සුබ මොහොතින් රාජකාරී භාරගත් අවස්ථාව





ඒකකය තුළ පවත්වනු ලබන විවිධ පාඨමාලාවන්හී අවස්ථා





අණදෙන නිලධාරිගේ මඟපෙන්වීම යටතේ කඳවුරට පිවිසෙන මාර්ගය හා ඒ අවට ප්‍රදේශයත්, මූලස්ථාන ගොඩනැගිල්ලත් නවීකරණය සිදුකිරීම




2021 වර්ෂයේ පැවති අන්තර් ඒකක සරඹ තරගාවලියෙන් ප්‍රථම ස්ථානය දිනාගත් මෙම ඒකකයේ සරඹ කණ්ඩායම






සුබසාධන වෙළඳසැල් සංකීර්ණය අලුත්වැඩියා කිරීම හා විවෘත කල අවස්ථාව




2021.09.25 දින මෙම ඒකකයේ 28 වන අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී කරනු ලැබූ ලුතිනන් කර්නල් එච්පීජේටී පෙරේරා ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී නික්මයාම වෙනුවෙන් පිරිනැමූ සම්මාන මුරය හා විශේෂ අවස්ථා




2021.09.27 දින මෙම ඒකකයේ 29 වන අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් පීඒආර් ඇන්තනීස් පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත පිරිනැමූ සම්මාන මුරය හා සුබ මොහොතින් රාජකාරී භාරගත් අවස්ථාව

# 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



ලුතිනන් කර්නල්
එච්ඒඩබ්ලිව් හෙට්ටිආරච්චි
යූඑස්පී පීඑස්සී
අණදෙන නිලධාරී

වර්ෂ 1989 මාර්තු මස 09 වන දින සංඥා බලකා මැණියන්ගේ කුසින් මොලොව එළිය දුටු 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය විවිධ කඩඉම් පසුකරමින් පැමිණි ගමන් මග තුල ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියමින් මේ වන විට සිය 32 වන වර්ෂ පූර්ණය සනිටුහන් කරනු ලබයි.

මෙම වසර 32 පුරාවට පසුකළ විවිධ කඩඉම් අතුරින් තම මාතෘ භූමියේ ස්වරීභාවය හා භෞමික අඛණ්ඩතාවය උදෙසා ත්‍රස්ථවාදයට එරෙහිව සිදුකල ක්‍රියාන්විතයන්හිදි සංඥා රාජකාරීන් මෙන්ම පාබල රාජකාරීන්ද ඉටුකරමින් සිටියදී රට ජාතිය වෙනුවෙන් තම උතුම් ජීවිත පූජා කල මෙම ඒකක සියලුම රණවිරුවන් මේ මොහොතේදී මහත් අභිමානයෙන් යුක්තව සිහිපත් කරන්නෙමු.

තවද මෙම ඒකකය 21 වන සේනාංකය යටතේ අනුරාධපුර, රණසේවාපුර ස්ථානගතව රාජකාරීන්හි නිරතව සිට 2007 සැප්තැම්බර් මස 18 වන දින සිට මේ දක්වා ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) වෙතින් පාලනය වන පාබල සේනාංක, පාබල බළසේනා මූලස්ථාන, ඒකක හා පුහුණු පාසල් හි සංඥා සම්බන්ධතාවය අඛණ්ඩව පවත්වාගෙන යාමේ කර්තව්‍යය ඉතා උසස් අන්දමින් ඉටුකරමින් ද, සංඥා බළකාය තුල ඇති අනෙකුත් සංඥා රෙජිමේන්තු සමග මනා සම්බන්ධතාවයකින් යුතුව රාජකාරී ඉටු කරමින් ඒකකයේ සුබසාධන හා පාලන රාජකාරීන් විධිමත්ව පවත්වා ගනිමින්ද, විවිධ ක්‍රීඩා කුසලතා තුලින් ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ දක්ෂ ක්‍රීඩකයින් බිහි කරමින්ද සංඥා බළකායට සුවිශේෂී ගෞරවයක් ගෙන දී ඇත.

මෙම රෙජිමේන්තුවේ 25 වන අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් එච්ඒඩබ්ලිව් හෙට්ටිආරච්චි යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි 2021.01.30 වන දින අභිනවයෙන් සිය රාජකාරී භාරගැනීම සිදුකල අතර මේ වන විට ඔහුගේ අත්දැකීම් හා පලපුරුද්ද උපයෝගී කර ගනිමින් මීට පෙර රාජකාරීන් ඉටුකළ අණදෙන නිලධාරීන් 24 දෙනා විසින් ඒකකයේ අභිවෘද්ධිය උදෙසා සිදුකළ සියලු කාර්යයන් තවදුරටත් ඉදිරියට රැගෙන යමින් නව මුහුණුවරක් ඔස්සේ ඒකකයෙහි වෘත්තීය ප්‍රවීනතාවය, ගෞරවය හා ප්‍රතිරූපය භෞතික හා සමාජීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ භාරදූර කර්තව්‍යයක නියැලී සිටී.

2021 මාර්තු මස 09 වන දිනට යෙදුනු මෙම ඒකකයෙහි අභිමානවත් 32 වන සංවත්සරය රටෙහි පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් යුධ හමුදා මූලස්ථානය හා රජය විසින් පනවා ඇති උපදෙස් වලට යටත්ව ඉතා චාම් අයුරින් පවත්වන්නට යෙදුන අතර, සංවත්සර උළෙලට සමගාමීව පැවැත්වූ වැඩසටහන් මාලාවේ පළමු අදියර ලෙස 2021.03.01 හා 02 යන දිනයන් හිදී අන්තර් බළඝණ ක්‍රීඩා තරගාවලියක් පැවැත්වීමටත් 2021.03.04 දින මෙම ඒකකයේ සේවය කරමින් රට ජාතිය වෙනුවෙන් කාය දානයෙන් හා ප්‍රාණ දානයෙන් යුතුව ක්‍රියා කළ රණවිරුවන් සහ සියලු ආබාධිත රණවිරුවන් සිහිපත් කරමින් ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් බෝධිපූජා පිංකමක් නවීකරණය කරන ලද ඒකක බුදුමැදුර අභියස පැවැත්වීමටත් කටයුතු කරන ලදී.

එසේම හමුදා සම්ප්‍රදායන්ටද අනුගත වෙමින් 2021.03.09 වන දින 3 වන සංඥා රෙජිමේන්තුවේ 32 වන සංවත්සර දිනය වෙනුවෙන් ගෞරව අභිමානය පෙරදැරිව අණදෙන නිලධාරී හට සම්මාන මුරයක් පිරිනමන ලද අතර, ඉන් අනතුරුව සංවත්සර උළෙලේ අවසාන අංගය ලෙස සියලු නිලයින්ගේ සුහද හමුව 2021.03.12 වන දින කොනොනි සමාජශාලාවේදී පැවැත්වීමට කටයුතු කරන ලදී.

මේ වන විට රටෙහි පවත්නා වසංගත තත්වය හේතු කොටගෙන ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) අධීක්ෂණය යටතේ පිහිටුවන ලද අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන වන පෙරියපච්චපලෙයි, කෝපායි, නාවක්කුලි, වඩුක්කුඩෙයි, වාසවිලාන් සහ මයිලඩි නිරෝධායන මධ්‍යස්ථාන වලට අවශ්‍ය සියලුම දුරකථන පහසුකම්, අන්තර්ජාල පහසුකම්, සැටලයිට් රූපවාහිනී පහසුකම් සහ සීඩීඑම්ඒ දුරකථන පහසුකම් කඩිනමින් ස්ථාපනය කිරීමෙනුත් එම මධ්‍යස්ථානයන්ට අවශ්‍ය ජන ඇමතුම් උපකරණ ඉතා කඩිනමින් එම ස්ථානයහි ස්ථාපනය කිරීමෙනුත් ඒ වෙනුවෙන් අවැසි තාක්ෂණික දායකත්වය ලබාදීමෙනුත් එම මධ්‍යස්ථානයන් වෙත 3 වන සංඥා රෙජිමේන්තුවට පැවරී ඇති කාර්යයන් සාර්ථකව ඉටු කරමින් පවතී. තවද මේ වසංගතය සීඝ්‍රයෙන් පැතිරයාමත් සමග නවතමයෙන් මයිලඩ්හි ස්ථාපනය කරන ලද නිරෝධායන මධ්‍යස්ථානය තුල නිරෝධායනය වන අයවලුන් සඳහා අවශ්‍ය ආහාරපාන ලබා දීමේ කටයුතුද මේ වන විට මෙම ඒකකය වෙතින් ඉතා සාර්ථකව ඉටු කරමින් සිටී.

අවසන් වශයෙන් 31 වසරක කඩඉම පසුකර 32 වන වසරට පා තබා සිටින මෙම ඒකකය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මගෙහි සාර්ථකත්වයට දායක වෙමින් දිවිහිමියෙන් රාජකාරී කළ සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ද, දැනට රාජකාරියේ යෙදී සිටින සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ද ඉතාමත් භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරමින් මෙවන් මෙහෙවරක් ඉටු කල 3 වන සංඥා රෙජිමේන්තුවෙහි නාමය සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල දීප්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පවත් වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.




2021.01.30 දින මෙම ඒකකයේ 25 වන අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් එච්ඒඩබ්ලිව් හෙට්ටිආරච්චි යූඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත පිරිනැමුනු සම්මාන මුරය හා සුබ මොහොතින් රාජකාරී භාරගත් අවස්ථාව



2021.02.18 වන දින මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී වශයෙන් මේජර් පීටීකේ ද සිල්වා ආර්එස්පී යූඑස්පී එල්එස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී භාරගත් අවස්ථාව



මෙම ඒකකයේ 32 වන සංවත්සරයට සමගාමීව බළඝණ අතර පැවැත්වූ ක්‍රීඩා තරගයන්හි විශේෂ අවස්ථාවන්





සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීඒජේ පීරිස් එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරී මෙම ඒකකයේ සංචාරය කල අවස්ථාව

# 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

වර්ෂ 1991 ජුනි මස 05 දින ආරම්භ කර වසර 30 ක අභිමානය සමරනු ලබන 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය මේ වන විට ආසේමු (වන්නි) බලප්‍රදේශයේ අණ හා පාලනයට අවශ්‍ය සන්නිවේදන සේවාව සැපයීමේ රාජකාරිය නොපිරිහෙලා ඉටුකරනු ලබයි. දිවයිනේ වර්ග කි.මී: 12369 ආවරණය කරන භූමි ප්‍රදේශයක් ආසේමු (ව) බලප්‍රදේශයට අයත් වන අතර, එය දිවයිනේ සමස්ථ භූමි ප්‍රදේශයෙන් 1/10 ක් වේ. මේ යටතේ සේනාංක 05 ක්, ඉනපෙ (උතුරු මැද), බළසේනා 15 ක්, රෙජිමේන්තු මධ්‍යස්ථාන 02 ක්, ඒකක 41 ක්, පුහුණු පාසැල් 06, යුධ රෝහලක්ම අභිමංසල සුවසහන නිකේතනයක් ස්ථානගතව ඇත.



**ලුතිනන් කර්නල්**
**එම්ඩීඑස් මුතුගල යූඑස්පී**
**අණදෙන නිලධාරී**

ඉහත මූලස්ථාන සඳහා සංඥා අවශ්‍යතාවයන් මෙන්ම රටතුල සීඝ්‍රයෙන් දැනට පැතිර යන කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් රටෙහි අවශ්‍යතාවය වෙනුවෙන් ආසේමු (වන්නි) බලප්‍රදේශයේ ස්ථාපනය කරන ලද නිරෝධායන මධ්‍යස්ථාන හා අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන 10 ක් ඇති අතර එම ස්ථානයන් හී සංඥා සම්බන්ධතාවය, සීසීටීවී කැමරා ස්ථානගත කිරීම සහ ජන ඇමතුම් උපකරණ ලබා දී එම ස්ථානයන් හී රාජකාරීන් හරියාකාරව ඉටු කර ගැනීම සඳහා මෙම ඒකක අණදෙන නිලධාරී, නිලධාරී ඇතුලු සියලුම භට පිරිස් මහඟු සේවයක් ඉටු කරනු ලබයි. නිරෝධායන ක්‍රියාවලියට අමතරව බලප්‍රදේශය තුල මහජනතාව සඳහා සිදු කරනු ලබන එන්නත් කරන ක්‍රියාවලියට පැමිණෙණ මහජනයාගේ ජීව දත්ත ඇතුලත් කිරීම සඳහා ද භට පිරිස් නිරන්තරයෙන් සපයනු ලබයි. රටෙහි පවතින හදිසි තත්වය මනාව හදුනා ගනිමින් ආසේමු (ව) බලප්‍රදේශය තුල ඊට අමතරව පැවරෙන සියළුම රාජකාරීන් නොපිරිහෙලා ඉටු කරනු ලබන මෙම ඒකකය ප්‍රදේශයේ සිවිල් ක්‍රියාකාරීන්ගේ මෙන්ම ආසේමු (ව) ආඥාපති ඇතුළු සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේද පැසසුමට ලක්ව ඇත.

වසර 30 ක සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියනු ලබන මෙම ඒකකය 2021 ජුනි 05 වන දින එම සංවත්සරය රටෙහි පවතින නිරෝධායන නීති වලට අනුගත වෙමින් ආගමික වතාවත් සහ ධානමය පුණ්‍ය කටයුතු සඳහා මුල්තැන දෙමින් සිදු කරනු ලැබූ අතර ඒ සඳහා ඒකකයේ සිටින භට පිරිස් ප්‍රමාණයන් සහභාගී කරගනු ලැබුහ.

තවද කඳවුර තුල රාජකාරී කරනු ලබන භටපිරිස්හී සනිපාරක්ෂාව වෙනුවෙන් වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම, සුබ සාධක වෙළඳසැල නවීකරණය කිරීම, සිවිල් සේවක මහතුන්ගේ නේවාසික පහසුකම් නවීකරණය කිරීමේ කටයුතු අවසන් කරන ලද අතර, බලලත් නිලධාරී සහ සැරයන් නිවස්නයේ අළුත්වැඩියා කටයුතු හා කඳවුර ඉදිරිපස වැට අළුත්වැඩියාව, පුහුණු අංශය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම, පලතුරු බීමහල (Juice Bar) ඉදිකිරීම, සෙසුනිළ භෝජනාගාරය නවීකරණය, ආරම්භ කර ඉදිරි කටයුතු මේ වන විට සිදුකරමින් පවති.

තවද ඒකකයේ භට පිරිස්හී දීර්ඝකාලීනව නිරාකරණය නොවූ, පාලන සහ සුබසාධන ගැටළු නැවත බැඳීම්/සේවය දීර්ඝ කිරීම්, නිලයට සිරිලන වැහැදි හිමිගැන්වීම, විශ්‍රාම නිල උසස් කිරීම විධිමත්ව සිදු කිරීම, වසර 18ට අඩුවෙන් යුධ හමුදාවට බැඳුණු අයවලුන්ගේ පාලන කටයුතු සිදුකර අවසන් කිරීම, යහපත් පැවැත්මේ ලාංඡන හිමිගැන්වීම, පදක්කම් හිමිගැන්වීම, සුව සහන අරමුදලට දායකත්වය දැක්වීම, යුධ යහසාධක අරමුදලට දායකත්වය වැඩි කිරීම, රියදුරු රක්ෂණය සඳහා දායකත්වය දැක්වීම, විශ්‍රාම ගැටළු කඩිනමින් ඉටුකිරීම, නිම නොවී පැවති මූලික පරීක්ෂණ උසාවි කටයුතු කඩිනමින් ඉටුකිරීම, එකස් ලයිස්තු ගත කිරීම කඩිනම් කිරීම, රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ ගැටළු කඩිනමින් ඉටුකිරීම හා තවදුරටත් ගැටළු නිරාකරනය නොවූ විවිධ සුබසාධන කටයුතු කඩිනමින් ක්‍රියාකිරීමට කටයුතු සිදුකර ඇත.

තවද ඒකකයේ රාජකාරී නියුතු නිලධාරී/ සෙසුනිල/ සිවිල් සේවක මහතුන්හට කොරෝනා වෛරස ප්‍රතිශක්තිකරණ එන්නත්හී පළමු මාත්‍රාව ලබා දීම 100% කින් අවසන් කිරීම හා දෙවන මාත්‍රාව කඳවුර තුල රාජකාරී නියුතු අයවලුන්ගෙන් 75% ක ප්‍රමාණයකට 2021.08.13 දින වන විට ලබා දී අවසන් කර ඇත.

ආධුනිකයින් බඳවා ගැනීම සඳහා ඒකකය වෙත 50 දෙනෙකු බඳවා ගන්නා ලෙස රෙම ශ්‍රීලංසංබ වෙතින් දැනුම්දී ඇති අතර, මෙම ඒකකය වෙතින් එම ප්‍රමාණය ඉක්මවා බඳවා ගැනීමේ කටයුතු සිදු කර ඇත. එනම් සම්මුඛ පරීක්ෂණ සඳහා 96 දෙනෙකු කැඳවා ඇති අතර, ඉන් සමත් වූ 84 දෙනෙකු වෛද්‍ය පරීක්ෂණ සඳහා යොමු කර ඇති අතර, වෛද්‍ය පරීක්ෂණය 63 දෙනෙකු සමත්වී ඇති අතර, එම අයවලුන් අතරින් 60 දෙනෙකුගේ ලිපි ගොනු සකසා රෙම ශ්‍රීලංසංබ වෙත ඉදිරිපත් කර ඇත. තවද 11 සහ 12 ශ්‍රීලංසංබ ඒකක වෙත බඳවා ගැනීමේ කටයුතු සඳහා ආධුනිකයින් යොමු කරවීම සඳහා දායකත්වය ලබාදී ඇත.

ශ්‍රීලංකා යුධ හමුදාව වෙත සංඥා සම්බන්ධතා පවත්වා ගැනීමේ අරමුණින් ප්‍රසංනිකා වෙතින් ලබා දෙන ලද මූල්‍ය ප්‍රතිපාදන වැය කිරීම් සිදුකර, කල්‍යානිපුර ආධුනික පුහුණු මධ්‍යස්ථානය තුල හා 11 වන ගැමුණු හේවා බළඇණිය මරතොඩි තුල මෙම ඒකක සෙබළුන්ගේ ශ්‍රමදායකත්වය මත පමණක් පිළිවෙලින් උසින් අඩි 100 ක් හා 86 වන සංඥා කුළුණු ඉදිකර දායකත්වය ලබාදී ඇත.



යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ සංඥා බළකාධිපති වශයෙන් රාජකාරි ඉටුකරන ලද මේජර් ජෙනරාල් ඩීඑ්පීඑන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය



ප්‍රධාන සංඥා නිලධාරි වශයෙන් රාජකාරි ඉටුකරන ලද මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඑ්කේ තිලකරත්න පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය





වත්මන් ප්‍රධාන සංඥා නිලධාරි සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරල් පීඑ්ජේ පීරිස් එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරි මෙම ඒකකයේ සිදුකරන ලද සංචාරය



ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්පී ආර්එස්පී යුඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි මෙම ඒකකයේ සිදුකරන ලද සංචාරය



මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරි වශයෙන් මේජර් ඩබ්එච්එම්ජේ විජේරත්න පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සුබ මොහොතින් රාජකාරි භාරගත් අවස්ථාව



සංඥා රාජකාරි කඩිනමින් සහ ක්‍රමවත්ව ඉටුකිරීමේ පරමාර්ථය උදෙසා 54 පාබල සේමු හී සංඥා පාඨමාලාවක් පැවැත්වීම




මෙම ඒකකයේ දායකත්වයෙන් සිදුකරනු ලබන කොවිඩ් - 19 ප්‍රතිශක්ති එන්නත්කරණ වැඩසටහන

# 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



ලුතිනන් කර්නල් ඩීඑම්අයිඑස් බණ්ඩාර අණදෙන නිලධාරී

සංඥා බළකායේ ප්‍රථම ආධාරක බළඇණිය ලෙස වර්ෂ 1994.01.02 දින නගාසිටුවන ලද මෙම ඒකකය උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි ක්‍රියාන්විත රාජකාරී සිදුකරමින් එල්ටීටීඊ ත්‍රස්ථවාදීන්ට එරෙහි තිස් වසරක කුරිරු යුද්ධය නිමා කිරීම සඳහා යුධ පෙරමුණෙහි ඉදිරියෙන්ම සටන් කරමින් සක්‍රීයව තම දායකත්වය ලබාදී ඇත.

යුධමය වතාවරණය නිමාවීමෙන් පසුව මෙම ඒකකය 2014.05.29 වන දින සංඥා රාජකාරී ඉටුකිරීම සඳහා ආසේමු (බටහිර) බලප්‍රදේශයේ ස්ථානගත වු අතර, දැනට පාදුක්ක මෙනේරිගම ප්‍රදේශයේ සිට සංඥා රාජකාරී සිදුකරමින් පවති. සංඥා රාජකාරීන්ට අමතරව 2019 අප්‍රේල් මස එල්ල වන ලද ත්‍රස්ථ ප්‍රහාරයත් සමගම නවතමයෙන් ස්ථාපිත කරන ලද කොට්ඨාශ මුලස්ථාන 10 (කොමු 10) හි අණදිම සඳහා මෙම ඒකක අණදෙන නිලධාරී පත්කර ඇත. කොමු 10 ට අයත් පාදුක්ක, හංවැල්ල, අවිස්සාවේල්ල සහ කොස්ගම ප්‍රදේශයන්හි සිවිල් ජනයාගේ ආරක්ෂාව සහ එම ප්‍රදේශයන්හි ඇතිවන හදිසි ආපදා තත්වයන්වලදි හඵපිරිස් කඩනමින් යොමුකර එම කටයුතු සාර්ථක කර ගැනීමේ මෙහෙයුම් කටයුතු සඳහා සක්‍රියව දායකත්වය ලබාදෙමින් පවති.

කොවිඩ් - 19 ව්‍යාප්තිය වලක්වා ගැනීමේ ජාතික ක්‍රියාන්විතය වෙනුවෙන් ඉතා විශාල කාර්‍යභාරයක් ඉටුකරමින් පවතින අතර, කටුනායක ජාත්‍යාන්තර ගුවන් තොටුපලේ ස්ථාපිත තාපක කැමරා විමර්ෂනය කිරීම, රාජගිරියේ ස්ථාපිත කොවිඩ් - 19 වැලැක්වීමේ ජාතික ක්‍රියානවිත මෙහෙයුම් මධ්‍යස්ථාන සහ එහි ස්ථාපිත දුරකථන පණිවිඩ හුවමාරු මධ්‍යස්ථානය (Call Centre) සඳහා සහ සීදුව ප්‍රදේශයේ ස්ථාපිත අතරමැදි නිරෝධායන මධ්‍යස්ථානය සඳහා ඇවැසි ජන ඇමතුම් සේවාව/දුරකථන හුවමාරු ක්‍රියාකරුවන්ගේ සේවාව සහ දුරකථන මාර්ග නඩත්තුකරුවන්ගේ සේවාවන් ලබාදෙමින් මෙම ජාතික ක්‍රියාන්විත සඳහා තම දායකත්වය උපරිම වශයෙන් ලබාදෙමින් ඇත. මෙම සේවාවන්ට අමතරව දැනට ක්‍රියාත්මක කොවිඩ් - 19 එන්නත් කිරීමේ ජාතික ක්‍රියාන්විත වැඩසටහන සාර්ථක කර ගැනීම උදෙසා පැමිණෙනු ලබන සිවිල් ජනතාවගේ දත්ත ඇතුලත් කිරීම වෙනුවෙන් අවැසි පරිඝණක දත්ත ක්‍රියාකරුවන්ගේ සේවාවද ලබාදෙමින් පවති.





2021.01.02 දිනට යෙදෙන ලද ඒකක 27 සංවත්සර දිනයට සමගාමීව අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් ඩීඑම්අයිඑස් බංඩාර යන ජ්‍යේෂ්ඨ නිලධාරී වෙත පිරිනමන ලද සම්මාන මුරය හා 'නා' පැලයක් රෝපණය කල අවස්ථාව



2021.01.04 දින යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ සංඥා බළකාධිපති වශයෙන් රාජකාරී ඉටුකරන ලද මේජර් ජෙනරාල් ඩීඒපීඑන් දෙමටන්පිටිය එන්ඩියු පීඑස්සී යන ජ්‍යේෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය



2021.01.15 දින ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් රාජකාරී ඉටුකරන ලද මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒකේ තිලකරත්න පීඑස්සී යන ජ්‍යේෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරය හා පිරිනමන ලද සම්මාන මුරය





2021.03.23 දින සංඥා බළසේනාධිපති බ්‍රිගේඩියර් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පි යූඑස්පි පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී මෙම ඒකකයේ සිදුකරන ලද සංචාරය වෙනුවෙන් පිරිනමන ලද සම්මාන මුරය සහ සමූහ ඡායාරූපය










2021.06.23 දින වත්මන් ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීඒජේ පීරිස් එන්ඩීයූ යන ජ්‍යෙෂ්ඨ නිලධාරී මෙම ඒකකයේ සිදුකරන ලද සංචාරය වෙනුවෙන් පිරිනමන ලද සම්මාන මුරය සහ විශේෂ අවස්ථා





ප්‍රධාන පිවිසුම් දොරටුව සහ නවතමයෙන් කාපට් අතුරා සකස් කරන ලද මාර්ග පද්ධතිය

# 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



**ලුතිනන් කර්නල්**
**එස්එල්ඩී ප්‍රනාන්දු**
**අණදෙන නිලධාරී**

2021 වර්ෂයේ 24 වන වියට පා තැබු මෙම ඒකකය සංඥා බළකායේ 2 වන ආධාරක බළඇණිය ලෙස 1997.01.10 වන දින ස්ථාපිත කරනු ලැබු අතර, 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (ආධාරක බළඇණිය) 2014.06.16 වන දින ආධාරක බළඇණි රාජකාරි වලින් මිදී තොරතුරු තාක්ෂණ රාජකාරීන් වෙත අනුවර්ථනය වූ අතර, මෙම වර්ෂයේදි 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (තොරතුරු තාක්ෂණ) සිය හත්වන සංවත්සරය සමරන ලදි.

වර්තමානයේ මෙම ඒකකය යාපනය නගරයේ කලපුව ආශ්‍රිතව ඉතා අලංකාර භූමි ප්‍රදේශයක ඉදිකරන ලද කඳවුරු සංකීර්ණයක් ලෙස අභිමානවත්ව ස්ථානගතව ඇති අතර, මෙම ඒකක අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් එස්එල්ඩී ප්‍රනාන්දු යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අණදීම යටතේ අතිරේක ප්‍රහාරක බළකාය, ආසේමු (යා), ආසේමු (වන්නි), ආසේමු (කිලි) හා ආසේමු (මු) යන ආරක්ෂක සේනා බලප්‍රදේශයන් තුළ තොරතුරු තාක්ෂණ රාජකාරී ආවරණය කරමින්ද, උසස් මූලස්ථානයන් වෙතින් පැවරෙන රාජකාරීන් හා වගකීම්ද ඉතා උසස් අන්දමින් ඉටුකරනු ලබයි.

මෙම ඒකකය වෙතින් පරිගණක ක්ෂේත්‍ර වැඩපල යාපනය, රණවිරු තොරතුරු සම්පත් කේන්ද්‍රය යාපනය, පරිගණක මූලික වැඩපල කොකාවිල්, රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය කොකාවිල් සහ රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය අනුරාධපුරය යන ආයතනයන්හි අණ හා පාලනය සිදුකරන අතර, 2021 වර්ෂයේ නවතමයෙන් පරිගණක ක්ෂේත්‍ර වැඩපලක් අනුරාධපුර ආරම්භ කිරීමට හැකිවීම ඒකකය වගකිව යුතු බලප්‍රදේශය තුළ තොරතුරු තාක්ෂණ සේවා ව්‍යාප්ත කිරීම තවත් එක් සන්ධිස්ථානයක් වනු ඇති අතර, තොරතුරු තාක්ෂණ ඒකකයක් ලෙස නගා සිටුවා වසර 07 ක් වැනි කෙටි කාලයක් තුළදී අත්පත් කරගත් ජයග්‍රහණයක් වනු ලැබේ. මෙම පරිගණක ක්ෂේත්‍ර/මධ්‍යම වැඩපල වෙතින් යුධ හමුදාව වෙතින් නිකුත් කරන ලද තොරතුරු තාක්ෂණ උපකරණ/උපාංග අලුත්වැඩියා කටයුතු සිදුකරනු ලබන අතර, ඒකකය විසින් රාජකාරී ආවරණය කරනු ලබන බලප්‍රදේශය තුළ ප්‍රාදේශිය ජාලගත කිරීම, සීසීටීවී කැමරා පද්ධති ස්ථාපිත කිරීම ආදි ව්‍යාපෘති සිදුකරනු ලබයි. එසේම තොරතුරු තක්ෂණ පුහුණු ආයතන මගින් යුධ හමුදා අයවලුන් සදහා අවශ්‍ය පුහුණු කටයුතු විශිෂ්ඨ අයුරින් සිදුකරනු ලබන අතර, වර්තමාන කොවිඩ් වසංගත තත්වය හමුවේ වුවද එම රෙගුලාසිවලට අනුකූලව මාර්ගගත තාක්ෂණය ඔස්සේ නිරන්තරයෙන්ම පුහුණු සැසි/කෙටිකාලින පාඨමාලා ආදිය සිදුකරනු ලැබේ. තවද මෙම තොරතුරු තාක්ෂණ ආයතන තුලින් ලුතිනන් සිට කපිතන් සහ කපිතන් සිට මේජර් දක්වා නිල උසස් කිරීමේ විභාගයන්හි තොරතුරු තාක්ෂණ ප්‍රායෝගික පරීක්ෂණයන්ද සිදුකරනු ලබයි.

තවද වර්තමාන කොවිඩ් වසංගත තත්වය හමුවේ යුද්ධ හමුදාව වෙත පැවරී ඇති තවත් එක් භාරදූර කාර්යයක් වන එන්නත්කරණ වැඩසටහනේ ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත පැවරී ඇති එන්නත්කරණ දත්ත ඇතුළත් කිරීමේ වගකීම සඳහා මෙම ඒකකය විසින් රාජකාරී ආවරණය කරනු ලබන බලප්‍රදේශයන් තුළද පරිගණක යන්ත්‍ර අවශ්‍ය පරිදි ලබාදෙමින් පරිගණක ක්‍රියාකරුවන්ගේ දායකත්වය ලබාදෙමින් සහ රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනයන්හි පාඨමාලාවන් හදාරනු ලැබූ අනෙකුත් රෙජිමේන්තු වල අයවලුන් අදාල ආසේමුහි තොරතුරු තාක්ෂණ නිලධාරීන් හරහා සම්බන්ධිකරණය කරමින් එන්නත්කරණ දත්ත ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය පරිදි යොදවමින් මෙම ඒකකය උපරිම දායකත්වය ලබාදෙනු ලබයි.

තවද, මෙම ඒකක නිලධාරී හා සෙසු නිලයින්ගේ ක්‍රීඩා කුසලතාවයන්ද මේ වන විට උසස් මට්ටමක පවතින අතර, 2020 වර්ෂයේ අන්තර් සංඥා ඒකක කඹ ඇදීමේ තරඟාවලියේදී තුන්වන ස්ථානයද අන්තර් සංඥා ඒකක කබඩි තරඟාවලියේදී දෙවන ස්ථානයද, වෙරළ කබඩි තරඟාවලියේදී ප්‍රථම ස්ථානයද හිමි කරගත් අතර, 2021 වර්ෂයේ අන්තර් සංඥා ඒකක කබඩි තරඟාවලියේදී ප්‍රථම ස්ථානයද, වෙරළ කබඩි තරඟාවලියේදී දෙවන ස්ථානයද හිමි කරගන්නා ලදි.

එමෙන්ම තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් 2021.06.16 දින මෙම ඒකකය සිය 07 වන සංවත්සරය සැමරූ අතර, එයට සමගාමීව මෙම ඒකකය ආධාරක බළඇණියක් වශයෙන් තිබියදී ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිට තම ජීවිත පුදකල රණවිරුවන් හට නිවන් සුව ප්‍රාර්ථනය කිරීම සදහාත්, තුවාල ලබා ආබාධිත තත්වයට පත්ව සිටින රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම සදහාත්, කොවිඩ් ආරක්ෂණ ප්‍රතිපත්තීන්ට අනුකූලව යාපනය ශ්‍රී නාග විහාරස්ථානයේදි ආගමික වතාවත් සිදුකරන ලද අතර, එයට සමගාමීව යාපනය තෙරේසා මව්තුමි වැඩිහිටි කාන්තා රක්ෂණ නිවාසය වෙත වියළි සළාක පිරිනමන ලදි.





2021.01.10 දින යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ සංඥා බළකාධිපති වශයෙන් රාජකාරි ඉටුකරන ලද මේජර් ජෙනරාල් ඩීඑම්පීඑන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මෙම ඒකක සංචාරය හා පිරිනමන ලද සම්මාන මුරය





2021.01.17 දින ප්‍රධාන සංඥා නිලධාරි වශයෙන් රාජකාරි ඉටුකරන ලද මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඑකේ තිලකරත්න පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මෙම ඒකක සංචාරය හා පිරිනමන ලද සම්මාන මුරය





2021.03.12 දින වත්මන් ප්‍රධාන සංඥා නිලධාරි සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීඑජේ පීරිස් එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මෙම ඒකක සංචාරය හා පිරිනමන ලද සම්මාන මුරය



2021.01.01 දින මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරි වශයන් මේජර් ටීඩීටී විජේසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරි සුබ මොහොතින් රාජකාරි භාරගත් අවස්ථාව



2021.06.15 දින ඒකක රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් බනි 1 එඑම් තුසිත කුමාර බලලත් නිලධාරි සුබ මොහොතින් රාජකාරි භාරගත් අවස්ථාව

## 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් සමග දශක 3 ක පමණ කාලයක් මුළුල්ලේ මාතෘ භූමියේ ස්වෛරීභාවය උදෙසා කුරිරු ත්‍රස්තවාදින් හමුවේ සටන් වැදි සිටින පාබල ඒකක සමඟ 7 වන රෙජිමේන්තු ශ්‍රී ලංකා සංඥා ආධාරක බළඇණිය 2008 පෙබරවාරි මස 08 වන දින 18 x 525 ක භඨ පිරිසකින් යුතුව සංඥා රෙජිමේන්තු මධස්ථානය පනාගොඩදී අභිමානයෙන් ආරම්භ කරන ලදී. එහිදි ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරි වශයෙන් මේජර් ඩීබීසී ජයසිංහ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් වැඩ භාරගන්නා ලදී. එවකට සංඥා බළකාධිපති බ්‍රිගේඩියර් ටීඑෆ් මීඩින් ආර්එස්පී එල්ඩිඑම්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි හට සම්මාන මුරයක් පිරිනමා ඒකක ධජය එසවීමෙන් පසු ඒකකයේ රාජකාරි කටයුතු සඳහා මුලාරම්භය යොදන ලදී.



**ලුතිනන් කර්නල්**
**එස්එඩී ගමගෙදර යූඑස්පී**
**අණදෙන නිලධාරී**

7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය උතුරු මානුෂිය මෙහෙයුම සඳහා සක්‍රිය ලෙසින් දායක වෙමින් නොච්චිකුලම්, පාලමොටෙයි, කරුපඩ්ඩාම්මුරිප්පු, උදයාර්කට්ටුකුලම්, විශ්වමඩු, ධර්මපුරම් යන ප්‍රදේශවල සක්‍රියවම ක්‍රියාන්විත සඳහා දායකත්වය ලබා දෙන ලදී. එහිදී 00 x 18 ක රණවිරුවන් තම මාතෘ භූමිය වෙනුවෙන් දිවි පිදු අතර, රණවිරුවන් 01 x 60 දෙනෙකු තුවාල ලබන ලදී.

2013 මාර්තු මස 10 වන දින වෘත්තිය සංඥා බළකායක් වශයෙන් ආසේමු(මධ්‍යම) මුලික කොටගෙන දියතලාව ප්‍රදේශයේ ස්ථාන ගත විමෙන් ආසේමු(බටහිර) හා ආසේමු(මධ්‍යම) බලප්‍රදේශයන්හි සංඥා රාජකාරි ඉටුකිරිමේ භාරදුර වගකිම ගන්නා ලදී. දිස්ත්‍රික්ක 15 ක් ආවරණය කරමින් වසරකට අධික කාලයක් ආසේමු බලප්‍රදේශයන් දෙකක සාර්ථක රාජකාරින් ඉටු කිරිමෙන් පසුව 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් ආසේමු(බටහිර) බලප්‍රදේශයේ සංඥා රාජකාරි ඉටු කිරිම ආරම්භ කිරිම 2015 සැප්තැම්බර් මස 19 වන දින සිදු කරන ලද අතර, ඉන් පසුව දිස්ත්‍රික්ක 6 ක් ආවරණය වන පරිදි ආසේමු(මධ්‍යම) යටතේ සාර්ථකව රාජකාරි සිදු කරමින් සිටි. 2014 දෙසැම්බර් මස 26 වන දින සියළු නිලයන්ගේ අප්‍රතිහත කැපවීම මත දියතලාව මැණික්කන්ද ප්‍රදේශයේ දර්ශනීය භූමි භාගයක් තුල මෙම ඒකකය ස්ථාපිතව ඇත.

### කොවිඩ් - 19 වෛරසය මැඩලීම සඳහා 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ දායකත්වය

ආසේමු(මධ්‍යම) උපදෙස් පරිදි 2020 ඔක්තෝම්බර් මස 13 වන දින මෙම ඒකක අධීක්ෂණය යටතේ බීඳුණුවැව ගුරු අභ්‍යාස විද්‍යාලයේ ආරම්භ කරන ලද කොරෝනා ප්‍රථිකාර මධ්‍යස්ථානයේ නඩත්තු/පාලන කටයුතු සහ ආරක්ෂාව මෙම ඒකක වෙතින් සිදු කරනු ලබයි.

මෙම ඒකකයේ රාජකාරි කරනු ලබන නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සෙනින් 10 දෙනෙකු යොදවා ඇති අතර, දෛනික ආහාරපාන හා සනීපාරක්ෂාව පිළිබඳ මෙම ඒකකය වගකීමෙන් යුක්තව කටයුතු කරනු ලබන අතර, ප්‍රථිකාර මධ්‍යස්ථානය ආරම්භයේ සිට මේ දක්වා දෙස් විදෙස් සිවිල් වැසියන් 6575 දෙනෙකු හට ප්‍රථිකාර කර සුවය ලබා පිටව ගොස් ඇත.





2021.02.22 අණදෙන නිලධාරී වශයෙන් රාජකාරි කරනු ලැබු ලුතිනන් කර්නල් එම්ආර් හමීම් යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි නික්මයාම වෙනුවෙන් පවත්වනු ලැබු සම්මාන පෙළපාලිය හා විශේෂ අවස්ථා









2021.02.22 දින මෙම ඒකකයේ 13 වන අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් එස්ඒඩී ගමගෙදර යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත පිරිනැමු සම්මාන මුරය හා සුබ මොහොතින් රාජකාරී භාරගත් අවස්ථාව









2021.07.10 දින ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීඒජේ පීරිස් එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරී මෙම ඒකකයේ සිදුකරන ලද සංචාරය වෙනුවෙන් පිරිනමන ලද සම්මාන මුරය සහ විශේෂ අවස්ථා

## 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය



**ලුතිනන් කර්නල්**
**එම්පීසීබී ජයශාන්ත යූඑස්පී**
**අණදෙන නිලධාරී**

මානුෂීය මෙහෙයුමෙහි තීරණාත්මක සන්ධිස්ථානයන්හි පෙරමුණු ගනිමින් ආධාරක බළඇණි ලෙස සංඥා බළකායේ රෙජිමේන්තු කිහිපයක්ම පාබල බලවේගයන්ට උත්පේරණයක් සපයන කාලෙක සංඥා සම්බන්ධතාවයන්හි අඛණ්ඩ පැවැත්ම උදෙසා සංඥා රෙජිමේන්තුවක අවශ්‍යතාවය සපුරාලමින් වර්ෂ 2008 ක් වු ජුලි මස 15 වන දින පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය තුළ බිහිවු 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය නොබෝ දිනකින් සිය අභිමානවත් 13 වන සංවත්සරය සැමරීමට සූදානමින් වඩාත් ගුණාත්මක වු වෘත්තීය හමුදාවක භූමිකාව තහවුරු කර ගැනීම සඳහා විප්ලවීය වු ගමන් මගක නියැලෙමින් සිටියි.

4 වන ඊලාම් යුද්ධය පැවති ඒ සමයේ ත්‍රිවිධ හමුදාව මගින් දියත් කරන ලද වන්නි මානුෂීය මෙහෙයුමේ විශාල කාර්යභාර්යක් ඉටු කළ 58 සේනාංකය වෙත සංඥා සම්බන්ධතාවය ලබාදීම උදෙසා 2008.08.07 වන දින මන්නාරම තල්අඩි ප්‍රදේශයේ ඒකකය ස්ථාන ගත වු අතර, ඉන් පසු 2009.02.05 වන දින පරන්තන් ප්‍රදේශයේද, 2009.04.29 වන දින ඉරණමඩු මංසන්ධියට ආසන්නව එවකට ත්‍රස්ථවාදින්ගෙන් අත්පත් කරගන්නා ලද විනාශවී ගිය ගොඩනැගිලි සහිත ස්ථානයක එනම් වත්මන් කඳවුර පිහිටි ස්ථානයෙහි ස්ථාපනය කරන ලදි, එවකට සංඥා බළකාය තුල කනිෂ්ඨ ඒකකයක් වශයෙන් 2010, 2011, 2012 යන වර්ෂයන්හි අඛණ්ඩව තෙවරක් සහ 2019 වර්ෂයෙදිත් විශිෂ්ඨතම ඒකකය ලෙස තේරීපත් වු මෙම ඒකකය මේජර් ඩීඑම්පීපී දසනායක, ලුතිනන් කර්නල් කේඑඩබ්එස් රත්නායක එන්ඩීයු, ලුතිනන් කර්නල් ඩබ්සී ජයසිංහ පීඑස්සී, ලුතිනන් කර්නල් සීපී අරංගල්ල පීඑස්සී, ලුතිනන් කර්නල් ඒපී වික්‍රමසේකර යූඑස්පි පීඑස්සී, ලුතිනන් කර්නල් පීසීවී ප්‍රනාන්දු, ලුතිනන් කර්නල් පීඩබ්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී, එම්කේජී පෙරේරා ආර්එසිපී යූඑස්පී සහ වර්ථමාන අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්පීසීබී ජයශාන්ත යූඑස්පි ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අණදීම සහ මගපෙන්වීම යටතේ විශිෂ්ඨ ගමන් මගක යෙදෙමින් සිටින අතර පසු ගිය වසරේ ඒකකයේ විශේෂ අවස්ථා මෙසේ පෙළගස්වමි.





2021.01.10 දින යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා සංඥා බළකාධිපති වශයෙන් රාජකාරි ඉටු කරනු ලැබු මේජර් ජෙනරාල් ඩීජිඑන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරයේ විශේෂ අවස්ථා





2020.08.13 දින ආරක්ෂක සේනා මුලස්ථානය (කිලි) ආඥාපති කේඑන්එස් කොටුවේගොඩ එන්ඩීයු අයිජි යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරයේ විශේෂ අවස්ථා




2021.01.16 දින ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් රාජකාරී ඉටු කරනු ලැබූ මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීපීකේ තිලකරත්න පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරයේ විශේෂ අවස්ථා




2021.03.11 දින ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීජේ පීරිස් එන්ඩීයූ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරයේ විශේෂ අවස්ථා






2021.07.15 දින 13 වන සංවත්සරය සැමරීමට සමගාමීව අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්පීසීබී ජයශාන්ත යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අණදීම සහ මගපෙන්වීම යටතේ පැවැති වැඩසටහන් මාලාවේ විශේෂ අවස්ථා

# 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (සන්නිවේදන තාක්‍ෂණ)

10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ හයවන අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් එච්එම්බීඑම්බී හේරත් යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී කටයුතු කරනු ලබන අතර, දෙවන අණදෙන නිලධාරී ලෙස මේජර් ටීටීඑන් මෙන්ඩිස් යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී රාජකාරී සිදුකරනු ලබයි.



ලුතිනන් කර්නල්
එච්එම්බීඑම්බී හේරත් යුඑස්පී
අණදෙන නිලධාරී

ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියලු සන්නිවේදන හා තාක්‍ෂණික අවශ්‍යතාවයන් නොපිරි හෙලා ඉටුකරමින් සුවිශේෂී සේවයක් සපයන 10 වන ශ්‍රී ලංකා සංඥා බළකාය (සන්නිවේදන තාක්‍ෂණ) මෙවර 73 වන නිදහස් දින උත්සවයට සමගාමීව නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේ පැවති නිදහස් දින පෙළපාලියෙහි ජන ඇමතුම් සේවාව මෙම ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයින්ගේ කැපවීම හා උනන්දුව මත සාර්ථකව ඉටුකරනු ලැබු අතර, එම උත්සවය අවසානයේදි සංඥා බළකාය වෙතින් ලබාදුන් සේවය ඇගයීමට ලක් විය.

කොරෝනා වසංගතය වැලැක්වීම සඳහා රට තුල ස්ථාපනය කරනු ලැබු කොවිඩ් -19 පැතිරීම වැලැක්වීමේ ජාතික මධ්‍යස්ථානය රාජගිරිය වෙත සියලුම ජන ඇමතුම් රාජකාරී කිරීමට මෙම ඒකකය වෙත පැවරුනු අතර, එම සේවාවන් ජනඇමතුම් බළඝණයේ කාර්මික සෙනින් විසින් සිදු කරන ලදි.



73 වන නිදහස් පෙළපාලිය සඳහා මෙම ඒකකය ජන ඇමතුම් බළඝණයේ නිලධාරී/සෙසු නිලයින් විසින් තම රාජකාරිය ඉටු කරනු ලබන අවස්ථාව



රාජගිරිය කොරෝනා මධ්‍යස්ථානය තුල පවත්වනු ලබන සාකච්ඡා සඳහා ජන ඇමතුම් බළඝණයේ නිලධාරී හා සෙසුනිලයින් විසින් ජන ඇමතුම් සේවය ලබාදීම



යුද්ධ හමුදා රෝහල - පල්ලකැලේහි නවතමයෙන් ස්ථාපනය කරනු ලබන දිගුවන් 300 කින් සමන්විත ස්වයංක්‍රිය විනිමය පද්ධතිය ස්ථාපනය කිරීම අණදෙන නිලධාරී විසින් නිරීක්‍ෂණය කිරීම



61 සේමු පිහිටි ඇන්ටනා කුළුණ මත සංඥා සම්බන්ධතාවය ලබා දීම සඳහා ඇන්ටනා සවි කිරීම





බන්ධනාගාර වල ආරක්ෂක ක්‍රමවේදයන් දියුණු කිරීම යටතේ  මිගමුව බන්ධනාගාරය තුල ජැමර් යන්ත්‍ර සවි කරන අවස්ථාව




සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය සඳහා ප්‍රධාන පිවිසිමේ දොරටුව නිර්මාණය කිරීම සඳහා දායකත්වය ලබාදුන් අවස්ථාව



වෙසක් කලාපය සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන මඟ පෙන්වීම යටතේ මෙම ඒකකයේ සෙනින් විසින් වෙසක් කූඩුවක් නිර්මාණය කිරීම





2021.04.24 දින ඒකකයේ 6 වන සංවත්සරය වෙනුවෙන් අණදෙන නිලධාරි හට සම්මාන මුරයක් පිරිනැමීම හා සිවිල් සේවක මහතුන් සඳහා ත්‍යාග පිරිනැමු අවස්ථාව



යුදමය කාලය තුල අතුරුදහන් වු කෝප්‍රල් සුනිල් ජයරත්න යන කොනොනිගේ නිවස මෙම ඒකකය විසින් නවිකරණය කර දිම



නව රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස බනි 11 වසන්ත එස්බී යන බලලත් නිලධාරී පත් කිරීම හා වැඩ භාර ගැනිම





2021.05.24 හා 25 යන දිනයන්හිදි ශ්‍රී ලංකා විශේෂ කාර්ය බලකායේ (STF) නිලධාරින් හා සෙසුනිලයින් වෙත සන්නිවේදන උපකරණ පිලිබදව දැනුම ලබාදුන් අවස්ථාව

ක්ෂුද්‍ර තරංග බළඝණයේ කාර්මික සෙනින් විසින් ගොන්ගල පිහිටි ඇන්ටනා කුළුණ මත ඇන්ටනා සවි කරනු ලබන අවස්ථා





2021.09.24 දින අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කරනු ලැබූ ලුතිනන් කර්නල් එඑම්ටී අමරකෝන් පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි නික්මයාම වෙනුවෙන් පිරිනැමු සම්මාන මුරය

2021.09.27 දින මෙම ඒකකයේ අණදෙන නිලධාරි වශයෙන් ලුතිනන් කර්නල් එච්එම්බීඑම්බී හේරත් යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සුබ මොහොතින් රාජකාරි භාරගත් අවස්ථාව






මෙම ඒකකය වෙතින් නිරෝධායන මධ්‍යස්ථානය වශයෙන් පවත්වාගෙන යන ලබන මීගොඩ ධර්මරාජ විද්‍යාලයේ ගොඩනැගිල්ලක වහලය පුර්ණ ලෙස ප්‍රතිසංස්කරණය කල අවස්ථාව

# 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

සංඥා බළකා මාතාවගේ තොරතුරු තාක්ෂණයේ ප්‍රමුඛයා වන මෙම ඒකකය ගතවූ වසරක කාලයක් තුළ වත්මන් අණදෙන නිලධාරි වන ලුතිනන් කර්නල් එස්ඩී කොතලාවල ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මගපෙන්වීම මත තොරතුරු තාක්ෂණයේ මංපෙත් විවර කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටත් අනෙකුත් සහෝදර හමුදාවන්ටත් අවශ්‍ය තොරතුරු තාක්ෂණික සහය ලබා දීම සිදුකරන ලදී.



ලුතිනන් කර්නල්
එස්ඩී කොතලාවල ආර්එස්පී
අණදෙන නිලධාරි

ඒ අනුව කොවිඩ් - 19 වෛරසය මෙරට තුළ සීඝ්‍ර ව්‍යාප්තියත් සමග මුළු මහත් ශ්‍රී ලංකා ද්වීපයම පීඩාවට පත් ව ඇති මෙවන් මොහොතක ඒ වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමන්ගේ සංකල්පයන්ට අනුව යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් ඇරඹි කොවිඩ් - 19 මැඩපැවැත්වීමේ ජාතික ක්‍රියාන්විත මෙහෙයුම් රාජකාරී සඳහා අප ඒකක තොරතුරු තාක්ෂණ ශිල්පීන්ගේ සහාය ලබා දෙමින් ශ්‍රී ලංකා වාසී සියලුම ජනතාව වෙනුවෙන් සිදුකරනු ලබන කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ ප්‍රතිශක්ති එන්නනත්කරණ ක්‍රියා වලිය සඳහා ඒකක අණදෙන නිලධාරීගේ පූර්ණ මගපෙන්වීම යටතේ මෙම ඒකකයට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්/නිලධාරීන් සහ සියළුම සෙසුනිලයින් විසින් පූර්ණ දායකත්වයක් ලබාදී එම භාරදූර කාර්යය මේ වන විටත් ක්‍රියාත්මක කරමින් ඇත.

තවද වර්ෂ 2016 ක් වු සැප්තැම්බර් මස 21 වන දින හදිසි රිය අනතුරක් හේතුවෙන් අප අතරින් වෙන් වු සෙ/283744 සැරයන් කුමාරසිංහ ජේ (මියගිය) යන ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරි මිය යන විට ඔහුටම අයත් නිවසක් නොතිබු බැවින් ඔහුගේ බිරිද සහ දරුවා වෙනුවෙන් සේවා වනිතා ශාඛාව - රෙම ශ්‍රීලංසංබ හා මෙම ඒකකයේ මුලිකත්වයෙන් මහනුවර වත්තේගම ප්‍රදේශයේ නව නිවසක් තනා එම පවුල වෙත භාරදීම 2021.05.29 දිනට යෙදී තිබු සුබ මොහොතින් ප්‍රධාන සංඥා නිලධාරි/ සංඥා බළකාධිපති, සංඥා බළසේනාධිපති, අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ, රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී.

තවද වර්තමානයේ ප්‍රධාන සංඥා නිලධාරි/ සංඥා බළකාධිපතිගේ උපදෙස් මත යුද්ධ හමුදාධිපති සහභාගීවන සුවිශේෂී වැඩසටහන් වලදී සිදුකරනු ලබන දේශණයන් වඩාත් පහසුවෙන් ඉටු කිරීම සඳහා මෙම ඒකක අණදෙන නිලධාරීගේ පූර්ණ මගපෙන්වීම යටතේ Teleprompter යන්ත්‍රයක් මෙම ඒකකය යටතේ ස්ථාපිත පරිගණක වැඩපල තාක්ෂණික ශිල්පීන්ගේ ශිල්පීය දක්ෂතාවයන් උපයෝගී කර ගනිමින් එහි මුලික නිර්මාණ කටයුතු අවසන්වීමෙන් පසු එම යන්ත්‍රයෙහි මුලික නිදර්ශණයන් යුද්ධ හමුදාධිපතිගේ අධීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලද අතර, එය සමස්ථ යුද්ධ හමුදාවේ සියළුම ආයතනයන්ගේ භාවිතය වෙනුවෙන් නිර්මාණය කිරීමට කටයුතු කිරීම සඳහා අවස්ථාව ලබාදීම මෙම වර්ෂය තුළදී අප ඒකකය ලැබූ සුවිශාල ජයග්‍රහණයක් ලෙස පෙන්වා දිය හැක.



2020.10.22 දින මෙම ඒකකයේ අණදෙන නිලධාරි වශයෙන් ලුතිනන් කර්නල් එස්ඩී කොතලාවල ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සුබ මොහොතින් රාජකාරි භාරගත් අවස්ථාව



2021.07.15 දින මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරි වශයන් මේජර් කේඑම්පීජීටීබී කැකුළන්දර ජ්‍යෙෂ්ඨ නිලධාරි සුබ මොහොතින් රාජකාරි භාරගත් අවස්ථාව





මෙම ඒකකයේ දායකත්වයෙන් නවතමයෙන් ඉදිකරන ලද නිවස හදිසි රිය අනතුරක් හේතුවෙන් මියගිය සැරයන් කුමාරසිංහ ජේ යන ජ්‍යෙකොනොනිගේ බිරිඳ වෙත 2021.05.29 දිනට යෙදී තිබූ සුබ මොහොතින් භාරදුන් අවස්ථාව









මෙම ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයින්ගේ දායකත්වයෙන් කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීම වෙනුවෙන් සිදුකරනු ලබන ප්‍රතිශක්ති එන්නත්කරණ වැඩසටහනේ විශේෂ අවස්ථා



2021.03.27 දින නව රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස බනි 11 හේරත් එච්එම්පීජී යන බලලත් නිලධාරී වැඩ භාර ගැනිම



2021.06.25 දින නව සරඹ උපදේශක ලෙස මා/සැරයන් ඇපාසිංහ එන්ඩබ්ඩීඑස්එන් යන ජ්‍යෙකොනොනි වැඩ භාර ගැනිම

## 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (සයිබර් ආරක්ෂණ)



කර්නල්
ඊඑන්පී ගුණවර්ධන යූඑස්පී
අණදෙන නිලධාරී

තාක්ෂණයේ දියුණුවත් සමගම නූතන සයිබර් අවකාශයෙහි අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමේ පරමාර්ථය පෙරදැරි කරගෙන පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි 12 වන සංඥා රෙජිමේන්තුව 2017 ජනවාරි මස 25 වන දින ස්ථාපනය කරන ලදි.

නිලධාරීන් 06 ක් සහ සෙසුනිලයින් 169 සමන්විත මෙම ඒකකයෙහි වත්මන් අණදෙන නිලධාරී ලෙස කර්නල් ඊඑන්පී ගුණවර්ධන යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී කටයුතු කරන අතර, දෙවන අණදෙන නිලධාරී ලෙස මේජර් එම්සී ටුක්කාවඩු ජ්‍යෙෂ්ඨ නිලධාරී ද, බළඝණාධිපතිවරුන් ලෙස මේජර් එම්පීසීඑන් සේනාධීර සහ මේජර් ආර්බීසීඑම්ඩබ්ටීවී අබේවර්ධන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද, රැලිභාර නිලධාරී වශයෙන් කපිතන් ආර්එම්එම්එච් රත්නායක යන නිලධාරිනියද, නියෝජ්‍ය විධායක අධිකාරී ලෙස ලුතිනන් වීකේඑල් බණ්ඩාර යන නිලධාරීද, රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් බනි 11 දිසානායක ඩීඑම්එස් ද, ප්‍රධාන ලිපිකරු වශයෙන් බනි 11 කුමාරසිංහ ඩබ්ඩබ්එන් යන බලලත් නිලධාරීන්ද රාජකාරියෙහි නියුක්තව ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා දත්ත ජාලය සහ පරිගණක පද්ධතීන් වෙත බාහිරින් එල්ලවිය හැකි සයිබර් තර්ජනයන් මැඩපැවැත්වීම සඳහා සුවිශේෂී දායකත්වයක් මෙම ඒකකය විසින් ලබා දෙනු ලබන අතර, ප්‍රධාන සංඥා නිලධාරීගේ සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකගේ මඟපෙන්වීම යටතේ මෙම ඒකක අණදෙන නිලධාරීගේ මෙහයවීම මත සයිබර් ආරක්ෂණ රාජකාරී සාර්ථකව ඉටුකරනු ලැබේ.

මෙම ඒකකය විසින් යුද්ධ හමුදාව තුල සයිබර් ආරක්ෂණය වර්ධනය කිරීම සඳහා පහත දක්වා ඇති පියවරයන් සහ ක්‍රමවේදයන් 2020 සහ 2021 වර්ෂය තුල දී හඳුන්වා දී ඇත.

❒ 2020 වර්ෂය මැද භාගය තුල යුහ විද්‍යුත් තැපැල් ලිපිනයන් වෙත Phishing ප්‍රහාරයන් 1500 කට අධික ප්‍රමාණයක් එල්ල වූ අතර 2020.07.30 දින සිට සයිබර් ප්‍රහාරයන් එල්ල කර හැකි වපසරිය අඩු කිරීම (Reduce the Attack Surface) මගින් එම ප්‍රහාරයන් එල්ලවීම වලක්වා ගැනීමට මෙම ඒකකය විසින් අවැසි ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.

❒ තොරතුරු තාක්ෂණ ඒකකයන්ට අයත් වෘත්තියක් වන පරිගණක ක්‍රියාකරු වෘත්තිය ඇතුළත් කර මෙම ඒකකය නගා සිටුවා තිබූ අතර 2020 වර්ෂය අවසනයේ දී එම වෘත්තිය ඒකක සංස්ථාවෙන් ඉවත්කර සයිබර් ආරක්ෂණ ක්‍රියාකරු විශේෂ ඝණය වෘත්තිය ඒකක සංස්ථාව වෙත ඇතුළත් කර බඳවා ගැනීම් සහ වෘත්තිය පුහුණු කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

❒ යුද්ධ හමුදාව තුල ස්ථාපිත ඉතා වැදගත් සහ සංවේදී තොරතුරු තාක්ෂණ පද්ධතීන් (Critical IT Assets) හඳුනාගැනීම සහ ඒවා වර්ගීකරණය සිදුකර එම ස්ථානයන්හී තොරතුරු තාක්ෂණ ආරක්ෂාව වර්ධනය කිරීමට අවැසි කටයුතු සිදුකරන ලදි. තවද පරිගණක පද්ධතියන්හී ආරක්ෂාව වර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශනයන් හඳුන්වාදීම සහ එම ස්ථානයන්හී තොරතුරු තාක්ෂණ විගණනයන් සිදු කිරීමටද කටයුතු කර ඇත.

❒ 2020 වර්ෂයට පෙර යුද්ධ හමුදාව තුල විවිධ ආයතනයන්හී තොරතුරු තාක්ෂණ විගණනයන් සිදුකර ඇතත් ඒ සඳහා නිසි මාර්ගෝපදේශයක් අදාළ ආයතනයන් වෙත නොමැති වීම හේතුවෙන් තොරතුරු තාක්ෂණ ආරක්ෂාවෙහි දුර්වලතාවයන් පවතින ලදි. එය මගහරවා ගැනීම සඳහා පහත ක්‍රියාවලිය හඳුන්වාදීමට කටයුතු කර ඇත.

❖ සියලුම ආයතනයන් වෙත තොරතුරු තාක්ෂණ අවධානම් තක්සේරුව හඳුන්වාදීම මගින් අවධානම හඳුනාගෙන, එම අවදානම අඩු කිරීමට සැලැස්මක් (Mitigation Plan) සකස් කිරීම.

❖ අවධානම් තක්සේරුව මත පදනම් කරගෙන තොරතුරු තාක්ෂණ හදිසි ආරක්ෂණ සැලැස්මක් හඳුන්වාදීමට කටයුතු කිරීම.

❖ ඉහත ක්‍රියාවලිය නිසි පරිදි සිදුවන බවට සනාථ කරගැනීම සඳහා ආයතන ප්‍රධානි විසින් සෑම කාර්තුවකටම වරක්ම පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තොරතුරු තාක්ෂණ අවධානම අඩුකිරීම සඳහා අවැසි ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට සහතික කර ගැනීම.

❒ තොරතුරු තාක්ෂණ ආරක්ෂණයෙහි ඉතාමත්ම දුර්වලම පුරුක මානවයා වන අතර, යුද්ධ හමුදාව තුල පහත දක්වා ඇති පරිදි නිලධාරීන් සහ සෙසුනිලයන් සඳහා 2020 සහ 2021 වර්ෂයන් තුල දැනුවත් කිරීමේ වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදයන් අනුගමනය කරමින් හා දේශකයන් ආයතන වෙත රපෝර්තු කිරීම මගින් සිදුකර ඇත.

❖ පුහුණු ආයතනයන් 05 ක් තුල සිදුකල දේශනයන් 13 ක් සඳහා නිලධාරී 157 ක් සහ සෙසුනිලයන් 605 ක් සහභාගී වී ඇත.

❖ පහත දක්වා ඇති පරිදි යුහමු, ආසේමු බලප්‍රදේශ තුල ඇති ආයතන සහ රෙජිමේන්තු මධ්‍යස්ථාන ඇතුලු සියලු ආයතනයන් ආවරණය වන පරිදි සයිබර් ආරක්ෂණය පිළිබද දේශණයන් පැවැත්වීම.

- යුහමු ස්ථාපිත ආයතනයන් - 24
- පුහුණු අණසක සහ ඒ යටතේ ඇති පුහුණු පාසල් - 10
- ආසේමු (යාපනය) - 49
- ආසේමු (වන්නි) - 52
- ආසේමු (කිලිනොච්චි) - 35
- ආසේමු (මුලතිව්) - 54
- ආසේමු (බටහිර) - 82
- ආසේමු (නැගෙනහිර) - 47
- රෙජිමේන්තු මධ්‍යස්ථාන - 24
- 57 සේමු යටතේ ඇති ආයතනයන් - 09

❖ 2021 වසර තුල තොරතුරු තාක්ෂණ අවධානම් තක්සේරුව සහ තොරතුරු තාක්ෂණ හදිසි ආරක්ෂණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු තාක්ෂණ ආරක්ෂණය පිළිබදව ආයතනයන්හී වගකීම භාර මාණ්ඩලික නිලධාරී සහ සයිබර් ආරක්ෂණ නිලධාරීගේ දැනුම වර්ධනය කිරීම සදහා පහත දක්වා ඇති පරිදි යුද්ධ හමුදා මුලස්ථානය තුල ස්ථාපිත සියලු ආයතන, ආසේමු බලප්‍රදේශය තුල ඇති ආයතන සහ රෙජිමේන්තු මධ්‍යස්ථාන ඇතුලු සියලු ආයතන ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීමට කටයුතු කර ඇත.

- යුහමු ස්ථාපිත ආයතන - 38
- ආසේමු (යාපනය) - 45
- ආසේමු (වන්නි) - 31
- ආසේමු (කිලිනොච්චි) - 33
- ආසේමු (මුලතිව්) - 38
- ආසේමු (බටහිර) - 72
- ආසේමු (මධ්‍යම) - 19
- ආසේමු (නැගෙනහිර) - 41
- රෙජිමේන්තු මධ්‍යස්ථාන - 24

❒ යුද්ධ හමුදාව තුල ඇති ආයතනයන්හි රාජකාරි ඉටුකරනු ලබන පරිගණක ක්‍රියාකරුවන් විසින් නොසැලකිලිමත්ව කටයුතු කිරීමෙන් සිදුවන සයිබර් ආරක්ෂාව සබැදි දුර්වලතාවයන් හදුනාගැනීම සදහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම මගින් අදාල ආයතනයන්හී තොරතුරු තාක්ෂණ ආරක්ෂණය බිදවැටීම (Compromisations) ගණනින් 660 ප්‍රමාණයක් හදුනා ගන්නා ලද අතර ඒ පිළිබද තොතාඅම දැනුවත් කිරීම මගින් එම දුර්වලතාවයන් මගහැරීමට අවැසි ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කර ඇත.

❒ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් වෙබ් අඩවි සදහා Penetration test සිදුකිරීම මගින් වෙබ් අඩවි සහ මෘදුකාංග යෙදවුම් වල ආරක්ෂාව තහවුරු කිරීම සදහා අවැසි කටයුතු සිදුකිරීම.

❒ මෙම ඒකකය සහ පොලිස් පරිගණක අපරාධ අංශය සමග සම්බන්ධතාව වර්ධනය කිරීම සදහා අවැසි කටයුතු සිදුකරමින් එම ආයතනය සමග සාකච්ඡාවක් සිදුකරන අතර ඉදිරියෙහිදී ආයතනයන් අතර මනා සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කිරීමට අවැසි මුලික කටයුතු සිදුකර ඇත.

කොවිඩ් 19 වසංගත තත්වය පැවතියත් 2020 සහ 2021 වර්ෂයන් තුල සයිබර් ආරක්ෂක ක්‍රියාකරු විශේෂ ඝණය වෘත්තිය සදහා උසස් දැනුමක් සහිත NVQ 3, 4, 5 හා 6 මට්ටම් වලට අයත් සහතිකපත්, ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමාධාරීන් මෙම ඒකකය වෙත පහත පරිදි බදවා ගැනීමට කටයුතු කර ඇත.

- 2020 වර්ෂය සෙසුනිලයන් - 63 (ඩිප්ලෝමාධාරීන් - 01, උසස් සහතිකපත්ලාභීන් - 15)
- 2021 වර්ෂය සෙසුනිලයන් - 90 (උසස් ඩිප්ලෝමාධාරීන් - 08, ඩිප්ලෝමාධාරීන් - 10, උසස් සහතිකපත්ලාභීන් - 53)

උසස් අධ්‍යාපන මට්ටමක් සහ කුසලතාවයන්ගෙන් පිරිපුන් අයවලුන් සෑමවිටම මෙම ඒකකය වෙත බදවාගැනීමට කටයුතු කර ඇති අතර, මෙම ඒකකයට අයත් සෙ/287297 සංසෙ(කා) බණ්ඩාර කේඑඩීබී යන සෙබළිය කෙඩෙට් නිලධාරිනියෙකු ලෙස බැදීම සදහා පවත්වනු ලබන මූලික පරීක්ෂණ වටයෙන් සමත් වී ඇති අතර, ඒ සදහා පැවැත්වෙන දෙවන සම්මුඛ පරීක්ෂණය සදහා සහභාගීවීමට සුදුසුකම් ලබා ඇති බවද සතුටින් දන්වා සිටිනු ලැබේ.

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයට අයත් ආයතන යටතේ රාජකාරී කරන අයවලුන් නිරෝධායන කිරීම සදහා හෝමාගම පරාක්‍රම විද්‍යාලයෙහි නිරෝධායන මධ්‍යස්ථානයක් මෙම ඒකකය වෙතින් පවත්වාගෙන යනු ලබන අතර 2021.05.30 දින සිට මේ දක්වා නිලධාරීන් 14 සහ සෙසුනිලයන් 800 කට අධික ප්‍රමාණයක් නිරෝධායනයට භාජනය කර ඇත. තවද සීමිත භෞතික පිරිස් සහ භෞතික සම්පත් යටතේ වුවද මෙම නිරෝධායන මධ්‍යස්ථානය ඉතා උසස් තත්වයෙන් පවත්වාගෙන යාමට කටයුතු සිදුකර  ඇත.

කොවිඩ් 19 ගෝලීය වසංගත තත්වය මැඩපැවැත්වීම සදහා සිදුකරනු ලබන ප්‍රතිශක්තිකරණ එන්නත්කරන වැඩසටහනෙහි දත්ත ඇතුලත් කිරීමේ රාජකාරී සදහා මෙම ඒකකයෙහි සෙසුනිලයන් 20 දෙනෙකු පමණ දෛනිකව සක්‍රිය දායකත්වයක් ලබාදෙනු ලැබේ. තවද අවශ්‍යතාවය වැඩිවූ අවස්ථාවන්හීදී ඒකකය තුල රාජකාරී කරනු ලැබූ අනෙකුත් භට්පිරිස්ද මෙම වැඩසටහනෙහි දත්ත ඇතුලත් කිරීමේ රාජකාරී සදහා යෙදවීමට කටයුතු කර ඇත.

තවද, ඒකකයෙහි රාජකාරී කරනු ලබන සියලු නිලයන්ගේ සුබසාධන කටයුතු පිලිබදව සොයා බලා ක්‍රියාකිරීම මගින් සෙබලුන්ගේ චිත්ත ධෛර්යය උසස් අන්දමින් පවත්වාගෙන යාමට පිටුවහලක් වී ඇති අතර, එමගින් ඒකකය වෙත පැවරෙන රාජකාරීන් කැපවීමෙන් හා උනන්දුවෙන් ඉටුකිරීම මෙම ඒකකය ලබා ඇති සාර්ථකත්වයට හේතු වී ඇත.

සංඥා බළකායේ නව සාමාජිකයෙකු වශයෙන් යුද්ධ හමුදාවෙහි සහ ශ්‍රී ලංකාවෙහි සයිබර් ආරක්ෂණය වර්ධනය කිරීමේ මෙහෙවරට උරදෙමින් නවීන තාක්ෂණික දැනුමින් සන්නද්ධව සංඥා බළකායෙහි කීර්තිය නංවාලන පෙරගමන්කරුවෙකු ලෙස දීප්තිමත් ඉදිරි ගමනක් යාම ඒකකයෙහි අණදෙන නිලධාරී ඇතුලු නිලධාරීන් සහ සෙසුනිලයන්ගේද ඒකායන අරමුණ වී ඇත.




2021.05.04 දින මෙම ඒකක අණදෙන නිලධාරී විසින් සංඥා පුහුණු පාසල වෙතින් පවත්වන ලද සේවාස්ථ නිලධාරී පාඨමාලා - අංක 08 සදහා සයිබර් ආරක්ෂණය සබැදිව දේශනයක් සිදුකල අවස්ථාව




2021.08.02 දින මෙම ඒකක සයිබර් ආරක්ෂණ බළඝණාධිපති විසින් සේවා බළකා පාසලෙහි ලිපිකරු පාඨමාලාව සදහා සයිබර් ආරක්ෂණය පිලිබද දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීම





2021.08.20 දින මෙම ඒකක දෙවන අණදෙන නිලධාරී විසින් සබුබපුපා වෙතින් පවත්වන ලද පාඨමාලාව සඳහා සයිබර් ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීම



2021.03.29 දින මෙම ඒකක නිලධාරීන් විසින් සංඥා පුහුණු පාසල වෙතින් පවත්වන ලද තරුණ නිලධාරී පාඨමාලා - අංක 17 සඳහා සයිබර් ආරක්ෂණය සබැඳිව දේශනයක් පැවැත්වීම



අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා 12 ශ්‍රීලංසංබ නිලධාරීන් අතර සයිබර් ආරක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම සබැඳිව සිදුකරන ලද සාකච්ඡාව



2021.03.26 දින මෙම ඒකකයේ රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස රාජකාරී කල බනි 1 බීඩබ්එස්ජී මඩවල යන බලලත් නිලධාරී විශ්‍රාම ගැනීම නිමිත්තෙන් අණදෙන නිලධාරී විසින් සමරු ඵලකය ලබාදුන් අවස්ථාව



2021.06.07 දින මෙම ඒකකයේ නව රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් බනි 11 දිසානායක ඩීඑම්එස් යන බලලත් නිලධාරී අණදෙන නිලධාරී වෙතින් යෂ්ඨිය ලබාගත් අවස්ථාව

# සංඥා පුහුණු පාසල

සංඥා රෙජිමේන්තුවට අයත් පුහුණු පාසලක් වශයෙන් පාඨමාලාවන්ට හා අධ්‍යයන කටයුතු වලට මුල්තැන දෙමින් නවීන තාක්ෂණයට අනුකූලව සංඥා බළකායට අයත් නිලධාරීන් හා සෙසුනිලයින් මෙන්ම යුද්ධ හමුදාවේ අනෙකුත් ඒකකයන්ට අයත් නිලධාරී/සෙසුනිලයින්ගේ අභිවෘද්ධිය උදෙසා වාර්ෂික පුහුණු සැලැස්මට අනුකූලව මෙම පුහුණු පාසල වෙතින් විවිධ පාඨමාලාවන් පවත්වනු ලබන අතර, මේ දක්වා නිලධාරී 28 දෙනෙකු සඳහා පාඨමාලාවන් 3 ක් හා සංඥා බළකායට අයත් සෙසුනිලයින් 363 දෙනෙකු සඳහා පාඨමාලා 9 ක්ද වෙනත් ඒකක සෙසුනිලයින් 34 දෙනෙකු සඳහා පාඨමාලා 2 ක්ද මෙම වර්ෂය තුළ පවත්වා ඇත. තවද යුද්ධ හමුදා සාමාජිකයින්ට අමතරව පාසල් දරුවන්ට හා විවිධ ආයතනයන්හි කාර්යමණ්ඩලයන් සඳහා මෙම පුහුණු පාසැල වෙතින් න්‍යයාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුළින් ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ නායකත්ව පුහුණු වැඩමුළු හා පාඨමාලාවන් පවත්වන ලදි.



කර්නල්
එස්ජේකේඩී ජයවර්ධන
යූඑස්පී පීඑස්සී
සේනාවිධායක

දැනට දිවයිනෙහි ව්‍යාප්තව පවතින කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා මහනුවර ප්‍රදේශය ආවරණය වන පරිදි එන්නත් කිරීමේ වැඩසටහන් සඳහා භට පිරිස් යොදවමින් සෘජු දායකත්වයක් ලබා දෙනු ලබන අතර, 11 පාබල බසේමු යටතේ ඇති මාර්ග බාධක රාජකාරී හා අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී ඉටුකිරීමට හා නිරෝධායන මධ්‍යස්ථානයන්හි පාලන රාජකාරී සඳහාද භටපිරිස් යොදවා මෙම පුහුණු පාසලේ දායකත්වය ලබාදෙන ලදී. එමෙන්ම කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය සමග ඇතිවූ හදිසි තත්වය මත ආහාර හිඟයට පිළියමක් වශයෙන් මෙම පුහුණු පාසල් භූමියෙහි ආහාර භෝග හා එළවලු වර්ග වගා කිරීමට කටයුතු කරනු ලබන අතර රජය විසින් ආරම්භ කර ඇති කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියට සමගාමීව මෙම පුහුණු පාසල විසින්ද කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇත.

සේනාවිධායකගේ හා ප්‍රධාන උපදේශකගේ මගපෙන්වීම යටතේ සංඥා පුහුණු පාසලෙහි මෙතෙක් අඩුපාඩුවක්ව පැවති පුහුණු පාසල් බලලත් නිලධාරී නේවාසිකාගාරයක් නවතමයෙන් ඉදිකරන ලදී. එමෙන්ම පාඨමාලා හදාරනු ලබන නිලධාරී හා සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය සඳහා අභිනව සම්මන්ත්‍රණ ශාලාවක් මෙම පුහුණු පාසලේ සියලු සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකර ඇති අතර පුහුණු පාසල් සරඹ භූමියෙහි බුද්ධ මන්දිරය ඉදිකර ඇති ස්ථානයට යාබදව වන්දනාමාන කිරීම සඳහා හිඳි පිළිම වහන්සේ නමක් ඉදිකර ඇත. තවද මෙම පුහුණු පාසලෙහි රාජකාරී කරනු ලබන සෙසුනිලයින්ගේ මෙන්ම පාඨමාලා/ වැඩමුළු සඳහා සහභාගී වන සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් පහත සඳහන් ප්‍රතිසංස්කරණ කටයුතු හා ඉදිරිකිරම් කටයුතු සිදුකර ඇත.

- ❒ භට නිවාස ප්‍රතිසංස්කරණය කිරීම
- ❒ වැසිකිලි පද්ධති හා නාන කාමර අලුත්වැඩියා කිරීම
- ❒ මුළුතැන්ගෙය අලුත්වැඩියා කිරීම
- ❒ දේශණ ශාලා ඉදිකිරීම
- ❒ මුද්‍රණ අංශයක් පවත්වාගෙන යාම
- ❒ කරණවෑම්හල ඉදිකිරීම
- ❒ කායවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීම

තාක්ෂණික දියුණුවත් සමග නවින තොරතුරු තාක්ෂණික උපකරණ ලොව පුරා ඉතා අධික ලෙස භාවිතා කරමින් සිටින අවධියක ඉන් ඇති වියහැකි ත්‍රස්තවාදි ප්‍රහාරයන් සහ අනෙකුත් අක්‍රමිකතා මැඩපැවත්විම සඳහා භටපිරිස් සූදානම් කිරීමේ අරමුණින් සයිබර් ආරක්ෂාව පිළිබඳව පාඨමාලාවන් මේ වන විටත් මෙම පාසල වෙතින් පවත්වා ඇති අතර, ඉන් නොනැවති සංඥා බළකායේ රාජකාරීන්හි නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් නවීන තාක්ෂණයෙන් පිරිපුන් පිරිසක් බවට පත් කිරීමේ අරමුණින් නවතමයෙන් හඳුන්වාදෙන ලද වීඩියෝ සංස්කරණය හා නිර්මාණකරණය පිළිබඳ පාඨමාලාවක් සහ සීසීටීවී පද්ධති සහ ජාලකරණය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවන් මේ වන විට පැවැත්වෙන බැව් ඉතා සතුටින් දන්වා සිටිමි. මීට අමතරව ජ්‍යකොනොනි සඳහා සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක් මේ වසර අගදී ආරම්භ කිරීමට නියමිතව ඇත.

මීට අමතරව සංඥා පුහුණු පාසල වෙතින් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේදය මගින් ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලබන බැවින් පාඨමාලාවන් සඳහා පැමිණෙන නිලධාරී/ සෙනීන්ගේ ඉගෙන ගැනීමේ පහසුව සඳහා ඉගෙනුම් කළමණාකරන පද්ධතියක් (Learning Management System- LMS) නමින් වෙබ් අඩවියක් ආරම්භ කර ඇති බැව් දන්වා සිටිමි.

තවද සංඥා සෙබළුන්හට හා යුද්ධ හමුදා සාමාජිකයන් සඳහා භූගෝලීය පද්ධති පිළිබඳව (GIS) ඉගැන්වීම් සඳහා පාඨමාලාවක් ආරම්භකර ඇති අතර එහි මූලික අධියර වශයෙන් සංඥා බළකා නිලධාරී/ සෙනීන් සඳහා කෙටිකාලීන පාඨමාලාවක් මෙම පුපා වෙතින් පවත්වන ලදි. මීට අමතරව (සංඥා බලකාධිපතිගේ සංකල්පයට අනුව) රට පුරා සියලු ආසේමු ආවරණය වන පරිදි භූගෝලීය පද්ධති පිළිබඳව පුහුණු වැඩමුලුවක් පවත්වන ලදි. එහි වැඩිදුර ඉගැන්වීමේ කටයුතු සඳහා භූගෝලිය පද්ධති විද්‍යාගාරයක්ද නවතමයෙන් ඉදිකරමින් පවතින බව දන්වා සිටිමි. මීට අමතරව පහත දක්වා ඇති කෙටිකාලීන පාඨමාලාවන් මෙම පුහුණු පාසල වෙතින් නවතමයෙන් ආරම්භකර පවත්වාගෙන යනු ලබයි.

- ❒ සයිබර් ආරක්ෂාව
- ❒ පරිගණක ජාලගත කිරිම
- ❒ ග්‍රැෆික් නිර්මාණකරණය සහ වීඩියෝ සංස්කරණ පාඨමාලා
- ❒ ජීඅයිඑස් පාඨමාලා
- ❒ සිසීටීවී කැමරා පාඨමාලා
- ❒ ප්‍රකාශ තන්තු පාඨමාලා

සංඥා බළකාධිපති විසින් 2021 පෙබරවාරි මස 13 දින කඳවුරු සංචාරයක් සඳහා මෙම පුහුණු පාසල වෙත පැමිණි අතර, ඊට සමගාමීව සම්මාන මුරය, පැවැත්වූ අතර භටපිරිස් ඇමතීමෙන් අනතුරුව හා තේපැන් සංග්‍රහයක්ද පවත්වන ලදි.









2021.02.13 දින ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීජ්ජේ පීරිස් එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම පුහුණු පාසල සංචාරයේ විශේෂ අවස්ථා





සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිත්තෙන් මෙම පුහුණු පාසලේ සිදුකරන ලද අලුත් අවුරුදු උත්සවයේ විශේෂ අවස්ථා





2021.05.26 දින වෙසක් පොහෝ දිනය නිමිත්තෙන් මෙම පුහුණු පාසලේ සිදුකරන ලද ආගමික වැඩසටහන





2021.02.01 දින නව පුහුණු පාසල් බලලත් නිලධාරී වශයෙන් ඔනි 1 ජේඑම්ආර් ජයසිංහ යන බලලත් නිලධාරී සේනාවිධායකගේ සුරතින් යෂ්ඨිය ලබාගත් අවස්ථාව

2021.01.19 දින නව කරණවෑම්හල සේනාවිධායකගේ සුරතින් විවෘත කරන ලද අවස්ථාව






2021.04.05 දින නවතමයෙන් ඉදිකරන ලද දේශන ශාලාව සුබ මොහොතින් සේනාවිධායක සුරතින් විවෘත කල අවස්ථාව





කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්තිය හේතුවෙන් මහනුවර නගරයේ අසරණ යාචකයින් සදහා දිවා ආහාර පාර්සල් බෙදා දීම





2021.08.02 දින නවතමයෙන් ඉදිකරන ලද පුහුණු පාසල් බලලත් නිලධාරී නිවස්නය සුබ මොහොතින් සේනාවිධායක සුරතින් විවෘත කල අවස්ථාව



අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද නිලධාරී නිවස්න සලාක ගබඩාව



අලුත්වැඩියා කටයුතු සිදුකරන ලද ප්‍රධාන මුලුතැන්ගෙය සලාක ගබඩාව





නවතමයෙන් ඉදිකරන ලද දෙමහල් නිලධාරී නිවස්නය





මෙම පුහුණු පාසල තුල නවතමයෙන් ඉදිකරන ලද හිඳි පිළිම වහන්සේ





නවීන තාක්ෂණික විද්‍යාගාරයේ වහලය අලුත්වැඩියා කටයුතු සිදුකිරීම



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද වෙනත් ඒකක සංඥා පාඨමාලා අංක 171 සඳහා සේනාවිධායක විසින් නායකත්වය පිළිබඳ දේශන සිදුකිරීම



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද සීසීටීවී පාඨමාලා අංක 01 හි පුහුණු කටයුතු සිදුකරන අවස්ථාව



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද සේවාස්ථ නිලධාරී පාඨමාලා අංක 8 හී පුහුණු කටයුතු සිදුකරන අවස්ථාව



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද තරුණ සංඥා නිලධාරී පාඨමාලා 17 හි  පුහුණු කටයුතු සිදුකරන අවස්ථාව



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද විශේෂ බලකා සෙනීන් සඳහා වන සංඥා පාඨමාලා අංක 04 හි පුහුණු කටයුතු  සිදුකිරීම



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද සයිබර් ආරක්ෂාව පිළිබඳ පාඨමාලා අංක 01 හි පුහුණු කටයුතු සිදුකිරීම



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස්කිරීමේ පාඨමාලා අංක 67 හි පුහුණු කටයුතු සිදුකිරීම



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස්කිරීමේ පාඨමාලා අංක 68 හි රාත්‍රී භෝජන සංග්‍රහය පැවැත්වූ අවස්ථාව



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද පරිගණක පාඨමාලා අංක 60 හි පුහුණු කටයුතු සිදුකිරීම



මෙම පුහුණු පාසල මගින් පවත්වන ලද වීඩියෝ සංස්කරණ සහ ග්‍රැෆික් නිර්මාණකරණ පාඨමාලා අංක 01 හි පුහුණු කටයුතු සිදුකිරීම

## පුහුණු පාඨමාලාවන්

| අ/අ | පාඨමාලාව | කාලසීමාව | සහභාගි වු සිසුන් ගණන | පාඨමාලාවේ විශිෂ්ටතම ශිෂ්‍යයා/ශිෂ්‍යාව |
|---|---|---|---|---|
| 1 | සංඥා සේවාස්ථ පාඨමාලාව අංක 8 (MCC) | 2021.04.27 දින සිට 2021.05.29 දක්වා | 6 | මේජර් එච් සී පාගොඩආරච්චි පීඑස්සී |
| 2 | තරුණ සංඥා නිලධාරී පාඨමාලාව අංක 17 (YOC) | 2021.01.08 දින සිට 2021.04.08 දක්වා | 15 | දෙවන ලුතිතන් ආර් එම් සී නිලුෂාන් |
| 3 | කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 67 | 2021.02.08 දින සිට 2021.03.10 දක්වා | 98 | කෝප්‍රල් අසංක ඒ එස් එච් |
| 4 | කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාව අංක 68 | 2021.09.01 දින සිට 2021.10.05 දක්වා | 53 | කෝප්‍රල් ඕවිටියාවත්ත එන්ර් |
| 5 | වෘත්තිය පරීක්ෂණ 1 ශ්‍රේණියේ පාඨමාලාව - සංඥා අංශය | 2021.03.12 දින සිට 2021.03.31 දක්වා | 29 | කෝප්‍රල් හේරත් එච් එම් බි පී එබි පී |
| | වෘත්තිය පරීක්ෂණ 1 ශ්‍රේණියේ පාඨමාලාව - තොරතුරු තාක්ෂණ අංශය | | | කෝප්‍රල් ඒකනායක ඊ එම් සී යු බී |
| 6 | වෘත්තිය පරීක්ෂණ 11 ශ්‍රේණියේ පාඨමාලාව | 2021.02.22 දින සිට 2021.03.12 දක්වා | 11 | ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එච් ඩි වී සී |
| 7 | වෘත්තිය පරීක්ෂණ 11 ශ්‍රේණියේ පාඨමාලාව - සංඥා අංශය | 2021.08.09 දින සිට 2021.08.19 දක්වා | 30 | ලාන්ස් කෝප්‍රල් සෙනෙවිරත්න එල් ආර් එස් ඩබ් කේ |
| | වෘත්තිය පරීක්ෂණ 1 ශ්‍රේණියේ පාඨමාලාව තොරතුරු තාක්ෂණ අංශය | | | ලාන්ස් කෝප්‍රල් අබේසිංහ ඩී කේ පී එම් එම් කේ |
| 7 | මූලික සංඥා පාඨමාලාව අංක 121 | 2020.11.23 දින සිට 2019.01.21 දක්වා | 76 | ආධුනික කාන්තා සෙබළ ධර්මපාල පී පී එස් එම් |
| 8 | මූලික සංඥා පාඨමාලාව අංක 122 | 2021.03.12 දින සිට 2021.05.13 දක්වා | 88 | ආධුනික කාන්තා සෙබළ මධුභාෂිණී ආර් අයි යු |
| 9 | මූලික සංඥා පාඨමාලාව අංක 123 | 2021.06.28 දින සිට 2021.08.16 දක්වා | 79 | ආධුනික සෙබළ රාජපක්ෂ ආර් ටී පී |
| 10 | පරිගණක පාඨමාලාව අංක 50 | 2021.01.06 දින සිට 2021.01.25 දක්වා | 25 | සැරයන් පුෂ්ප කුමාර ජේ එම් සී |
| 11 | ඉංග්‍රීසි භාෂා පාඨමාලාව අංක 01 | 2021.04.29 දින සිට 2021.06.14 දක්වා | 11 | මාණ්ඩලික සැරයන් දුමින්ද එම් ඒ එන් |
| 12 | මූලික භූගෝලීය තොරතුරු පද්ධති පාඨමාලාව අංක 01 | 2021.05.10 දින සිට 2021.05.22 දක්වා | 07x15 | |
| 13 | වෙනත් ඒකක සංඥා පාඨමාලාව අංක 171 | 2021.01.11 දින සිට 2021.02.24 දක්වා | 11 | සැරයන් යාපාරත්න වයි එම් ඒ කේ |
| 14 | විශේෂ බලකා සෙනීන් සඳහා වන සංඥා පාඨමාලා අංක 04 | 2021.05.20 දින සිට 2021.07.03 දක්වා | 23 | කෝප්‍රල් ජයරත්න එස් පී එම් |

# 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (ස්වෙච්ඡා)



ලුතිනන් කර්නල්
බීජී උඩගේ යූඑස්පී
අණදෙන නිලධාරී

2021 වර්ෂය ආරම්භවීමත් සමගම ගතවී ඇති කාලසීමාව දෙස හැරිබැලීමේදී සංඥා බළකා මාතාවගේ එකම ස්වේච්ඡා සාමාජිකයා වන මෙම ඒකකය සංඥා බළකායේ ඒකකයක් ලෙස විශිෂ්ඨත්වයට රැගෙනයාමේ මහගු අභියෝගයට මුහුණදීමට හැකිවන පරිදි වත්මන් අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් බීජී උඩගේ යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මගපෙන්වීම මත ආසේමු (නැගෙනහිර) බලප්‍රදේශය තුල සංඥා සම්බන්ධතා ක්‍රමවත්ව පවත්වා ගනිමින් කටයුතු කරනු ලබයි. ගෙවු කාලය තුල ඒකකය පැමිණි අභිමානවත් ගමනේ මතක සටහන් අතර, 2020 වර්ෂයට අදාලව සංඥා රෙජිමේන්තුව විසින් සංවිධානය කරන ලද අන්තර් සංඥා ඒකක සරඹ තරගාවලිය තුලදී අනෙකුත් සියලුම සංඥා ඒකක අභිබවා ප්‍රථම ස්ථානය දිනාගැනිම මෙම ඒකකය ලැබූ විශේෂ ජයග්‍රහණයක් ලෙස පෙන්වාදිය හැකිය.

එතෙකින් නොනැවතුණු මෙම ඒකකය ලුතිනන් කර්නල් ඒඑ්ටී සෝමරත්න යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මගපෙන්වීම මත සියළු නිලධාරීන්ගේ අධීක්ෂණයෙන් 2020 වසරේ හොදම සංඥා ඒකකය ලෙස තේරී පත්වීම ඒකකය දිනාගත් සුවිශේෂ ජයග්‍රහණයක් ලෙස හැදින්විය හැක.

තවද ඒකක භටපිරිස් තවත් ධෛර්යමත් කරමින් එක් දෙයකට විශේෂීකරණය නොවී ක්‍රීඩා කුසලතාවයන්ගෙන් හෙබි භටපිරිස් ක්‍රීඩාව වෙත යොමුකරමින් 2019 වර්ෂයේ නේපාලයේ කත්මන්ඩු නුවර පැවති 13 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ මළල ක්‍රීඩා ඉසව් සඳහා සහභාගිවූ මෙම ඒකකයට අයත් ක්‍රීඩිකාවන් ලක් මාතාව රනින් හා රිදියෙන් බබළවමින් සමස්ත යුද්ධ හමුදාවටත් සංඥා බළකායටත් අභිමානයක් එක්කරන ලදි. එමෙන්ම සංඥා බළකා අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා තරගාවලිය තුළ කැපීපෙනෙන ක්‍රීඩා කෞෂල්‍යක් විදහා පෙන්වමින් මළල ක්‍රීඩා, බැට්මින්ටන්, රගර්, කඹඇදීම, කැරම්, ක්‍රිකට්, වුෂු, වෙරළ අත්පන්දු, චෙස්, එල්ලේ, අත්පන්දු සහ බර ඉසිලීම යන ක්‍රීඩා තරග තුළදී ඒකකය ලත් ජයග්‍රහණයන් 2019 වර්ෂයේ අප ඒකකය ලද ජයග්‍රහණයන් ලෙස පෙන්වාදිය හැකිය.

2019 අභ්‍යාස අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ ආරක්ෂක සේනා නැගෙනහිර බලප්‍රදේශයේ මින්නේරිය, ත්‍රිකුණාමලය සහ ලංකා පටුන ප්‍රදේශය කේන්ද්‍ර කොට ගෙන 2019 සැප්තැම්බර් මස 03 දින සිට 27 දින දක්වා දෙස් විදෙස් හමුදා සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද දියකාවා යුධ අභ්‍යාසයට අවශ්‍ය තාක්ෂණ උපකරණ, රේඩියෝ සම්බන්ධතාවයන් හා උපකරණ, දුරකථන සම්බන්ධතා උපකරණ, විදුලි ජනක උපකරණ හා විදුලි බල සැපයුම්, ක්‍රියාන්විත මැදිරි ඉදිකිරීම ආදී අභ්‍යාසයේ සියලුම සංඥා සම්බන්ධතාවයන් මෙම ඒකකය වෙතින් ඉටුකරන ලදි.

රට තුළ පැතිරෙමින් පවතින අනපේක්ෂිත කොවිඩ් 19 වෛරස් තත්වය ව්‍යාප්තවීම මැඩපැවැත්වීමේ අරමුණින් නැගෙනහිර ප්‍රදේශයේ පුනානි, දම්මින්න, ගල්කන්ද, කන්දකාඩු, වැලිකන්ද රෝහල සහ කටුකැලියාව යන ස්ථානයන්හි ස්ථාපිත නිරෝධායන මධ්‍යස්ථානයන්හී සංඥා රාජකාරීන් සඳහා අවැසි සංඥා උපකරණ සමගින් නිලධාරීන්/ සෙසුනිලයින් යෙදවීම මෙන්ම අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී සඳහා භටපිරිස් යෙදවීම මගින් රට තුළ ඇතිවූ ව්‍යසනකාරී තත්වය මැඩපැවැත්වීමට සක්‍රීය දායකත්වයක් ලබාදෙන ලදි

තවද ඒකක ක්‍රියාකාරකම් දෙස හැරිබැලීමේදී 2020.04.25 දිනට යෙදී තිබූ මෙම ඒකක 40 වන සංවත්සර උත්සවය රට තුළ පැතිරෙමින් පවතින අනපේක්ෂිත වසංගත තත්වය හේතුවෙන් චාම් අන්දමින් සමරන ලද අතර, ඒකක සංවත්සර උත්සවයට සමගාමීව සතුරා සමග උරෙන් උර ගැටී යුද්ධයේදී මියගිය/ රණකෂිතයට පත්ව ඇති සහ දැනට රාජකාරියේ නියුතු මෙම ඒකක සියලුම රණවිරුවන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් වසංගත තත්වයට ගොදුරුවී රෝහල් ගතවී ඇති සියලු දෙනාටත් රට වැසියන්ට මෙන්ම ලෝකවාසී ජනතාවට සෙත් ප්‍රාර්ථනා කරමින් නිරෝධායන නීතිරීති වලට යටත්ව නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගි වී බෝධි පූජා පිංකමක්ද පවත්වන ලදි.

එසේම මෙම ඒකක ඉතිහාසයේ නව සන්දිස්ථානයක් සනිටුහන් කරමින් ආරක්ෂක සේනා මූලස්ථානය(නැ) - වැලිකන්ද කඳවුරු පරිශ්‍රයේ ස්ථානගතව සිටි මෙම ඒකකය ක්‍රියාඅම උපදෙස් පරිදි 5(සෙවි) ශ්‍රීලයුකාබ ඒකකය අතර, ඒකක ප්‍රතිස්ථානගත කිරීම යටතේ 2020.08.15 වන දින 5(සෙවි) ශ්‍රීලයුකාබ ඒකකය ස්ථානගතව සිටි දළුකාන කඳවුරු භූමියේ ස්ථානගත වන ලදි.

ඒ අනුව දළුකාන කඳවුරු භූමියේ ස්ථානගත වීමෙන් අනතුරුව නිලධාරී/ සෙසුනිලයින්ගේ ප්‍රමාණයට සරිලන පරිදි සනිපාරක්ෂක අවශ්‍යතාවයන් සඳහා අවැසි වැසිකිලි පද්ධති නවතමයෙන් ඉදිකිරීම, නිලධාරී නිවස්නය නවීකරණය කර ඉදිකිරීම සහ බලලත් නිලධාරී සහ සැරයන් නිවස්නය නවීකරණය කිරීම, කොනොනි සමාජ ශාලාවේ අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සහ නේවාසික පහසුකම් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම වැනි දැවැන්ත සංවර්ධන කාර්යයන් ආරම්භ කරන ලදි. එමෙන්ම නවතමයෙන් සරඹ භූමියක් ඉදිකිරීම සහ සම්මාන මුර පීඨිකාවක් ඉදිකිරීම ඒ අතර, ප්‍රමුඛස්ථානයක් ගනී.

තවද, කඳවුරු භූමියේ ඇති මංමාවත් සංවර්ධනය කිරීම කඳවුරේ අලංකාරය වෙනුවෙන් ප්‍රධාන දොරටුව අසල සෙබළ මූර්තියක් ඉදිකිරීම, සුබසාධක වෙළඳසැල වැඩිදියුණු කිරීම, මෙන්ම ඒකකයේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් නර්ථන කණ්ඩායමක්, ජායාරූප ක්‍රියාකරු සහ ගොවිපල ගිණුමක් ආරම්භ කරන ලදි.

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයට අයත් මෙම ඒකකය යටතේ පාලන කටයුතු සිදුකරනු ලබන මීරිදිය පවන නිවාඩු නිකේතනය නවීකරණය කර ඉදිකිරීම වෙනුවෙන් ඒකක නිලධාරී/ සෙසුනිලයින්ගේ ශ්‍රමදායකත්වය ලබාදෙමින්, සුඛෝපභෝගී නිවාඩු නිකේතනයක් ඉදිකර යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් 2021 ජනවාරි මස 10 දින විවෘත කරන ලදි.

එසේම 2021 වසර පැවති අන්තර් සංඥා ඒකක සරඹ තරගාවලියේදි දක්ෂතම බණ්ඩාගාර නිලධාරී, දක්ෂතම සරඹ උපදේශක තෙවන ස්ථානය සහ දක්ෂතම සරඹ කණ්ඩායම දෙවන ස්ථානය වශයෙන් සම්මාන දිනාගනිමින් 2021 වසරේ සංඥා ඒකක අභිබවා සරඹ තරගාවලියේ අනු ශූරතාවය දිනාගන්නා ලදි.

පසුගිය කාල වකවානුව දෙස ආපසු හැරී බැලීමේදී ඉතා කෙටිකලක් තුළ ඒකකය ලබා ඇති ප්‍රගතිය ඒකකය සීඝ්‍ර දියුණුවක් කරා යාමට ඇවැසි මංපෙත් විවර කිරීම සඳහා ඒකක නිලධාරී/ සෙසුනිලයින්ගෙන් ලැබුණු සහයෝගය ඉතා අගනේය.





2021.01.03 දින ජ්‍යෙෂ්ඨ කර්නල් සම්බන්ධීකරන ස්වේච්ඡා කටයුතු ආසේමු (නැ) කර්නල් ඒආර් ඔබේසේකර යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මෙම ඒකක සංචාරයේ විශේෂ අවස්ථා









2021.01.09 දින නවතමයෙන් ඉදිවූ මීරිදියපවන නිවාඩු නිකේතනය යුද්ධ හමුදාධිපතිගේ සුරතින් විවෘත කරනු ලැබූ අවස්ථාව




2021.01.09 දින යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා සංඥා බළකාධිපති වශයෙන් රාජකාරී ඉටු කරනු ලැබූ මේජර් ජෙනරාල් ඩීඑම්පීඑන් දෙමටන්පිටිය එන්ඩියු පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මෙම ඒකක සංචාරයේ විශේෂ අවස්ථා




2021.03.13 දින නවීකරණය කරන ලද මෙම ඒකකයේ නිලධාරී නිවස්නය අණදෙන නිලධාරීගේ සුරතින් විවෘත කරනු ලැබූ අවස්ථාව




අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී කරනු ලැබූ ලුතිනන් කර්නල් එඑටී සෝමරත්න යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී නික්මයාම වෙනුවෙන් පවත්වනු ලැබූ උත්සවයේ විශේෂ අවස්ථා




2021.03.19 දින මෙම ඒකකයේ 10 වන අණදෙන නිලධාරී වශයෙන් ලුතිනන් කර්නල් බීපී උඩගේ යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී භාරගත් අවස්ථාව

# විද්‍යුත් සංග්‍රාමික බළඝණය

විද්‍යුත් සංග්‍රාමික බළඝණයේ ඉතිහාසය 90 දශකය තෙක් දිවෙන අතර, පළමු විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාන්විතය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, නාවික හමුදාව හා ගුවන් හමුදාව සමගින් ඒකාබද්ධව සිදුකරන ලදි. එහිදී ශ්‍රී ලංකා සංඥා බළකායේ එවකට කපිතන් එන්එම් හෙට්ටිආරච්චි පළමු නිලධාරී අණදෙන වශයෙන් කටයුතු කරමින් 10 දෙනෙකුගෙන් සමන්විත විද්‍යුත් සංග්‍රාමික භට පිරිස් සමගින් 1990.07.08 දින රණසේවාපුර අනුරාධපුර පිහිටි ගුවන් විදුලි සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක විද්‍යුත් සංග්‍රාමික රාජකාරීන් සිදුකිරීම සඳහා ස්ථානගත වන ලදි. සංඥා බළසේනාධිපති වශයෙන් රාජකාරී කරමින් සිටි බ්‍රිගේඩියර් ෆ්‍රැන්ක් සිල්වා ජ්‍යේෂ්ඨ නිලධාරී දිශා සොයාගැනිමේ ක්‍රමවේදය ප්‍රථමයෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත හඳුන්වාදුන් අතර දිශා සොයාගැනිමේ යන්ත්‍ර ක්‍රියාන්විත අවශ්‍යතාවයන් සඳහා ස්ථානගත කිරීම බ්‍රිගේඩියර් කේඒ ඥාණවීර ජ්‍යේෂ්ඨ නිලධාරී විසින් සිදු කරන ලදි.

වර්තමානයේදී විද්‍යුත් සංග්‍රාමික බළඝණය සංඥා බළසේනා මුලස්ථාන පරිශ්‍රය පනාගොඩහි ස්ථානගතව ඇති අතර, දිශා සොයාගැනිම අණුබන්ධ 10ක් සහ රේඩාර් අණුබන්ධ 07ක් විද්‍යුත් සංග්‍රාමික බළඝණය යටතේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි නිරීක්ෂන කටයුතු සඳහා ස්ථානගත කර ඇත. එබැවින් මෙම බළඝණය මගින් ස්ථානගත කර ඇති රේඩාර් අණුබණ්ඩ ශ්‍රී ලංකා මුහුදු සීමාව නිරීක්ෂණයන් තුළින් ගොඩබිම දෙසට මත්ද්‍රව්‍ය හා අනවසරයෙන් ඇතුළුවන පුද්ගලයින් පිළිබඳ තොරතුරු ලබාදිමෙන් ජාතික ආරක්ෂාවට මහත් දායකත්වයක් ලබාදෙන බව මෙහිදී සඳහන් කළ යුතුය. එසේම ක්‍රියාන්විත රාජකාරීන්ට අමතරව විද්‍යුත් සංග්‍රාමික බළඝණයෙහි පූර්ණ අධීක්ෂණය යටතේ විද්‍යුත් සංග්‍රාමික දැනුම වර්ධනය කිරීම සඳහා සංඥා පාසල සහ විද්සංබ (පනාගොඩ) වෙතින් පාඨමාලාවන් හා වැඩමුළු රාශියක් සංඥා ඒකක සෙනින් සහ වෙනත් ඒකක සෙනින්ගේ සහභාගිත්වයෙන් යුතුව සිදු කරමින් පවතී.









මුහුදු නිරීක්ෂණ රාජකාරී හා දිශා සොයාගැනීමේ රාජකාරී සිදුකරනු ලබන අවස්ථාව

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා සංගමය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 1976 වසරේ 8 වන පනතට අනුව ස්ථාපිත ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ අනුබද්ධ සංගම් 47 න් 4 වන ස්ථානයේ සිටින 1955 දෙසැම්බර් මස 15 වන දින ආරම්භ කරන්නට යෙදුණු යුද්ධ හමුදා සංඥා සංගමය ස්වෙච්ඡා නිලධාරීන් හා සාමාජිකයින් 25 දෙනෙකුගෙන් පමණ සමන්විත වුනු අතර, ඔවුන්ගේ මූලික අරමුණ වූයේ විශ්‍රාමයාමෙන් පසු සියලු දෙනා එකමුතුව සාමාජිකයින් අතර සුහදතාව, සහජීවනය, සාමූහිකත්වය හා සුබසාධනය වර්ධනය කිරීමයි.

අභිමානවත් ලෙස වසර 66 ක කාලයක් ඉදිරියට පැමිණ ඇති යුද්ධ හමුදා සංඥා සංගමය 2012 වසර වන විට ස්වෙච්ඡා හා නිත්‍ය සාමාජිකයින් 824 දෙනෙකුගෙන් සමන්විත විය. එම 824 තුළින් වැඩි කොටසක් විදේශගතව සිටි අතර ලක්දෙරණ තුළ ජීවත් වූයේ ඉතාමත් ස්වල්ප දෙනෙකි. එම පිරිස 150 දෙනෙකුගෙන් අඩු පිරිසක් වූ අතර, මහ සභා රැස්වීමකට සහභාගි වූයේ 50 දෙනෙකු හෝ 25 දෙනෙකු පමණි.

2012 අප්‍රේල් 04 දින වන විට එවකට සංඥා බළකාධිපති වූ මේජර් ජෙනරාල් ඒ පී ද ඉසෙඩ් අබේසේකර (විශ්‍රාමික) වීඑස්වී යූඑස්පී උපදෙස් මත සංඥා ඒකකයන්ගෙන් විශ්‍රාම ලබන සියලු සාමාජිකයින් යුද්ධ හමුදා සංඥා සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා යොමු කරන ලදි. මේජර් ජෙනරාල් එස් ඒ පී පී සමරසිංහ (විශ්‍රාමික) ආර්එස්පී වීඑස්වී පීඑස්සී, මේජර් ජෙනරාල් කේ ආර් පී රොවෙල් (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී හා මේජර් ජෙනරාල් බී එච් එම් ඒ විජේසිංහ (විශ්‍රාමික) වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී යන බළකාධිපතිවරුන්ගේ උපදෙස් යටතේ අද වන විට සාමාජික සංඛ්‍යාව 2540 දක්වා වැඩිවී ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා සංගමයට බැඳෙන සියලු සාමාජිකයින්හට ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සාමාජිකත්වය ලබාදෙන අතර, අනුබද්ධ සංගම් 47 කින් සමන්විත වන සාමාජිකයින් 600,000ක් පමණ ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගෙන් සමන්විත සාමාජිකත්වය සඳහා යුද්ධ හමුදා සංඥා සංගමය වෙතින් එම සාමාජිකයින්ට ලැබෙන සුබසාධක වරප්‍රසාද පහත පරිදි වේ.

- සේවයෙන් විශ්‍රාමගත් පසුවත් සංඥා සහෝදරත්වය, එකමුතුව හා බළකා බැඳීම (Spirit de Corps) පවත්වාගෙන යෑම
- සංඥා සංගමයේ පවුල් සුහදතාවය වර්ධනය කිරීම සඳහා වාර්ෂික සංඥා පවුල් සුහද හමුව පැවැත්වීම හා තරඟ පවත්වා වටිනා ත්‍යාගයන් පිරිනැමීම
- සාමාජිකයෙකුගේ අවමංගල්‍යයකදී මුදලින් රුපියල් 15,000.00ක් කලත්‍රයා වෙනුවෙන් රුපියල් 10,000.00ක් ද (සාමාන්‍ය මරණාධාර අරමුදල සාමාජිකත්වය වෙනුවෙන්) ප්‍රදානය කෙරේ

විශ්‍රාම වැටුපෙන් රුපියල් 100.00 අවකරණය වන මුදල, රුපියල් 200.00 ක් දක්වා වැඩිකර ඇති අතර, සාමාජිකයාගේ අභාවය වෙනුවෙන් ගෙවූ රුපියල් 50,000.00ක මුදල රුපියල් 100,000.00ක් දක්වා ද කාලත්‍රයා වෙනුවෙන් ගෙවූ 35,000.00ක මුදල රුපියල් 50,000.00ක් දක්වා ද මෙම වර්ෂයේ සිට වැඩි කරන ලදි.

සංගමයේ සුවසහන පදනම 2012 අප්‍රේල් මස 04 වන දින ආරම්භ වූ අතර, රුපියල් 1500.00 ව තිබූ මුදල රුපියල් 1800.00 වශයෙන් සංශෝධනය කර ඇති අතර එම අරමුදල මගින් අසාධ්‍ය රෝගී තත්වයේ සිටින මුදල් අවශ්‍යතාවය ඇති සාමාජිකයින්ට මුදලින් ආධාර කරනු ලබයි (පවතින තත්වය හා අදාළ නිරීක්ෂණයන්ට අනුව).

මෙම සංගමය වෙතින් ලබා දෙනු ලබන හැඳුනුම්පත සඳහා අයකල මුදල රුපියල් 550.00 වූ අතර එය මේ වන විට රුපියල් 250.00 ක් දක්වා අඩු කර ඇත.

2018 වසරේ සිට සංඥා ශාඛා සංගම් දිස්ත්‍රික් මට්ටමේ 16ක් ක්‍රියාත්මක වන අතර, එම සංගමයන්ගේ නිර්දේශ මත හා සංඥා සංගමය පූර්ව නිර්දේශය මත ශ්‍රී ලංකා සේවාමුක්ත භට සංගමය මගින්

- රුපියල් 300,000.00 ක ණය පහසුකම් සාධාරණ අඩු පොලිය යටතේ ලබාදීම
- රණවිරු නිවාස පහසුකම්, නවාතැන් පහසුකම්, ප්‍රවීණයන් සඳහා වැඩිහිටි පහසුකම්
- ඇස් කණ්නාඩි සඳහා රු 5,000.00 ක් ද
- ඇස් කාච සඳහා රු 8,000.00 ක් ද
- ශ්‍රවණාධාර සඳහා රු 10,000.00 ක් ද
- වකුගඩු හා අනෙකුත් ශල්‍යකර්ම වෙනුවෙන් රු 75,000.00 ක් ද
- හදවත් ශල්‍යකර්ම වෙනුවෙන් රු 100,000.00 ක් ද
- සාමාන්‍ය ශල්‍යකර්ම සඳහා රු 4,000.00 සිට 20,000.00 දක්වා ද (මෙම ඉහත සියලු වෛද්‍යාධාර වෛද්‍ය නිර්දේශය අනුව ගෙවනු ඇත)
- සාමාජිකයින්ගේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ දරුවන්හට මසකට රුපියල් 1,500.00 ක් බැගින් වර්ෂ 4 කට ගෙවනු ලැබේ

## හමුදා සංඥා සංගමයේ ආරම්භයේ සිට මේ දක්වා තනතුරු දැරූ සාමාජිකයින්

### සභාපතිවරු

| | | | | |
|---|---|---|---|---|
| කර්නල් | වී සී කලාර්ට් | 1955 | - | 1957 |
| කර්නල් | සී ආර් සී ද සිල්වා | 1958 | - | 1966 |
| ලුතිනන් කර්නල් | ඩබ්ලිව් ඊ එම් ප්‍රනාන්ද | 1967 | - | 1976 |
| මේජර් | එම් ජේ එෆ් ආර් පෙරේරා | 1977 | - | 1982 |
| කර්නල් | ඒ එම් එම් ෆරිඩ් | 1983 | - | 1988 |
| මේජර් | එම් ආර් ඒ ටි පෙරේරා | 1988 | - | 1989 |
| මේජර් ජෙනරාල් | සි ජේ අබේරත්න | 1994 | - | 2007 |
| බ්‍රිගේඩියර් | කේ ඒ ඥානවීර | 2008 | - | 2017 |
| මේජර් ජෙනරාල් | වයි එස් ඒ ද සිල්වා | 2017 | - | 2018 |
| මේජර් ජෙනරාල් | එස් ඒ පි පි සමරසිංහ | 2018 | - | 2019 |
| මේජර් ජෙනරාල් | කේ ආර් පි රෝවෙල් | 2019 | - | මේ දක්වා |

### ලේකම්වරු

| | | | | |
|---|---|---|---|---|
| කර්නල් | ඩි වී බ්‍රොහියර් | 1955 | - | 1957 |
| | කේ අයි ප්‍රනාන්දු | 1958 | - | 1963 |
| | ඒ ජෝෂප් | 1964 | - | 1966 |
| කපිතන් | එස් එල් වි ඒ පෙරේරා | 1967 | - | 1968 |
| කපිතන් | ඒ අයි මාර්ටිල් | 1969 | - | |
| | එස් ඒ ජේ සැමුවෙල් | 1970 | - | |
| | ජේ නිකොලොස් | 1971 | - | 1978 |
| | එච් එන් ඒ වී ජේ ධර්මසේන | 1979 | - | 1980 |
| | ඩබ්ලිව් ජී කෲස් | 1980 | - | 1982 |
| | ඩි සි පෙරේරා | 1984 | - | 1998 |
| | එම් අයි එම් ෆවුසි | 1999 | - | 2012 |
| | පි එල් ටි පෙරේරා | 2012 | - | මේ දක්වා |

### භාණ්ඩාගාරිකවරු

| | | | | |
|---|---|---|---|---|
| ලුතිනන් කර්නල් | ඊ එම් ප්‍රනාන්දු | 1955 | - | 1957 |
| කපිතන් | ජේ ඒ ප්‍රනාන්දු | 1958 | - | 1959 |
| මේජර් | ටි කේ පසේරා | 1959 | - | 1968 |
| කපිතන් | ජේ ඊ ප්‍රනාන්දු | 1969 | - | 1970 |
| | බි ජේ එස් ප්‍රනාන්දු | 1970 | - | 1975 |
| | වි කේ කුරේ | 1976 | - | 1977 |
| | එස් බි සී ද සිල්වා | 1977 | - | 1978 |
| | බි කේ කුරේ | 1978 | - | 1979 |
| | සී ඊ කුරේ | 1979 | - | 1980 |
| ලුතිනන් | කේ ටි ජී ද සිල්වා | 1980 | - | 1982 |
| මේජර් | එම් ආර් ඒ ටි පෙරේරා | 1983 | - | 1987 |
| | ටෝනි වසීර | 1988 | - | 2006 |
| කපිතන් | ඩබ්ලිව් ඒ පෙරේරා | 2007 | - | 2017 |
| මේජර් | ඩබ්ලිව් ජී ද සිල්වා | 2017 | - | 2019 |
| ලුතිනන් | ඩබ්ලිව් එම් එස් වීරකෝන් | 2019 | - | මේ දක්වා |

# සංඥා බළකා සේවා වනිතා ශාඛාව

## යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ උප සභාපතිතුමිය ඇගයීම

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ උප සභාපතිනිය වශයෙන් පත් වු ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිතුමිය වු රමණී දෙමටන්පිටිය මැතිණිය පිළිගැනිම සහ දිර්ඝ කාලයක් පුරාවට එතුමිය විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සහ මෙම ශාඛාවේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකල සේවය ඇගයීමේ උත්සවයක් 2021 ජනවාරි මස 03 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරි නිවස්නයේදි ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විය. තවද මෙදින සිවිල් සේවක මහතුන් පිරිසකගේ දු දරුවන් වෙනුවෙන් පොත් බෙදාදීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක විය.






## ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකත්වයෙන් ඉවත් ව යන සාමාජිකාවන්ගේ සේවය ඇගයීම සහ 2021 ජනවාරි මස සභා රැස්වීම

පසුගිය වර්ෂයේදි ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකත්වයෙන් ඉවත්ව ගිය ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් වු චන්ද්‍රිකා සෙනවිරත්න, චලනි චන්ද්‍රසේකර, චම්පා අකුරන්තිලක, නයනා කුමාරි, අජන්තා වන්නිආරච්චි, සෙව්වන්දි ද සිල්වා යන මහත්මින්ගේ සේවය අගය කිරීම සඳහා උත්සවයක් 2021 ජනවාරි මස 03 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරි නිවස්නයේ දී ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිණිය වු රමණී දෙමටන්පිටිය මැතිනියගේ ප්‍රදානත්වයෙන් සිදුකෙරිණි. එදිනම මෙම ශාඛාවේ 2021 වර්ෂයේ ජනවාරි මස මාසික සභා රැස්වීම ද පැවැත්විය.












## සෝමාවති පුදබිමෙහි පැවති ආගමික වැඩසටහන් මාලාව

මව්බිමේ ස්වෛරීත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් තම ජීවිතය පූජාකල ශ්‍රී ලංකා සංඥා බළකායේ වීරෝධාර රණවිරුවන් සිහිපත් කොට පිං පැමිණවීමටත් රණක්ෂිතයට පත් හා දැනට සේවයේ නියතු සියලුම ශ්‍රී ලංකා සංඥා බළකා සාමාජිකයන්ටත්, සිවිල් සේවක මහතුන්ටත් ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ටත් ආශිර්වාද කිරීම අරමුණු කරගනිමින් සෝමාවති පුදබිමෙහි ආගමික වැඩසටහන් මාලාවක් ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් 2021 ජනවාරි මස 08 හා 09 යන දෙදින තුළ ක්‍රියාත්මක කරන ලදි.

සෝමාවතිය චෛත්‍ය අසල බුද්ධ ප්‍රතිමාවක් තැම්පත් කිරීම, දළඳා දානය පූජා කිරීම, ඖෂධ පූජාවක්, බෝධි පූජාවක් හා ධර්ම දේශනා ඇතුලු ආගමික වැඩසටහන් රැසක් සිදු කෙරිණි. මේ සඳහා ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය වූ රමණී දෙමටන්පිටිය මැතිනිය ඇතුලු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක්ද, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා සංඥා බළකා බළකාධිපති තුමන් වූ මේජර් ජෙනරාල් ඩීඑම්ඩීඑන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ඇතුලු ශ්‍රී ලංකා සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක්ද සහභාගි විය.










## <u>ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිතුමියගේ සේවය අගය කිරීම</u>

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ දහවන සභාපතිතුමිය ලෙස කටයුතු කළ රමණී දෙමටන්පිටිය මැතිණියගේ සේවය අගය කිරීම වෙනුවෙන් උත්සවයක් 2021 ජනවාරි මස 31 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දි සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදි. එහි දි හිටපු සභාපතිතුමිය තම ධුර කාලය තුළ දි සිදුකරන ලද කාර්‍යයන් වෙනුවෙන් සහයෝගය දැක් වූ සියලුම දෙනාට ඇයගේ ප්‍රශංසාව සහ ස්තුතිය පිරිනමන ලදී.






## නව සභාපති තුමිය රාජකාරි ආරම්භ කිරීම

ශ්‍රී ලංකා සංඥා බළකාය සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ලෙස සජිවනි පීරිස් මැතිණිය 2021 ජනවාරි මස 31 වන දින සුබ මොහොතින් රාජකාරි ආරම්භ කරන ලදි.

මෙම අවස්ථාව සඳහා ප්‍රධාන සංඥා නිලධාරි හා ශ්‍රී ලංකා සංඥා බළකා බළකාධිපතිතුමන් වන මේජර් ජෙනරාල් පීඑජ් පීරිස් එන්ඩියු ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරින් පිරිසක් ද සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් ද එක් විය.













## ලෝක කාන්තා දිනයට සමගාමීව සෙබළ භාර්යාවන් වෙනුවෙන් වෘත්තිය පුහුණුව සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම

මාර්තු මස 08 වන දිනට යෙදුන ලෝක කාන්තා දිනයට සමගාමීව සෙබළ භාර්යාවන් වෙනුවෙන් වෘත්තිය පුහුණුව සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටනක් මෙම ශාඛාවේ ගරු සභාපතිනිය වන සජිවනි පිරිස් මැතිණියගේ මුලිකත්වයෙන් 2021 මාර්තු මස 21 වන දින සිදු කරන ලදි.

එහි දි නුගේගොඩ ඉන්ටර්නැෂනල් ඇකඩමි ඔෆ් බියුටිෂියන්ස් ආයතනයේ හසිනි ගුණසේකර මහත්මිය විසින් එක් වෘත්තිය ශිෂ්‍යත්වයක් ලබා දුන් අතර අනෙක් ශිෂ්‍යත්වය වයිට් ෆ්ලවර් කේක්ස් ඇන්ඩ් වෙඩින්ස් (ඇකඩමි ඔෆ් කේක් ආර්ටිස්ට්) හි දුෂ්‍යයන්ති මදනායක මහත්මිය විසින් ප්‍රධානය කරන ලදි.









## ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ හිටපු උප සභාපතිතුමියගේ සේවය අගය කිරීම සහ 2021 මාර්තු මාසික සභා රැස්වීම

මෙම ශාඛාවේ හිටපු උප සභාපතිතුමිය වු චන්ද්‍රිකා තිලකරත්න මහත්මියගේ සේවය අගය කිරීම උදෙසා උත්සවයක් සේවා වනිතා ශාඛාවේ වත්මන් සභාපතිතුමියගේ ප්‍රධානත්වයෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරි නිවස්නයේ දි පවත්වන ලදි. ඊට සමගාමීව 2021 වර්ෂයේ මාර්තු මාසික සභා රැස්වීමද පවත්වන ලදි.









## නව නිවාසයක් පිරිනැමීම

11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය යටතේ සේවයේ නිරතව සිටියදී හදිසි අනතුරකින් මියගිය සෙ/283774 සැරයන් කුමාරසිංහ ජේ යන ජ්‍යෙකොනොනිගේ ළගම ඥාතින් වෙත ශ්‍රී ලංකා සංඥා බළකා සේවාවනිතා ශාඛාවේ සහ 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ මූල්‍යමය දායකත්වයෙන් මහනුවර දිස්ත්‍රික්කයට අයත් වත්තේගම ප්‍රදේශයේ නව නිවසක් ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂයේදී ආරම්භ කරන ලදි.

ඒ අනුව වැඩ නිම කරන ලද නව නිවස තත් ජ්‍යෙකොනොනිගේ ළගම ඥාතින් වෙත භාරදීම 2021 අප්‍රේල් මස 29 දිනට යෙදුන සුබ මොහොතින් ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් පීඑජේ පීරිස් එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරුණි.





## වෛද්‍යාධාර ලබාදීම

9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායට අයත් සෙ/283303 සංසෙ රත්නායක ආර්එස් ගේ ශල්‍යකර්මයක් සඳහා වෛද්‍යාධාර වශයෙන් ශ්‍රී ලංකා සංඥා බළකාධිපතිතුමාගේ පූර්ණ සම්බන්ධීකරනයෙන් විශේෂ පරිත්‍යාග මුදලක් ලබාදෙන ලදි. තවද ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව මගින්ද බළකායේ සියලුම නිලධාරීන් හා සෙසු නිලයින් නියෝජනය වන පරිදි මූල්‍යමය දායකත්වයක් සපයන ලදි.



## ලෝක ළමා දිනයට සමගාමීව ශ්‍රී ලංකා සංඥා බළකායේ සියලුම සෙසු නිලයින්ගේ පාසල් යන දුවා දරුවන් සඳහා ත්‍යාග වවුචර් පත් බෙදා දිමේ උත්සවය

ලෝක ළමා දිනයට සමගාමීව ශ්‍රී ලංකා සංඥා බළකායේ සේවයේ යෙදී සිටින සියලු සෙසුනිලයින්ගේ පාසල් යන දුවා දරුවන් වෙනුවෙන් ඔවුන් වෙත දක්වන අනුග්‍රහයක් වශයෙන් ශ්‍රී ලංකා සංඥා බළකා සේවාවනිතා ශාඛාව විසින් රු: 1000 ක වටිනාකමින් යුත් තෑගි වවුචර් පත් බෙදා දිමේ උත්සවයක් 2021 ඔක්තෝබර් 09 වන දින ශ්‍රී ලංකා සංඥා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදි පැවැත්විණි. ශ්‍රී ලංකා සංඥා බළකායෙහි බළකාධිපතිගේ මගපෙන්වීමෙන් හා සංඥා බළකා සේවාවනිතා ශාඛාවේ සභාපතිනියගේ සංකල්පයකට අනුව මෙම වැඩසටහන සංවිධානය කරන ලදි. පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් නිසි සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් නිසි දුරස්ථභාවය පවත්වා ගනිමින් දරුවන් 6 දෙනෙකු පමණක් සහභාගි කරවා ගනිමින් වැඩසටහන පැවැත්විණි. අනිකුත් සෙසුනිලයින්ගේ දුවා දරුවන් සඳහා තෑගි වවුචර් පත් ඒකකයන් නියෝජනය කරමින් සහභාගී වු නිලධාරීන් වෙත පිරිනැමිණ. මෙම උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා සංඥා බළකා සේවාවනිතා ශාඛාවේ වත්මන් සභාපති තුමිය, වන සජීවනි පීරිස් මැතිණිය සහභාගි වු අතර ශ්‍රී ලංකා සංඥා බළකා සේවාවනිතා ශාඛාවෙහි සීමිත ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්, පිරිසක්ද ඒ සදහා සහභාගි වන ලදි. මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සදහා සංඥා බළකා සියලු ඒකයන්ගෙන් ද නොමද සහය ලැබිණි.







## බොරැල්ල ජයන්ති ළදරු සංවර්ධන මධ්‍යස්ථාන ළමා නිවාසය සඳහා වියළි ආහාර සහ අත්‍යාවශ්‍ය බඩු බාහිරාදිය පරිත්‍යාග කිරීමේ වැඩසටහන

2021 ඔක්තෝම්බර් මස 01 වන දින යෙදී ඇති ලෝක ළමා දිනයට සමගාමීව ශ්‍රී ලංකා සංඥා බලකායෙහි බලකාධිපති තුමන්ගේ මගපෙන්වීමෙන් හා සංඥා බලකා සේවාවනිතා ශාඛාවේ සභාපතිනියගේ සංකල්පයකට අනුව බොරැල්ල ජයන්ති ළදරු සංවර්ධන මධ-‍්‍යස්ථාන ළමා නිවාසයේ දරුවන් සඳහා වියළි ආහාර සහ අත්‍යාවශ්‍ය බඩු භාහිරාදිය ලබා දීමේ වැඩසටහනක් 2021 ඔක්තෝබර් මස 10 වන දින සිදු කරන ලදී. මෙම ළමා නිවාසයේ අවරුදු 1 සිට 5 දක්වා දරුවන් 16 දෙනෙකු සිටින අතර කොවිඩ් වසංගත තත්වය හේතුවෙ-න් නිසි සෞඛ්‍ය උපදෙස් හා දුරස්ථභාවය තබා ගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදී. මෙම වැඩසටහන සදහා ශ්‍රී ලංකා සංඥා බලකා සේවාවනිතා ශාඛාවේ වත්මන් ගරු සභාපති තුමිය, වන සජීවනි පීරිස් මැතිණිය සහභාගි වු අතර ශ්‍රී ලංකා සංඥා බලකා සේවාවනිතා ශාඛාවෙහි ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් පිරිසක්ද ඒ සදහා සහභාගි වන ලදි.





# ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විශ්‍රාම ගැනීම

## යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා සංඥා බළකාධිපති පත්වීම හෙබවූ මේජර් ජෙනරාල් ඩීඑජීඑන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

56 වන යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා සංඥා බළකායේ 13 වන බළකාධිපති ලෙස රාජකාරී කළ මේජර් ජෙනරාල් ඩීඒජීඑන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ගැනීම නිමිත්තෙන් 2021 ජනවාරි මස 14 වන දින උත්සව මාලාවක් පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි.

වැඩසටහනේ සමාරම්භය සනිටුහන් කරමින් ප්‍රධාන පිවිසුම අභියසදී මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් පීජීජී ගුණසේකර යුඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් මේජර් ජෙනරාල් ඩීඒජීඑන් දෙමටන්පිටිය එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී මහත් හරසරින් පිලිගන්නා ලදි.

අනතුරුව සංඥා බළකායේ අභිමානය විදහාපාන කඳවුරු සම්මාන මුරය පිරිනැමූ අතර, මියගිය රණවිරුවන් සිහිපත් කරමින් රණවිරු ස්මාරකයට පුෂ්පෝපහාර දැක්වීමෙන් පසු  සම්මාන පෙළපාලිය පැවැත්වූ අතර, නිලධාරී නිවස්නයේදී තේපැන් සංග්‍රහය පවත්වන ලදි.

ඉන්පසු සජීවී වෙබ් විකාශණයකින් සියලුම සෙසුනිලයින් අමතන ලද අතර පසුව සියලුම නිලධාරීන් අමතන ලදි. සංඥා බළකායට සිදුකරන ලද කීර්තිමත් සේවාව අගය කරමින් සිහිවටන තිළිණයක්ද පිලිගන්වන ලදි.

මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී සිය සේවා කාලය තුළදී දේශීය හා විදේශීය පාඨමාලාවන් ඉතා සාර්ථකව හදාරා ඇති අතර යුද්ධ හමුදාවේ උසස් තනතුරු රැසක්ද හෙබවනු ලැබීය. වසර තිස්පහකට අධික කාලයක් රටේ විවිධ ප්‍රදේශවල අණ, මාණ්ඩලික හා උපදේශක රාජකාරීන් හා වගකීම් ඉටුකරමින් යුද්ධ හමුදාවට මෙන්ම සංඥා බළකායටද ඉමහත් ගෞරවයක් හා විශාල මෙහෙයක් ඉටුකරන ලදි.









## බ්‍රිගේඩියර් ඩීඑල්එස්යු ද සිල්වා යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

බ්‍රිගේඩියර් ඩීඑල්එස්යු ද සිල්වා යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදාවෙන් 2020.12.04 වන දින විශ්‍රාම යන ලද අතර, ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී 2020.12.04 වන දින සම්මාන මුරය සහ මියගිය රණවිරුවන් සඳහා පුෂ්පෝපහාර දැක්වීමක් රෙජිමේන්තු ස්මාරකය අභියස පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් පැවැත්විය.




## බ්‍රිගේඩියර් එන්පී අකුරන්තිලක ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

බ්‍රිගේඩියර් එන්පී අකුරන්තිලක ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදාවෙන් 2020.12.16 වන දින විශ්‍රාම යන ලද අතර, ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී 2020.12.15 වන දින සම්මාන මුරය සහ මියගිය රණවිරුවන් සඳහා පුෂ්පෝපහාර දැක්වීමක් රෙජිමේන්තු ස්මාරකය අභියස පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් පැවැත්විය.




## බ්‍රිගේඩියර් ඩබ්එල් ප්‍රේමසිරි යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

බ්‍රිගේඩියර් ඩබ්එල් ප්‍රේමසිරි යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදාවෙන් 2020.01.31 වන දින විශ්‍රාම යන ලද අතර, ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී 2020.01.29 වන දින සම්මාන මුරය සහ මියගිය රණවිරුවන් සඳහා පුෂ්පෝපහාර දැක්වීමක් රෙජිමේන්තු ස්මාරකය අභියස පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් පැවැත්විය.




## මේජර් ජෙනරාල් ඩබ්ලිව් පීඑකේ තිලකරත්න පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

ශ්‍රී ලංකා සංඥා බළකායට අයත් ප්‍රධාන සංඥා නිලධාරි වශයෙන් රාජකාරි කල මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඑකේ තිලකරත්න පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදාවෙන් 2021.01.23 වන දින විශ්‍රාම යන ලද අතර, ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී සම්මාන මුරය, මියගිය රණවිරුවන් සදහා පුෂ්පෝපාහාර දැක්වීමක් රෙජිමේන්තු ස්මාරකය අභියස හා සම්මාන පෙළපාලිය පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් පැවැත්විය.





## බ්‍රිගේඩියර් එන්පීජේඑස්කේ පටබැඳිගේ ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

බ්‍රිගේඩියර් එන්පීජේඑස්කේ පටබැඳිගේ ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදාවෙන් 2021.04.07 වන දින විශ්‍රාම යන ලද අතර, ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී සම්මාන මුරය සහ මියගිය රණවිරුවන් සදහා පුෂ්පෝපාහාර දැක්වීමක් රෙජිමේන්තු ස්මාරකය අභියස පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් පැවැත්විය.





## බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඒසිඑන් වරකාගොඩ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම ගැනීම

බ්‍රිගේඩියර් ඩබ්ලිව්ඒසිඑන් වරකාගොඩ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදාවෙන් 2021.04.27 වන දින විශ්‍රාම යන ලද අතර, ඒ සඳහා සංඥා බළකා රෙජිමේන්තු පරිශ්‍රයේදී සම්මාන මුරය සහ මියගිය රණවිරුවන් සදහා පුෂ්පෝපාහාර දැක්වීමක් රෙජිමේන්තු ස්මාරකය අභියස පැවැත්වූ අතර, එම උත්සවය සංඥා බළකායේ රාජකාරී නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා සෙසුනිලයින් රැසකගේ දායකත්වයෙන් පැවැත්විය.





# විශේෂ අවස්ථාවන්

## විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා නිලධාරී නිවස්නයේ පැවැත්වූ රාත්‍රී භෝජන සංග්‍රහය

සංඥා බළකා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ විශ්‍රාමයාම වෙනුවෙන් පැවැත්වූ නිලධාරී නිවස්න සාදය ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් පීඑජේ පීරිස් එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී හා ශ්‍රී ලංකා සංඥා බළකා සේවාවනිතා ශාඛාවේ ගරු සභාපතිතුමිය වන සජීවණී පීරිස් මැතිණියගේ ප්‍රධානත්වයෙන් 2021.03.19 වන දින මෙම රෙජිමේන්තු පරිශ්‍රයේදී පැවැත්වූ අතර, ඒ සඳහා බ්‍රිගේඩියර් ඩබ්පීඩී වන්නිආරච්චි (විශ්‍රාමික) පීඑස්සී, බ්‍රිගේඩියර් එන්පී අකුරන්තිලක (විශ්‍රාමික), බ්‍රිගේඩියර් ඩබ්එල් ප්‍රේමසිරි (විශ්‍රාමික) යුඑස්පී, බ්‍රිගේඩියර් එල්එස්පී පෙරේරා (විශ්‍රාමික) යුඑස්පී, බ්‍රිගේඩියර් ඩීඑල්එස්යු ද සිල්වා (විශ්‍රාමික), ලුතිනන් කර්නල් එල්ආර්කේ කහදගමගේ (විශ්‍රාමික) ආර්එස්පී, ලුතිනන් කර්නල් කේඑන්පී ද සිල්වා (විශ්‍රාමික) යුඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා එම මැතිණියන්ගේ සහභාගිත්වයෙන් සිදුවිය.













# සංඥා ක්ෂිතිජයෙන් ඔබ්බට



2021.02.18 දින ආසේමු (මධ්‍යම) බ්‍රිගේඩියර් ප්‍රමානි වශයෙන් බ්‍රිගේඩියර් කේඑඩබ්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කල අවස්ථාව



2020.10.26 දින යුද්ධ හමුදා තත්ව ආරක්ෂණ පිරික්සුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ වශයෙන් බ්‍රිගේඩියර් ඩීඑම්පීපී දසනායක ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කල අවස්ථාව



2021.09.16 දින යුද්ධ හමුදා පර්යේෂණ, විශ්ලේෂණ හා සංවර්ධන ශාඛාවේ අධ්‍යක්ෂ වශයෙන් බ්‍රිගේඩියර් ඒපී වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කල අවස්ථාව



2021.01.19 දින 543 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති බ්‍රිගේඩියර් බීඅයි අස්සලාරච්චි යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කල අවස්ථාව



2021.01.13 දින 653 බලසේනා මූලස්ථානයේ බලසේනාධිපති කර්නල් පීඑස් ෆොන්සේකා යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කල අවස්ථාව

## උසස්වීම්

### මේජර් ජෙනරාල් නිලයට උසස්වීම



මේජර් ජෙනරාල්
එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී

### බ්‍රිගේඩියර් නිලයට උසස්වීම



බ්‍රිගේඩියර් කේසී ප්‍රතාපසිංහ



බ්‍රිගේඩියර් පීඑස් ෆොන්සේකා යූඑස්පී පීඑස්සී



බ්‍රිගේඩියර් පීජීඒ ගුණසේකර යූඑස්පී

# පාඨමාලා

## JSC (SIG) LINKED WITH MCC (SIG) 65 – PAKISTAN



මේජර් එන්පීඑස්එම් සිසිර කුමාර පීඑස්සී



මේජර් ටීටීඑන් මෙන්ඩිස් යූඑස්පී

## JUNIOR OFFICER'S ADMINISTRATION COURSE 54 - BANGLADESH



මේජර් ඊඑම්එන්ඩීබී ඒකනායක

## ADVANCED CYBER SECURITY COURSE (O) INDIA



මේජර් සීඑස්කේ පතිරණ

## OFFICERS ADVANCE ELECTRONICS ENGINEERING (COMMUNICATION) COURSE - 41 (PART I & II) INDIA



මේජර් එස්ආර් හේවරාජගේ ආර්එස්පී

## YOUNG OFFICER'S COURSE (SIG) – 64 PAKISTAN



මේජර් ආර්එච්එම්ආර් බණ්ඩාර



මේජර් එම්ඒඩීඑන් කුමාර

## ADVANCED PROJECT MANAGEMENT COURSE - 11 INDIA



මේජර් එස්ඒඑල්ඩී ගුණරත්න

## 14 වන අණ හා මාණ්ඩලික පාඨමාලාව සාර්ථකව හැදෑරූ නිලධාරීන්



මේජර් පීඒඑල්එන් පින්නවල පීඑස්සී



මේජර් එම්සීඊ ඩයස් පීඑස්සී



මේජර් ඩීඑම්ටීඑම් දිසානායක පීඑස්සී



මේජර් ආර්පීඑම්ටීඩීබී රත්මලවින්න පීඑස්සී

## NAME LIST OF OFFICERS WHO ARE FOLLOWING OVERSEAS COURSES

| | | | |
|---|---|---|---|
| Brig | IHMRK Herath USP psc | 61th National Defence College Course | India |
| Lt Col | MRMRLB Meegasthanna USP | Overseas Course | |
| Maj | EMDL Ekanayake | Young Officer's Course (Sig) - 44 | Bangladesh |
| Capt | LHS Perera | Signal Young Officer's Course - 156 | India |
| Maj | HMRL Kularathne | Advanced Cyber Security Course - 11 | India |
| Maj | NB Sanjeewa psc | JSC (SIG) 65 Linked with MCC (SIG) 65 | Pakistan |
| Maj | MR Hameem | JSC (SIG) 65 Linked with MCC (SIG) 65 | Pakistan |
| Maj | AGP Karunarathne | Info Comm and Technology Net Technician Adv Course | Bangladesh |
| Maj | JMMS Kularathne | MLIT Offrs Course - 42 | India |
| Capt | RMTL Rathnayake | Young Officer's Course - 65 | Pakistan |
| Capt | TNP Vithanage | Young Officer's Course - 65 | Pakistan |
| Capt | NC Liyanage | MLIT Offrs Course - 42 | India |

## NAME LIST OF OFFICERS WHO ARE EMPLOYING IN UN MISSIONS

| | | | |
|---|---|---|---|
| Maj | WCS Nanayakkara USP | Sig Offr | Mali |
| Maj | BS Dissanayake | IT Offr | Lebanan |
| Maj | DLA De Silva | IT Offr | Mali |

## NAME LIST OF OTHER RANKS WHO ARE EMPLOYING IN UN MISSIONS

| | | |
|---|---|---|
| WO II | Jayathilake | Lebanon |
| Sgt | Kumara LNA | Lebanon |
| WO II | Bandara WGJ | South Sudan |
| S/Sgt | Bandara KWWK | South Sudan |
| WO II | Vithanachchi KRK | Mali |
| S/Sgt | Nawarathna AMPNMLS | Mali |
| S/Sgt | Bandara PGP | Mali |
| S/Sgt | Anura Bandara IG | Mali |
| Sgt | Kumarathunga TDN | Mali |
| Cpl | Kumara RP | Mali |

## NAME LIST OF OTHER RANKS WHO ARE FOLLOWING OVERSEAS COURSES

| | | | |
|---|---|---|---|
| WO I | RPGSS Jayathilaka | Information Technology (Specialist) Database Management - JCOS & OR (SIGS) | India |
| WO II | Liyanage SK | Junior Network Engineer course | India |
| S/Sgt | Asantha JAP | Junior Leader Course (JLC) | India |
| Sgt | Nishshanka NAN | Junior Leader Couse (JLC) | India |
| Cpl | Roshan MAD | Trumpeter Training Course | Pakistan |
| Cpl | Somathilaka DKMP | Drum Major Course | India |




2021.05.22 දින සිට 2021.06.01 දින දක්වා එක්සත් අරාබි එමිර් රාජ්‍යයේ පැවති ආසියානු ශූරතා මුෂ්ටි ප්‍රහාරක තරගාවලිය සඳහා ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ කලමනාකරු ලෙස කර්නල් එකේඩී අධිකාරි යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි කටයුතු කරන ලදි, මීට අමතරව ශ්‍රී ලංකා මුෂ්ටි ප්‍රහාරක සංගමයේ සහකාර ලේකම් තනතුර සඳහා තේරීපත් වී ඇත.



අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරගාවලිය - 2020 කාන්තා ශූරතාවය දිනාගත් ශ්‍රී ලංකා සංඥා බළකා කාන්තා කණ්ඩායම යුද්ධ හමුදාධිපති සමග සමූහ ඡායාරූපයකට සහභාගී වූ අවස්ථාව



අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරගාවලිය - 2020 ශ්‍රී ලංකා සංඥා බළකා කාන්තා කණ්ඩායම ශූරතාවයට හිමි සමරු ඵලකය ලබාගත් අවස්ථාව



**බ්‍රිගේඩියර් ඩබ්ලිව්එල් ප්‍රේමසිරි (විශ්‍රාමික)යූඑස්පී**

40 වන ජාතික ස්කොෂ් ශූරතාවලියේ අවුරුදු 45 ට වැඩි හා අවුරුදු 50 වැඩි අංශයේ අනුශූරතාවය දිනා ගැනීම



**කර්නල් එස්එච්පීඩී තිලකරත්න ආර්එස්පී**

2021 ආරක්‍ෂක සේවා බැට්මින්ටන් තරඟාවලිය කේවල අවුරුදු 50 ට වැඩි අංශයේ අනුශූරතාවය සහ අවුරුදු 50 ට වැඩි යුගල අංශයේ ශූරතාවය දිනා ගැනීම.

2021 ආරක්‍ෂක සේවා ස්කොෂ් ශූරතා වලියේ අවුරුදු 45 ට වැඩි අංශයේ ශූරතාවය සහ අවුරුදු 50 වැඩි අංශයේ අනුශූරතාවය දිනා ගැනීම.




**සංසෙ(කා) කුමාරසිංහ කෙඩබ්පීබීඑම්එස්**

දකුණු ආසියානු ක්‍රීඩා තරඟාවලියේ
මීටර් 400 ප්‍රථම ස්ථානය
මීටර් 800 ප්‍රථම ස්ථානය
මීටර් 400x4 ප්‍රථම ස්ථානය

98 වන ජාතික මළල ක්‍රීඩා තරඟාවලියේ
මීටර් 800 ප්‍රථම ස්ථානය
මීටර් 400 දෙවන ස්ථානය



**ලා/කෝප්‍රල් පෙරේරා ජේඑල්**

දකුණු ආසියානු ක්‍රීඩා තරඟාවලිය දසප්‍රයාම තරඟාවලියේ තෙවන ස්ථානය දිනා ගැනීම




**සංසෙ(කා) ද සිල්වා ඩීටීජී**

දකුණු ආසියානු තරඟාවලියේ
මීටර් 100 දෙවන ස්ථානය
මීටර් 400x4 ප්‍රථම ස්ථානය

98 වන ජාතික මළල ක්‍රීඩා තරඟාවලියේ
මීටර් 100 ප්‍රථම ස්ථානය




**සංසෙ(කා) සෆියා එම්වයිඑෆ්**

98 වන ජාතික මළල ක්‍රීඩා තරඟාවලියේ
මීටර් 100 තෙවන ස්ථානය
මීටර් 200 දෙවන ස්ථානය



**සංසෙ(කා) අබේරත්න ඒටීඑම්එස්කේ**

98 වන ජාතික මළල ක්‍රීඩා තරඟාවලියේ මීටර් 400 කඩුළු පැනීම තෙවන ස්ථානය දිනා ගැනීම



**සංසෙ(කා) පෙරේරා කේඑල්එස්කේ**

98 වන ජාතික මළල ක්‍රීඩා තරඟාවලියේ රිටි පැනීම ඉසව්ව 3m 56cm උසක ශ්‍රී ලංකා වාර්තා තබා ප්‍රථම ස්ථානය දිනා ගැනීම



**සංසෙ(කා) සෙව්වන්දි එස්පීඑස්**

98 වන ජාතික මළල ක්‍රීඩා තරඟාවලියේ හෙල්ල විසිකිරීම පස්වන ස්ථානය දිනා ගැනීම




**කෝප්‍රල් විමලසිරි ඩීජීඑජේ**

98 වන ජාතික මළල ක්‍රීඩා තරඟාවලියේ දුර පැනීම ප්‍රථම ස්ථානය දිනා ගැනීම



**ලා/කෝප්‍රල් දිසානායක ඩීඑම්ඩීඑස්**

98 වන ජාතික මළල ක්‍රීඩා තරගාවලියේ මීටර 5000 ප්‍රථම ස්ථානය දිනා ගැනිම



**කපිතාන් එල්එස් කාවින්ද**

අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරගාවලිය පිරිමි කේවල රිදී පදක්කම දිනා ගැනීම.



**සංසෛ ප්‍රියංකර වයිආර්එම්**

අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරගාවලිය පිරිමි කේවල රන් පදක්කම දිනාගැනීම හා දක්‍ෂතම ක්‍රීඩකයා වීම.



**සංසෛ(කා) පිටිගල කේඑච්**

අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරගාවලිය

කාන්තා කේවල රන් පදක්කම දිනාගැනීම හා දක්‍ෂතම ක්‍රීඩිකාව වීම.

කාන්තා යුගල රන් පදක්කම දිනාගැනීම.



**සංසෛ(කා) අනුරාධා ටීඑන්**

අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරගාවලිය

කාන්තා කේවල සම ලෝකඩ පදක්කම දිනාගැනීම.

කාන්තා යුගල රන් පදක්කම දිනාගැනීම.



**සංසෛ උදංජය කේඩබ්අයි**

අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරගාවලිය පිරිමි යුගල තරගාවලිය සම ලෝකඩ පදක්කම දිනාගැනීම.





**කර්නල් කේවීපී ධම්මික යූඑස්පී පීඑස්සී සහ ලුති: කර්නල් ආර්සී විජේකෝන් යූඑස්පී පීඑස්සී**

අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරගාවලිය අවුරුදු 40 වැඩි පිරිමි යුගල තරගාවලිය රන් පදක්කම දිනාගැනීම.

 

<u>කපිතාන් එම්එම්කේඑන් විජේසේකර සහ සංසෙ උදංජය කේඩබ්අයි</u>

අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරගාවලිය පිරිමි යුගල තරගාවලිය රන් පදක්කම දිනාගැනීම.

 

<u>කපිතාන් ජේඒවයිඑස් ජයකොඩි සහ සංසෙ පුෂ්ප කුමාර එම්ඒඑස්</u>

අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරගාවලිය පිරිමි යුගල තරගාවලිය ලෝකඩ පදක්කම ගැනීම.



2021.03.20 දින පැවති හොකි තරගාවලියේ ප්‍රථම ස්ථානය දිනා ගත් 1 ශ්‍රී ලංකා සංඥා බලකා කණ්ඩායම





වොලිබෝල් තරගාවලියේ දෙවන ස්ථානය දිනා ගත් 1 ශ්‍රී ලංකා සංඥා බලකා කණ්ඩායම

# VOIP

VOIP යනු Voice Over Internet Protocol එයින් අදහස් කරන්නේ සාමාන්‍ය ස්ථාවර හෝ ජංගම දුරකථන ජාලයක් හරහා නොව අන්තර්ජාලය හරහා කරන දුරකථන ඇමතුම ලබා ගැනීමයි.

VOIP පද්ධතියක් ක්‍රියාත්මක වන්නේ Analog Voice Signals ගෙන ඒවා Digital Signal බවට පරිවර්ථනය කර පසුව Broadband Line මඟින් Data ලෙස යැවීමෙනි.

VOIP පද්ධතිය -

01. Landline Phone සහ VOIP Adapter
02. පරිඝණකයක්
03. Smart phone

VOIP තාක්‍ෂණය මඟින් සම්ප්‍රදායික දුරකථන සේවා Packet Switched Protocols භාවිතයෙන් පරිඝණක ජාල තුලින් වෙන්කරන ලද Slot හරහා ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබේ. Packet Switched VOIP මඟින් Voice Signal විද්‍යුත් ලියුම් හා සමාන කවරයකට (Packet) දමයි. එම VOIP Packet Local Area Network (LAN) වැනි ඕනෑම VOIP අනුකූල ජාලයක් හරහා සම්ප්‍රේශණ කළ හැකිය.




VOIP භාවිතයෙන් ලැබෙන වාසි -

01. එකම Broadband Phone Line මඟින් දුරකථන ඇමතුම් එකකට වඩා වැඩි ප්‍රමාණයෙන් සම්ප්‍රේෂණය කල හැකි වීම.

02. සාමාන්‍යයෙන් විදුලි සංදේශ සමාගම් විසින් අමතර ගාස්තු අයකරනු ලබන Call Forwarding, Caller ID හෝ Automatically Redialing වැනි විශේෂාංග බොහෝවිට VOIP තාක්‍ෂණය සමඟ සම්මත ලෙස ඇතුලත් කර ඇත. එපමණක් නොව ඒවා Configure සහ කළමණාකරණය පහසු වීම.

03. VOIP දුරකථන පද්ධතිය සාම්ප්‍රදායික දුරකථන පද්ධතියකට වඩා සැලකිය යුතු පිරිවැයක් ඉතිරි කිරීම.

04. සේවා ස්ථානයන්හි VOIP සන්නිවේදන පද්ධතියක් ඇති විට සේවා ස්ථානයේ නොසිටි වුවද භාවිතා කල හැක.

05. සම්පූර්ණ පද්ධතියම ක්‍රියාත්මක කිරීමට හැකි ලෙස ලාභදායි වීම.

කපිතන් වයිපී වන්නිආරච්චි

# FIFTH GENERATION MOBILE NETWORK (5G)

5G යනු 5 වන පරම්පරාවේ ජංගම දුරකථන ජාලයයි. 1G, 2G, 3G සහ 4G ජාල වලින් පසු නව ගෝලිය රැහැන් රහිත ප්‍රමිතිය, 5G වේ. මෙමගින් යන්ත්‍ර වස්තූන් සහ උපාංග ඇතුළුව සෑම කෙනෙකුටම සහ සෑම දෙයක්ම පාහේ සම්බන්ධ කිරීම සඳහා නිර්මාණය කර ඇති නව ආකාරයේ සක්‍රීය ජාලයකි.




5G රැහැන් රහිත තාක්ෂණය higher multi–Gbps peak දත්ත වේගය, අතිශය අඩු ප්‍රමාදය, වැඩි විශ්වාසනීයත්වය, දැවැන්ත ජාල ධාරිතාවල වැඩි උපයෝජ්‍යතාවය සහ වැඩි පරිශීලකයින්ට වඩාත් ඒකාකාරී පරිශීලක අත්දැකීමක් ලබා දේ ඉහළ කාර්යය සාධනය සහ වැඩි දියුණු කල කාර්යක්ෂමතාවය පරිශීලික අත්දැකීම් සවිබල ගන්වන අතර නව ව්‍යාපාර හා සම්බන්ධ කරනු ලබයි.

5G පදනම් වී ඇත්තේ OFDM (Orthogonal Frequency – Division Multiplexing) , මැදිහත්වීම අවම කිරීම සඳහා විවිධ නාලිකා කිහිපයක් හරහා යවන digital signal modulate කිරීමේ ක්‍රමයක් මතය. 5G OFDM මූලධර්මය සමග 5G NR (New Radio) Air interface භාවිතා කරයි.

4G LTE මෙන්ම 5G OFDM ක්‍රියාත්මක වන්නේ එකම ජංගම දුරකථන මූලධර්මය මතය. කෙසේ වෙතත් නව 5G NR Air interface මගින් OFDM තවදුරටත් වැඩි නම්‍යශීලි බවක් සහ පරිමාණයක් ලබා ගත හැකිය. 5G ප්‍රවේශය විවිධාකාර ලෙස භාවිතා වන අවස්ථා සඳහා උදාහරණ පහත සඳහන් පරිදි දැක්විය හැක.

අ. නිෂ්පාදන කාර්මාන්තය (Manufacturing)
ආ. බලශක්ති හා උපයෝගිතා (Energy and Utilities)
ඇ. කෘෂිකර්මාන්ත (Agriculture)
ඈ. ජනමාධ්‍ය (Media )
ඉ. සෞඛ්‍ය හා වෛද්‍ය විද්‍යාව (Health Care)
ඊ. ප්‍රවාහනය (Transportaion)
උ. මූල්‍ය (Finacial)

4G හි භාවිතා කරන Sub – 3GHz සිට 100GHz දක්වා හා ඉන් ඔබ්බට පුළුල් කලාපයක් තුළ 5G භාවිතා කල හැකිය. 5G low bands (Sub – 6 GHZ) දෙකෙහිම මෙන්ම mmWave (24 GHZ and Up) හී ද ක්‍රියා කල හැකි අතර එමගින් වැඩි ධාරිතාවක් Multi – Gbps ප්‍රතිදානය සහ අඩු ප්‍රමාදය ගෙන එනු ඇත.

5G නිර්මණය කර ඇත්තේ 4G LTE හා සසඳන විට වේගවත් වඩා හොඳ mobile broadband සේවාවන් සැපයීමට පමණක් නොව mission critical communication සහ IOT (Internet of Things) සම්බන්ධ කිරීම වැනි නව සේවා ක්ෂේත්‍රයන් දක්වා ව්‍යාප්ත කල හැකි වීමටය. මෙමගින් නව 5G NR Air interface සැලසුම් ශිල්පීය ක්‍රම සඳහා උදාහරණයක් ලෙස නව ස්වයං අන්තර්ගත උප රාමුවක් TDD (Time Division Duplex) වැනි ක්‍රම සක්‍රීය කිරීම.

5G නිර්මණය කර ඇත්තේ IMT (International Mobile Telecommunication) – 2020 අවශ්‍යතා මත පදනම්ව උපරිම දත්ත අනුපාතය 20 Gbps දක්වා ලබා දීමටය.

ලුතිනන් එම්පීඩීපීඑස් ගමගේ

# MOBILE JAMMER

Mobile Jammer යනු බාධකයක් නිර්මාණය කිරීමට ජංගම දුරකථන සහ Mobile Base Station අතර සම්ප්‍රේෂණය අවහිර කිරීම සඳහා භාවිතා කරනු ලබන උපකරණයකි.

Mobile Jammer මගින් ජංගම දුරකථන සංඛ්‍යාත හා සමාන සංඛ්‍යාතයක් වැඩි බලයකින් සම්ප්‍රේෂණය කර ජංගම දුරකථන හා Mobile Base Station අතර සන්නිවේදනය බිඳ දමයි. මෙම හේතුවෙන් ජංගම දුරකථන හා කුළුණු සන්නිවේදනයට බාධා ඇතිවන අතර දුරකථන භාවිතයට ගත නොහැකි වේ.

Mobile Jammer කොටස් තුනකින් සමන්විතය.

01. Power Supply (බල සැපයුම)
Mobile Jammer තුළ ඇති සියලුම කොටස් සඳහා අදාල වෝල්ටීයතාවයන් සමග විදුලි සැපයීම මෙහි කාර්යයයි.

02. Jamming Module
ජංගම දුරකථන භාවිතා කරන සංඛ්‍යාතයන්ට සමාන සංඛ්‍යාතයන් පරාසය තුළ සංඥා නිකුත් කිරීම මෙමගින් සිදුකරනු ලබයි.

2G - 860 - 960 MHz
3G - 2110 - 2170 MHz
4G - 1805 - 1920M MHz

03. Cooling System
Jammer නිතරම භාවිතා කිරීමේදි ජනනය වන තාපය පාලනය කිරීමට Heat Sink සහ පංකා (Fan) භාවිතා කරයි. Heat Sink යනු නිශ්ක්‍රිය තාප හුවමාරුවකි. මෙමගින් ජනනය වන තාපය වාතයට මාරුකර ජැමරයෙන් ඉවතට විසුරවා උෂ්ණත්වය නියාමනය කරනු ලබයි. පිටතින් සිසිල් වාතය ඇද ගැනීමටත් ඇතුලත සිට උණුසුම් වාතය පිටකිරීමට සහ Heat Sink හරහා සිසිල් වාතය ජැමරය වෙත ගෙන යාමට Fan භාවිතා කරයි.

ලුතිනන් ආර්එම්සී නිලුෂාන්

# Free PBX

FreePBX, the world's most popular open source IP PBX, gives users the tools to build a phone system tailored to their needs. It is a very powerful system, including far more features.

The easiest way to install FreePBX is to download and install the FreePBX Distro. This includes everything needed for a fully-functioning FreePBX system, including the operating system. In inside,

01. FreePBX graphical user interface (GUI)
02. Linux operating system
03. Asterisk communications platform

A dedicated machine is required to run the software. Ideally, this system should be the only OS that is utilized on the machine and it must always be running for your phone system to function.

After installation, we will have a fully functioning FreePBX system, ready to configure for phones and SIP trunks. =your PSTN lines.




Lady Officer Cadet MLLI Jayasundara

## ජයට මග කියන පරාජය

අප සියලු දෙනාගේම සිහිනය ජය ලැබීමය. ඒ අරමුණින් අපි කැප වී වැඩ කරමු. කෙසේ වුවද අප ජිවත්වන ප්‍රායෝගික ලෝකය තුල පරාජයට පත් නොවුවකු සොයා ගැනීම අසීරුය. ඒ මක් නිසාද යත් ලෝකයේ ඉතා සාර්ථකම පුද්ගලයන්ගේ සිට අසාර්ථකම පුද්ගලයන් දක්වා සියලු දෙනාම තම ජීවිතය තුලදී අඩු වැඩි වශයෙන් පරාජිත අත්දැකීම් වලට මුහුණ දි තිබීම නිසාය. එලෙස පරාජිතවීම අධ්‍යාපනික, වෘත්තිමය, ගෘහ ජීවිතය තුල සේම සමාජය ජීවිතයේ වැනි ඕනෑම ක්ෂේත්‍රයක සිදුවිය හැකිය.

එහෙත් සාර්ථක හා අසාර්ථක පුද්ගලයින් අතර, ප්‍රධාන වෙනස වන්නේ ඔවුන් පරාජය දෙස බලන ආකාරයයි. සාර්ථක පුද්ගලයා සිය පරාජය දෙස ධනාත්මකව බලද්දි අසාර්ථක පුද්ගලයා සිය පරාජය දෙස අසුබවාදිව බලයි.

සෑම විටම සාර්ථක පුද්ගලයෝ හා ජයග්‍රාහකයෝ සිය පරාජය, ඉගනීමේ අවස්ථාවක් කර ගත්හ. ඒ නිසාම ඔවුන් කිසිවිටකත් තමන් ඉදිරියට පැමිණෙන පරාජයට බිය නොවුහ. ඔවුහු ජීවිතයේදී තමන්ට අවශ්‍ය සෑම ව්‍යාපෘතියකටම පැකිලීමකින් තොරව මුල පිරූහ. තමා ලද පරාජය ජිවිත ජයග්‍රහනය කරා යන ගමනේදි ධෛර්යයක් කර ගත්හ. පරාජයට සාර්ථකව මුහුණු දිම සාර්ථක ආරම්භයකට මුල පිරීමක් බව විශ්වාස කලහ. තමන් ලද අති විශාල පරාජය හමුවේ වුවද, ජයග්‍රහනයේ සිහිනයෙන් අවදි නොවුහ. ලෝකය දිනු බොහෝ පුද්ගලයින් පරාජය දෙස බලන ආකාරය සලකා බැලිම තුලින් ඔවුන් පරාජය ජයගත් සැටි අවබෝධ කරගත හැකිය.

විදුලි බල්බය සොයා ගැනිමට තැත් කිරීමේදි 1200 වතාවක් පරාජයට පත් වු ශ්‍රේෂ්ඨ විද්‍යාඥ තෝමස් අල්වා එඩිසන් පැවසුවේ, මම බල්බය සොයා ගැනිමේදි පරාජයට පත් වුවෙමි. එහෙත් 1200 වතාවක් බල්බය වැඩ නොකරන ආකාරය සොයාගැනිමට සමත් වුයෙමි, යනුවෙනි. ඔහු 1201 වැනි උත්සහයේදි බල්බය සොයා ගත්තේය. සුප්‍රසිද්ධ දාර්ශනිකයකු වු කොන්ෆියුසියස් පැවසුවේ, අපගේ ඉහලම උද්දාමය කිසිදිනක නොවැටී සිටීම නොව වැටුනු සෑම විටම ශක්තිමත්ව නැගි සිටීම බවය. සුප්‍රසිද්ධ විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින් පැවසුවේ සෑම පරාජයක් තුලම ඉතා අගනා ජයග්‍රහනයකට අවස්ථාවක් ඇති බවය. වින්ස්ටන් චර්චිල් පැවසුවේ, බුද්ධිමත් පුද්ගලයකු කිසිදිනක පරාජයෙන් පසු නොබසින බවය.

ශ්‍රී ලාංකිකයන් ලෙස අප අද මුහුණදී ඇති "පරාජය" සම්බන්ධ ප්‍රධානම ගැටලුව වන්නේ අප තුල පවතින ආකල්පය. අපි පරාජයට ඇති බිය නිසාවෙන් ජීවිතයේ අවශ්‍යතාවයන් හා අරමුණු කරා ගමන් කිරිම සඳහා මුල පිරීමට පසුබට වෙමු. අපි විභවයන් සුලු ප්‍රමාණයක් පමණක් භාවිතාකර සාමාන්‍ය මට්ටමේ ජීවිතයක් ගත කරමු. එම නිසා සැමදා එකම මට්ටමකට කොටුවේ. සිය පවුලට, තමාට, සමාජයට හා රටට කල හැකි සේවය හරිහැටි ඉටු නොවේ. අපි ගමන් කල හැකි දුරට වඩා අඩු දුරක් ගමන් කර ඒ පිළිබද අතෘප්තිමත්ව ජිවත්වෙමින් සිටිමු.

ශ්‍රී ලාංකිකයන් ලෙස ලෝකයේ විශිෂ්ඨත්වයට පත්විය හැකි බොහෝ දෙනා සිය ශක්තිය අපතේ හැර සිටිති. තම අරමුණ හා සිහින වලට ගමන් කිරීම වෙනුවට වෙනත් පුද්ගලයින්ගේ සිහින හා අරමුණු වලට කොටුවී සිටිති. බුද්ධිය හා දක්ෂතා භාවිතා නොකිරීම තමන්ටම සිදුකර ගනු ලබන අසාධාරණයකි. එම නිසා කල යුතුව ඇත්තේ අවශ්‍ය මුල පිරීම හා ව්‍යාපෘති හැකි ඉක්මනින් ආරම්භ කිරීමට කටයුතු කිරිම හා අදාල කාර්යයේ යෙදී සිටියදි මුහුණදිමට සිදුවන පරාජය තාවකාලික යැයි සිතා එය ඉගෙනිමට අවස්ථාවක් කර ගැනීමය.

එවිට ඔබ විශිෂ්ඨයකු, ජයග්‍රාහකයකු, තෘප්තිමත් ශ්‍රී ලාංකිකයකු වන ගමන කිසිවකුට හෝ වැලැක්වීමට නොහැකි වනු ඇත.

**ලුතිනන් බීඑම්ඩී ප්‍රනාන්දු**

## අන්තර්ජාලයේ වාසි සහ අවාසි

| වාසි | අවාසි |
|---|---|
| ➢ සම්බන්ධතාවය, සන්නිවේදනය සහ බෙදාහැරීම පහසුකරයි | ➢ ඇබ්බැහි වීම, කාලය නාස්ති වීම සහ බාධා ඇති වීම |
| ➢ තොරතුරු ලබාගැනීම, දැනුම සහ ඉගෙනීම | ➢ අපරාධ සිදුවීම |
| ➢ ලිපිනය, සිතියම්ගත කිරීම සහ සම්බන්ධතා තොරතුරු ලබාගැනීම | ➢ අසභ්‍ය සහ ප්‍රචණ්ඩ රූප |
| ➢ විකිණීම සහ මුදල් ඉපයීම | ➢ කිසි විටකත් රැකියාවෙන් නික්මීමට නොහැකිවීම |
| ➢ බැංකු කටයුතු, බිල්පත් සහ සාප්පු සවාරි | ➢ අනන්‍යතා සොරකම්, අනවසරයෙන් ඇතුලුවීම, වෛරස් හා වංචා කිරීම |
| ➢ විනෝදාස්වාදය | ➢ අවධානය සහ ඉවසීම කෙරෙහි බලපායි |
| ➢ නිවසේ සිට වැඩ කිරීම, සහයෝගිතාවය සහ ගෝලීය ශ්‍රම බලකායට ප්‍රවේශය | |

**කෝප්‍රල් පුෂ්පකුමාර ටීඑම්එන්**

# රේඩාර් සහ ඒවායේ ක්‍රියාකාරීත්වය

RADAR කියන්නේ ඇත්තටම තනි වචනයක් නෙවෙයි. වචන 4 ක කෙටි යෙදුමක්. ක්‍රි:ව 1940 දි එක්සත් ජනපදය නාවික හමුදාව මෙම තාක්ෂණය ගුවන් විදුලි දිශා හා පරස මැනීම (RADIO DETECTION AND RANGING) ලෙස හඳුන්වාදුන් අතර පසුව එහි කැපිටල් අකුරු ඉවත් කර RADAR ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් නාම පදයක් බවට පත්වුහ.

අපිට එදිනෙදා දේවල් ඇස් දෙකෙන් දකින්නට හැකිවෙන්නේ සූර්යාලෝකය අපි අවට ඇති වස්තුගේ වැදී පරාවර්තනයවී අපේ ඇසටද ඇතුළුවන නිසාවෙනි. ඔබට රාත්‍රියේදී ඇවිදින්නට අවශ්‍ය වුනොත් විදුලි පන්දමකින් ඉදිරියේ ඇති වස්තූන්ට ආලෝක කදම්බයක් යොමුකර ඉන් පරාවර්ථනය වන ආලෝකය දැසට ලබා ගැනීමෙන් ඉදිරියට යා හැකිය. මෙසෙ ඇසට ලැබෙන ආලෝකය අනුව මොළය විසින් එම වස්තුවෙන් කුමන ආකාරයෙන්ද කෙතරම් දුරකින් තිබෙනවාද යන්න ගණනය කරගනු ලබයි.

## රේඩාර් යන්ත්‍රවල ආරම්භය

ඉතා දුර ඇති දෑ හඳුනා ගැනීමට ඈත අතීතයේ පටන්ම මානවයාට අවශ්‍යති පැණ නැගි ඇති අතර ඒ අනුව පෙනිමකින් තොරව වෙනත් උපක්‍රම භාවිතයෙන් හෝ දුර දර්ශනයක් ඇති කර ගැනීමේ එක් අදියරක් ලෙස රේඩාර් වෙත යොමු වන ලදී. 1886 දි ජර්මන් විද්‍යාඥනයකු වන හයින්රික් හර්ටස් ප්‍රථම වරට රේඩියෝ තරංග ඝන ථිව්‍ය වලින් පරාවර්ථනය වන බව පෙන්වා දෙන ලදි.



## සෝනාර් (SONAR )

Radar වල රේඩියෝ තරංග වෙනුවට Sonar වල ශබ්ද තරංග භාවිතයට ගැනෙනවා. මෙම ක්‍රමය ප්‍රථම වරට මානවයින් භාවිතා කල බවට සාධක 1490 දි ලියනාඩෝ ඩාවින්චි විසින් සටහන් කරන ලදි.

## රේඩාර් යන්ත්‍ර වල ව්‍යුහය ක්‍රියාකාරීත්වය

ගුවන් යානයක නැවක හෝ භූමියේ වුවත් රේඩාර් යන්ත්‍රයන්ගේ සැකැස්මට මූලික පද්ධති හතරක් දායක වේ.

1. ගුවන් විදුලි තරංග (විද්‍යුත් චුම්භක තරංග) ජනකය

   මෙම කොටසේ ඇති මැග්නිට්‍රෝන් නම් උපාංගය මගින් විද්‍යුත් චුම්භක තරංග ජනනය කරනු ලබනවා. එමගින් තරංග ආයාමය සෙ:මි 1 සිට මීටරය දක්වා පමණක් වු මයිකෝ තරංග ඇති කරනු ලබනවා.

2. තරංග ජනක සහ ග්‍රාහක පාලකය

   තරංග ජනනය කරන අතරතුරේ පරාවර්තිත ඒවා ලබාගන්නට නොහැකි වන නිසා එක් අවස්ථාවකදි තරංග ජනනය කිරීමත්, ඉන්පසු පරාවර්තනය වන තරංග ලබා ගැනීම පහසු කරවීමට ජනනය නැවතීමටත් මෙම කොටස තරංග ජනකයේ ස්විචයක් ලෙස ක්‍රියා කරනු ලබනවා.

3. තරංග අභ්‍යකාශයට මුදා හරින ඇන්ටනාව

   තරංග නිපැයීමෙන් අනතුරුව ඒවා තමා ඉදිරියේ ඇති අවකාශය වෙත යොමු කරනු ලබන්නේ ඇන්ටනාව විසිනුයි. එසේම තරංග ජනනය නවතා ඇති විට පරාවර්තිත තරංග ග්‍රහණය කොට විශ්ලේෂකය වෙත යවන්නටද ඇන්ටනාව ක්‍රියා කරනු ලබනවා.

4. විශ්ලේෂණය කොට විස්තර දැක්වීම

   විශ්ලේෂකය විසින් ලැබුණු තරංග අධ්‍යනය කොට ඉන් ගොඩනැගිලි, කුරුල්ලන් භූ පරාවර්තන වැනි අනවශ්‍ය දෑ ඉවත් කර සිතියමක් වශයෙන් මානව ක්‍රියාකරුවෙකුගේ අධීක්ෂණය ලබන තිරය වෙත යොමු කරනවා. මෙහිදි අදාල වස්තූන්ගේ දුර සහ වේගය ද ගණනය කරනු ලබනවා.






බනි 11 සුසන්ත වීඑම්එන්

# කැටපත් පවුර

## දුවක සෙනෙහස ලැබෙනවා නම්

නොතිත් බාධක බිඳ හෙලන්නම්
සතුරු සේනා පරදවන්නම්
කඳුලු බිඳුවක් නොම හෙලන්නම්
දුවක සෙනෙහස ලැබෙනවා නම්

සැහැසි ඉසි බස් ඉවතලන්නම්
කුහක කෙනෙහිලි ඉවසගන්නම්
ලොවක සිනහව දරාගන්නම්
දුවක සෙනෙහස ලැබෙනවා නම්

වෙහෙසි සිත යලි පුබුදුවන්නම්
විඩා ගත යලි පන පොවන්නම්
නැවුම් පැතුමන් ආසිරි දෙවන්නම්
දුවක සෙනෙහස ලැබෙනවා නම්

මලෙක පෙත්තක මෙලෙක් බව
හිමිදිරියේ හිරුගේ ප්‍රභාතය
සඳුගෙ එලියෙහි සොමි සිහිල් බව
දුවක සිනාවක ඒ සියල් ඇත

ලොවම ඒකාලෝක කරවන
සිතන විටදිත් සතුට වස්සන
ඇස් පියෙන විටදිත් මැවී දිස්වන
දුවක මහිමය පියෙකුටම අරුමය

**මේජර් ටීඩීටී විජේසිංහ ශ්‍රීලංසංබ**

## නොමියෙන මතකය

හවසට මමත් බෝ මලුවේ    නැමදිය
සිත තුල මගේ මෙත් සිතිවිලි
ඇතිවිය
ගුණ දම් වලින් මගෙ සිත දැන්    සවිබලය
සමාජයට මිණි පහනක්    වන්නේය

වේයා තුඹස හදයි නිසි    වෙලාවට
බළලා නටයි මීයා නැති    වෙලාවට
කවුරුත් ඉදියි අතමිට සරු    වෙලාවට
කොයි කව්රුත් නැත මට වැරදුනු    වෙලාවට

තුමණි අවසරයි සබයෙන්    අවසරය
අවසන් කතාවකි මේ    මිමිණීය
ඔබලගේ සිත පිරිදි මා යහපත්    වේ ය
ඔබලට තුති පුදමි මා හෙට යා    යුතුය

මා ගිය පාර වැරදිය සිරගෙට    ආවා
මනසින් මෙන් ම ගතිනුත් අසරණ    වූවා
තිරිසන් සතෙකුටත් මේ දුක    නොදැනේවා
නිදහස් වෙලා මා හෙට මින්    පිටවෙනවා

උපන් ගම මගේ පින්බර    කළුතරය
මග නේවා දුන්නු ඔබලා    සිතතුලය
ඔබලා ආවොතින් කොළඹ ට    වැඩමුරය
මට ඇමතුමක් දෙනු මැන මම    කළුතරය

**සෙ/278927 ලා/කෝ ශ්‍රීමාල් කේඑපී**
**3 ශ්‍රීලංසංබ**

## අහිමි පෙම

කාත් කව්රුත් නොමැතිව මගතොට යනෙන විට
මා තනිවෙලා
ඇවිදලා මගෙ සිත පුරා ගියේ කවුරුන්දෝ
මතකය තියා
සුවඳ විතරක් ළග තියා ඔබ යන්න හැදුවාම
මා දමා
දන්නවාද මගේ සිතම හැඩුවා පෙම නමින්
ඉකිගසා
ලංවෙලා මගෙ ලගම දැවටි සුරතලෙන්
දෙනුවන් වසා
කඳුලු බිංදු දෙකොපුල් මත දැවටී යහන මත
වැටෙනා තුරා
දමා යන්නට නොහැකි තැන මම වින්දේ සුව
අපමන සදා
ඒත් අහිමියි නුඹේ පෙම මට
ඔයා අන්සතු වුණු නිසා

**සෙ/280666 කෝප්‍රල් සම්පත් කුමාර එච්එම්එම්**
**3 ශ්‍රීලංසංබ**

## ජීවිතය

සැම සෙවන ගසක් යටම
කෙනෙකු නැවති ඇත
කෙනෙකු නැවති සිටි සැම තැනකම
සෙවන ගසක්ද නැත
නොගැලපිම ගලපා ගත යුතුය

**සෙ/289889 සංසෙ රත්නායක ආර්එම්පීඑම්**
**3 ශ්‍රීලංසංබ**

## හැරගිය පෙම්වතිය

රත්තරං ඉස්තරම් නුබ ලිව්ව
පෙම්වතුන් ඒ තරම්
මං තරම් රුවටුනේ
නැ කෙනෙක් මේ තරම්

වේදනා විදි තරම් නුඹ දන්නේ
නෑ මගේ රත්තරං
නොදැන හෝ කල පවක් ගෙවන මා
නුබේ පෙමක් හරි බරක්

ඒ තරම් රත්තරං නොවටිනා බව
දැන හිටියානම්
කාලයක් පණ අරන් පසුපසින්
එන්නේ නැ රත්තරං

**සෙ/285092 ලා/කෝ තරංග එන්එච්පී**
**3 ශ්‍රීලංසංබ**

## සැබෑ ආදරය

මේ ආදරය ලැබුනේ ඔබට
ආදරය කිරීමට පමණයි
මේ දෑස ලැබුනේ මට ඔබව
දැකගන්නට පමණයි
මේ සවන් ලැබුනේ ඔබේ වදන්
අසන්නට පමණයි
ඉතින් මම සුසුමක් වෙන්නම් ඔබේ
හදවත පමණක් සිඹින්න
මම කදුලක් වෙන්නම් ඔබේ
හදවත පමණක් තෙමන්න
මම හසරැල්ලක් වෙන්නම් ඔබේ
හදවත පමණක්ම දැකගන්න
මම පෙරුම් පුරන්නම් දිවිතුරු ඔබ
මගෙම කරගන්නට හැමදාම.........

**සෙ/285799 ලා/කෝ අනුරාධ ඒඩබ්එච්පී**
**3 ශ්‍රීලංසංබ**

## සංසාර ප්‍රේමය

සැනසෙන්නට බැරි වේදනාවන්
සිතන්නට පවා අකමැති
වෛර බදින
අතීතය මතකයට නැගෙන හැම විටම
මැරි මැරි උපදිනවා
සංසාර ප්‍රේමය
අනන්ත අප්‍රමාන වාරයක් පාසා
මේ ආත්ම භවයේ
දෑසට උරුම වු
උණු කඳුල
ගලාවිත් වැටියන් පපුමතට
නිවාලන්නට උහුලන්නට බැරි ගින්දර

**සෙ/284936 සංසෙ ප්‍රියන්ත ඒඑසී**
**3 ශ්‍රීලංසංබ**

## මතකය

හිරු නැග එයි
නැවත වැසී යයි
වසන්තය නෑ හිනාවෙන්නේ
කෙනෙකු හමුවෙයි
නැවත වෙන්වෙයි
මතකය පමණයි ඉතිරි වන්නේ

**ලා/කෝ මධුශංඛ එස්එච්ඒඑම්එන්**
**11 ශ්‍රීලංසංබ**

## අහිමි නුඹ

මහ වැස්සේ
තෙමිගෙන උනත්
ඉන්න පුලුවන්

දරුණු පැවිල්ලක්
ඉවසාගෙන
ඉන්න පුලුවන්

නුඹ නොදැක්කා වගේ
ඉන්න එකයි
දරාගෙන ඉන්න බැරි

**සෙ/285536 සංසෙ රත්නායක ආර්ඒජේ**
**3 ශ්‍රීලංසංබ**

## යුද්ධ හමුදා සේවය

බැදෙන්නට යුද්ධ හමුදාවට
හිතක් තිබුනේ නෑ කවදාවත්ම
නොසිතූ එක් දිනයක
හදිසියේ බැදුනා යුද්ධ හමුදාවට

දවසින් දවස ගෙවුනා යුද්ධ හමුදාවේ
දැනට දශකම වර්ෂයක් ගෙවුවා යුද්ධ හමුදාවේ
දශකම වර්ෂයක අතීතය මට
සිහිපත් වනවිට සතුටුයි දැන්නම් මට

තව ටික කාලයයි ඉන්නේ යුද්ධ හමුදාවේ
ඒ ටික කාලයක් වැඩකරනවා කැපවී හමුදාවේ
විශ්‍රාම ගිය දවසක යුද්ධ හමුදාවෙන්
කරපු හොද/නරක වැඩ සිහිකර කර ඉන්නයි අපට ඇත්තේ

සෙ/279065 මා/සැරයන් රවීන්ද්‍ර සීආර්සී
5 ශ්‍රීලංසංබ

## සෙබළ බිරිඳ

මහත්තයෝ පරිස්සමට ඔයා වැඩට ගිහින් එන්න
මන් ඉන්නම් නුබ එනකම් අම්මා එක්ක මග බලාන
කෑම්ප් එකට අරන් යන්න කැවිලි ටිකක් හැදුවා මම

යාළුවෝ ටිකටත් දිලා ඔයත් එකක් දෙකක් කන්න
තුවක්කුවක් පපුවෙ දරන් ඔයා ඉන්නවා බලන්න
අසයි සුදු මහත්තයෝ නිල ඇදුමෙන් ගමට එන්න

ඉක්මනටම මේ තනිකම මකන්න
මට පුතෙක් දෙන්න ඔයාගෙ ඔය මුන තියන
පුතෙක් හදින් අරන් එන්න

බංකරයේ දුක් විදින්න පුළුවන් බව දන්වා මම
ඒ වුනට මහත්තයෝ පරිස්සමෙන් වැඩ කරන්න
මොනවා වුනත් ඔබේ තනියට ඉන්නා බව
මතකේ ටිකක් තියා ගන්න

සෙ/287239 සංසෙ ලක්ෂාන් කේසී
5 ශ්‍රීලංසංබ

## ඉපදීම

මරණයේ තොස
ගනි නම් කිපයකි තත්පර
විදිගෙන දුක
මාස නම් දහසක්
චන්ද්‍ර පෙලහරක් පාමින්
අසමසම ලේ විලක් පිපේ
සුදු නෙළුම් මල
එකම ජීවිතය දෙපළු කල
කතුරු මුවාත දකී
දුන් කුටු කඳුළු එකවර
ස්නේහ මේ තුලින් බර
අසනි කිරි වරුසා
හැඩුමකට අතැහැරෙන
ලෙවන් ඇස් කටු
සියොලගම පහරන
ලය පවා සිදුරු කල
බැණුම් පිහි උන් විසිකල
ඉවසාන නැගිටින
දෙපාවකි වෙව්ලන
කර්මකාරක අතීත කාල ක්‍රමයකට
ලියා ගත්තද ජීවිතේ තේරුම
කිරි එරෙන්නේ අම්මාවරුන්ට විතරමය

සෙ/2108670 ආසෙ ප්‍රසාද් කේසී
5 ශ්‍රීලංසංබ

## කොරෝනා

උදා විය සුන්දර
එයද වෙනදා මෙන් නැවුම් විය
නමුත් අපි උඩගු විය
මන්දයත් අප සිතුවේ එය නිමා වූ බවයි
නමුදු අද අපි දැලකට හසු වූ
කුරුල්ලන් මෙන් බිය වී ඇත
කල යුත්ත අමතකව මේ කරන විලාසය
අපායක් වී ඇත මිහිපිටම
එක්ව ජය ගමු කල යුත්ත
සිදු කරමු හෙට ලෝකය වෙනුවෙන්

සෙ/2108248 ආසෙ නිසංසල අයිඑච්
5 ශ්‍රීලංසංබ

## සිහිනය

නිල ඇදුමෙන් පැලද හමුදාවට යන්න
ආසයි මෙමට විරු සෙබලෙක් ව ඉන්න
රට වෙනුවෙන් මාගෙ ජීවිතේ හරි දෙන්න
තව ටික කාලයයි හමුදාවට යන්න

එකත් එකට සුදුසුකම් සපුරාලා
ඉන්නවා මෙවන් මාගෙ දිවියම කැපකරලා
නිල ඇදුමෙන් විරු යුතුකම් ගරු කරලා
රට රකිනවා මාගෙ දිවියම පුද දිලා

කුඩාකල සිටම මාගෙ වෘත්තිය හමුදාව
සැවොම කියයි මට උරුමළු හමුදාව
සෙබලෙක් වී රකින්නම් මගෙ ලක් අම්මාව
ආසයි මේ මට ඉක්මනට එක්වන්න

රටට ණය නැති පුතෙකු වී බිහිවෙන්න
නිල ඇදුමද ඉක්මනට පලදින්න
තව ටික දිනයි හමුදාවට යන්න

සෙ/2108250 ආසෙ රාජපක්ෂ ආර්එම්ඩීපී
5 ශ්‍රීලංසංබ

## ආලය

දිදුලන පුංචි තරු කැට
ගොන්නක් පායපු රැයක
ඒ සුවිසල් අහස දිහා
මොහොතක් බලන්න

ඔයාට එයාවම අමතක වෙවී
ඒ ආසයි එයාගෙම කර ගන්න හිතේවි
උගුලන්, බැරි තරු තියෙන
හිතා ගන්න බැරි තරම් සුවිසල්

අහස අපේ කර ගන්න බැනේ
එත් ඒ ලස්සන දිහා බලබල
සතුටු වෙන්න පුළුවන් හැමදාමත්
එතකොට ඒ අහසටත්
දුරින් ඉන්න අපිටවත්
කවදාකවත්ම දුකක් නොදෙනෙවී

සෙ/2108957 ආසෙ රූනපහන ආර්එආර්සීබී
5 ශ්‍රීලංසංබ

## අසම්මත පෙම

ඉඩෝරය හුරු වෙච්ච මේ හිතට
නුබෙ වචනයක් හරි හයියක් මේ හිතට
නොහිතපු වෙලාවක වැටුන
මේ ආදර වැස්ස

වැටෙන්නට ආසයි තුන් හිතම තෙමෙන්නට
අසම්මත පෙමක් උනත් නුබ මගේ හිතට
එලිය කලා මගේ මුළු ජීවිතය
හැබැවට මගේ කර ගන්න බැරිවුනා නුබ

ආදර වැස්සක් සැලි
සසල උනා මගේ ජීවිතය
ආදරෙයි තාමත් නුබට
මගේ හුස්ම තිබෙනා තුරාවටම

හමුවෙන්න කියා පතනවා මගේ හුස්ම
නවතින්න මොහොතකට කලින් හරි
ඒ තරම් ආදරෙයි
මට ලැබුනු අසම්මත පෙමට

සෙ/2108241 ආසෙ කුමාර එල්පීආර්ජී
5 ශ්‍රීලංසංබ

## සිතුවිල්ල

කැලැන්ඩරයේ පිටු දහස් ගනනක
ඔබේ මතකය ලියා ගත්තම
මාස ගාණක පිරුණු පුන් හඳ
එක්ක ඇති මගේ රහස් ගෙත්තම
යන්න යනකොට දුන්නු අර පොඩි හාදුව
ගිහිං එනකල් පරිස්සම වී ඇති පුපුව මැද්දේම
ආල කුටියක සෙබළ හදකින්
සෙනෙහෙ ලැබුමට පින් කර
ඇති මම ආත්ම ගානක්..

සෙ/287387 සංසෙ කන්නන්ගර ඩීඩී
5 ශ්‍රීලංසංබ

## අභියෝග

ඇස් දෙක ලස්සනයි කියලා
පිළිගන්න බොහෝ දේවල්
හදවත පිළිගන්නේ නෑ
ඒත් කවදාමහරි දවසක
හදවත ලස්සනයි කියලා හිතන දේවල්
ඇස් දෙකට දකින්නම සිද්ධ වෙනවා........

නුපන් පැතුම් බර ලොවක සිහින
මවමින්
මුහුණ දෙන්නට ඇති අභියෝග හමුවේ
හඬා වැටෙන්නට එපා
සතුටත් වේදනාවත් එකසේ දරාගෙන
මුහුණ දෙන්න හෙට දිනයට
උදා වේවා ඔබ හට ලස්සන සොඳුරු
දිනයක්........

සෙ/279239 මා/සෑ අතාවුද ඒඒඑන්එස්
7 ශ්‍රීලංසංබ

## පියාණෙනි ඔබ

වනයේ විකසිත සුවඳ මලකි ඔබ
මගේ දිවියේ ඝනදුර මැකුවා
ඔවදන් දුන්නා සැරවැර කෙරුවා
ඌදරයෙන් සැමදා

හද තුල සෙනෙහෙන් මා නළවා
ආදර බර වදනින් අමතා
මා රැක ගත්තා ඇති දැඩි කෙරුවා
කරුණාවෙන් සැමදා

ඔබ වැනි කෙනෙකුන්
නැත මේ ලෝකේ
බුදුහිමි ගුණයට සමාන ගුණ ඇති
පියාණනි ඔබ

අව්වැසි නොබලා දහඩිය හෙලුවා
හඬනා විට මා ලග සිටියා
මා ජය ලැබූ දා මා දිරි ගන්වා
පියතුම ඔබ මා ලග උන්නා

සෙ/279415 සැරයන් සේනාරත්න ඒටීඑස්
7 ශ්‍රීලංසංබ

## අම්මා

උපදින මොහොතේ
පමණක් පෙකණි වැලෙන්
වෙන් කලත්
මිය යන තුරුම
වෙන් කරන්න බැරි
එකම බැඳීම
අම්මා........

සෙ/282900 කෝප්‍රල් සංජීව හේරත් එච්එම්පීඩී
7 ශ්‍රීලංසංබ

## අම්මා

පන්හිඳ දෑතට ගෙන
සිත පිටත් කර හැරියෙමි
සොයා පැමිණෙන්න
උපමා උපමේය
ගලපා ගැනුමට
අම්මේ........
ඔබේ සෙනෙහස සමග
නමුත්........
ගිය ලෙසින් ම
සිත යළි ඇවිදින්
සොයා ගත නොහැකිව
උපමා........
ඔබේ සෙනෙහසට
සම කරන්නට
අම්මේ........
එනිසා ගොතමි
රස අහිමි පද වැල්
ඔබේ සෙනෙහස
හඳුනන්නේ ඔබේත්
මගේත් දෙසිත
පමණයි........

සෙ/280737 මා/සෑ රත්නායක ඒආර්එම්
7 ශ්‍රීලංසංබ

## ප්‍රේමය

වෙලී එතෙනා
මොහොතක දැනෙනා
සිතුවිල්ලකට

"ප්‍රේමය" යැයි නොකියන්න

බිඳී වෙනවී හැරගියත්
යළි සිහිවෙලා
කකියන මතකෙට

"ප්‍රේමය" යැයි පවසන්න

ලා/කෝ රත්නායක ආර්එම්එම්පී
6 ශ්‍රීලංසංබ - 641 බසේමු

## සොඳුරු ප්‍රේමය

නින්ද නොයයි පාලුව රජවෙයි
සිතුවිලි පැටලෙයි
නෙත් කෙවෙමින් කඳුලින් බොඳවෙයි
එපා නිහඬව සිටින්නට
පවසන්න සිතුවිලි නුඹ සිත..
බලා සිටිමි ඔබ එනතුරු
හද කුටියේ දොරගුලු ඇර
නුබයි මා පිවිතය..
නුබයි මා හද ගැස්ම
නුබට මා කෙතරම් ආදරෙයිද
නුබට කෙතරම් මා දයාබරද
නුබ වෙනුවෙන් බැඳි සෙනෙහස
ඔබෙයි මා හැමදාම..

සෙ/28581 ලා/කෝ සෙනෙවිරත්න එම්බීවීසී
3 ශ්‍රීලංසංබ

## බිය වූ මා බොළඳ සිත

හදෙහි ගිනි ඇවිලෙන
මේ අඳුරු යුගාමයේ
කෙසේ නම් කුමක්
කොහේ සිදුවේද යන වග
සිතාගත නොහැකි
මා බොළඳ වූ සිත තුළ

රිපුන් අඳුරු කළ
නිමල ලක් මෑණිය
අඳුරු කළ පාස්කු දා සිට
බිය නැමති බිජුව
දිනෙන් දින දළු දමයි
මා බොළඳ වූ සිත තුළ

නැවත සාමය උදා වේ
මේ ලක් දෙරණ තුළ
දෙවිවරුන් වැඩ ඇත
සාමයේ හස්තය රැගෙන
මහපොළවට
හඬන නෙතු සනහන්නට
යළි මුවග සිනා රැළි නගන්නට
නමුදු
කවදා හැක් වේද යන වග
නොහැගේ
මා බොළඳ වූ සිත තුළට

සෙ/280191 මා/සෑ තෙන්නකෝන් ඩබ්ටීඑම්එස්එස්
7 ශ්‍රීලංසංබ

## සැඟවුණු අරුතක්

නින්ද නොනින්ද මත සරමින්
සිටි මොහොතක සයනය කරමින්
දුටු දසුනක් යටි සිත පෙළමින්
කුමක්ද? අරුතක් සැඟව ඇති

පුන්සඳ රෑ අහසේ දිලුණා
පිණිබිඳු සඳරැස් මත වැටුණා
සඳ පිණි අතරින් මම දුටුවා
තුන්පත් රෑනක් දිය කෙළිනා

නින්ද නොනින්ද මත සරමින්....

පසුදින අළුයම පිබිදුණිමි
රෑ දුටු මතකය සිහිවුණෙමි
සොඳුරිය සුබ පුවතක් පැවසී
මල් කැකුළක් ඇත පිළිසිඳවී

නින්ද නොනින්ද මත සරමින්....

සෙ/2සී00499 බනි 11 රණසිංහ ආර්ඩබ්පීපී
2 (සේවී) ශ්‍රීලංසංබ

## මරණයයි - උපතයි

නෙත්යුග කියන රහසට අවනතව ලෙහි
හැගුමන් තුළින් වී විලිබර ගතිය බිහි
වතමල පිපුණි ගැවී රත් පැහැය එහි
අමතක විය මටද මා සිටිනවද කොහි

කෙනෙකුගෙ සිරුර අලුවෙයි දැල්වෙන ගින්නේ
ගිනිදලු මැදින් නෙත් මොනවද පවසන්නේ
මෙතනට නමුත් අප සැම හෙට පැමිණෙන්නේ
අනියත බව නියත ලෙස නැහැ වැටහෙන්නේ

**කෝප්‍රල් ජයවර්ධන ජේජීඑන්ඩී**
**6 ශ්‍රීලංසංබ - ආසේමු (බටහිර)**

## සෙබළ සිතුවිලි

මමත් උසාවියක් මහරැට මම විසින්ම නඩු අහන
මොළය පැමිණිලිකාර පාර්ශවයයි
හිත විත්තිකාර පාර්ශවයයි
දෙපාර්ශවයෙන්ම පෙනී සිටින එකම නීතිඥවරියද
මම වෙමි......................
ඉහමොළ සිසාරා එන කර්ණිකා වලටත් ඊංගාගෙන
එන සිතිවිලිවලටත් දැණුනු පුහුණුව පන්නරයකි
අණට යටත්ව සීරුවෙන් සිටින් දකුණින් පෙළ සදන්
පෙරට බලන් දකුණින් ගණින්...................
මුලින් ඉහමොළේට ගිය වදන් සදයි විනයක්
නීතිය සාධාරණව ගෙනෙන්නට එක් තැනට සිතූ
හෙළුවේ දඟඩිය කඳුළ පමණයි..................
මමත් නිළ ඇඳුම අභිමානවත් ලෙස අඳින
සෙබලියකි රට නමින්

**සංසෙ (කා) මාලිකා**
**2 (සෙවි) ශ්‍රීලංසංබ**

## වත්මන් බහුවාර්ගික සමාජයට පණිවිඩයක

'ටක් ........ ටක් ........ ටක් ........
කවුද ........
මේ මම ........ මම ........ අඳුරගන්න බැරිද ........
කොහොම අඳුරගන්නද ඔය ඔලුවේ ඉදන් පොරවගෙන ........
මොර සුරන මහ වැස්සේ
නපුරු කන්ද දිය වෙන කොට ........
එදා ඉතින් දුවන් ආවෙ
මරණ බයෙන් පණ ගැහි ගැහි ........
නිදා හිටපු ඇදුම් පිටින් ........
කොහොම මතක ඉවත ලම්ද
අපට සරණ වුන දෙවිවරු ........
හොරෙන් ආවේ බලලා යන්න
කරදරයක් නැනේ නේද ........
හතර අතේ මුර සෙබලුන් ........
එකම අහස පොළොව අතර
හුස්ම වැටෙන ටික දොහකට
අපි මොකටද වෛර බැදන් ........
එන්න අනේ වාඩි වෙන්න
තේ ඕංගක් බීලම ඉමු ........

**සෙ/282048 කෝප්‍රල් අධිකාරි එඑම්ජී**
**7 ශ්‍රීලංසංබ**

## කාගෙත් හිත හොඳ

ලාභය ගැනම සිතන
වාසියට පමණක් සිතන
අහිංසක පෙනුමක් පෙන්වන
කාගෙත් හිත හොඳ
මිනිසෙකු දුටුවෙමි මා

අහිංසක පෙනුමක් තිබුනත් ඔහුට
විසිතුරු සර්පයෙක් සේ
දෂ්ඨ කරයි විටෙක

කාගෙත් හිත හොඳ
දවසක එයි දුක්ගොඩ
හඳුනාගන්න එය අප අතර සිටින
වෙස් මවාගත් මිනිසුන් කොටස

**ලා/කෝ තෙන්නකෝන් ටීඑම්ඩබ්**
**11 ශ්‍රීලංසංබ**

## අවංක ආදරය

රූපෙට ආදරේ
කලොත්
තවත් ඊට වඩා
ලස්සන රූපයකට
සිත යන්න
පුලුවන්
එහෙත් අවංක
සිතින් අවංක
සිතකට ආදරේ
කලොත් ඒ සිතට
ඇරෙන්න වෙන
හිතකට ආදරේ
කරන්න බෑ............

**සංසෙ සදකැල් ආර්එච්ආර්අයි**
**6 ශ්‍රීලංසංබ**

## සංසාරේ

මා මල පසු දිනයක මතු
සොහොන් කොතක් බඳිනු එපා
කුමට මතක හුදු සැමරුම්
තව එක වාරයක් පමණි

අසාර මහ සංසාරේ
කල්ප කෝටියක් කල් සිට
මැරි මැරී උපදින දිවියක
නවාතැන් පොලක් පමණි

මෙතුවක් කල් ලැබූ ජීවිත
සහස් ගණන් සොහොන් කොත්ද
නිමක් නොමැති නෑ මිතුරන්
සියල්ල අනියත වී ඇත

යලි නොපතන නමුදු දිවිය
උපත විපත කෙලවර නැත
සොහොන් කොතේ ලියන ගීය
දැන්ම ඇවිත් මට කියන්න

**ලා/කෝ වර්ණකුලසූරිය ඩබ්කේඑල්ජේ**
**6 ශ්‍රීලංසංබ - විබ බසේමු**

## මං පෙරුම් පිරුවා

දුටුවත් නුදුටු ලෙස
නුදුටු නෙත් දුටුවත්
දකින්නට පෙරුම් පිරුවා

කීවත් නොකිව් ලෙස
නොකී බස් තෙපලන රිසි
අනේ මං පෙරුම් පිරුවා

පිපුනත් නොපිපී ලෙස
පිපුනු මුව පරවු මුත්
මං මග බලා සිටියා

දැනුනත් නොදැනුනත්
දැමුනු සිත මත මගේ
මහ මෙරක් නුඹ තැබුවා

**සංසෙ සෙනවිරත්න එස්එම්එස්වී**
**6 ශ්‍රීලංසංබ - 57 සේමු**

## දෛවය

ඔබ දුකින් ඉන්නෙ
කාවහරි සතුටින් තියන්න ගිහින් නම්
ඔබ රැවටුනේ
කාටහරි අවංක වෙලානම්
ඔබ පැරදුනේ
කාටහරි දිනුම දීලනම්
ඔබ තනිවුනේ
කාගෙහරි තනියට ඉදලනම්
ඇත්තටම
දුක්විය යුත්තේ ඔවුන් මිස
ඔබ නොවෙයි
ඒ ඔවුන්ගේ නොලැබීමයි
ඔබ නිවැරදි නම්
දිනෙක දෛවය විසින්
ඔබට ඔබ වැනි මිනිස්සු මුනගස්වාවි

